# දිගු
# ගමනක
# අතර මගදී



# දිගු ගමනක අතර මඟදී



ආරියරත්න හේවාපතිරණ

දිගු ගමනක අතරමගදී

© ආරියරත්න හේවාපතිරණ

ISBN - 978 - 955 - 50918 - 0 - 0

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | - | 2008 අප්‍රේල් |
| මුද්‍රණය | - | සන් ග්‍රැෆික්ස් ප්‍රින්ටර්ස්<br>24/10,<br>රත්නසිරි ෆොන්සේකා මාවත,<br>කව්ඩාන පාර, දෙහිවල.<br>☏ 011-4951121, 0714 069444 |
| ප්‍රකාශක | - | එන්. ඩී. හේවාපතිරණ<br>එස්/1/10 ද සොයිසාපුර,<br>මොරටුව.<br>☏ 077 3732028 |

# පිළිගැන්වීම

සතුරන් ලෙසින් වේවා!

මිතුරන් ලෙසින් වේවා!

සත්‍යාවබෝධය පිණිස මා හට උපකාර වූ

සියළු දෙනා නමින් මෙය පිළිගන්වමි.

සතුටෙහි හේතු කාරකවූ

බුද්ධිය ලබාදෙමින්

සංසාර ගමනෙහිදී

ජාතියෙන්, ජාතියෙහි

මා හට උපකාර කළා වූ

ඥාණ සම්පත්තියෙන් සපිරි,

සතුටෙහි උපත වූ භාගපවත් වූ

සියළු ගුරු උතුමන් හට

මාගේ භක්ති පූර්වක

නමස්කාරය වේවා!

## ප්‍රස්ථාවනාව

ජීවිත ගමනේ හරි අඩකටත් වැඩි දුරක් මේ වන විටත් ගමන් කර ඇති මවිසින් පසුගිය කාලයෙහිදී ඇසූ දුටු දෑ බොහෝය. ලැබූ අත්දැකීම් ප්‍රමාණය ඒවාට නොදෙවෙනිය. මෙවන් දෑ අතුරින් ඇතැම් දේවල් පිළිබඳව මගේ සිතට හැඟෙන අයුරින් සටහන් කර තැබීමේ පුරුද්දක් මා සතුව පැවතිණ. එම පුරුද්දට අනුව මවිසින් ලියන ලද සටහන් රාශියක් ඒක රාශි වී තිබුණි. ඒවායින් ඇතැම් දේවල් පුවත් පත්වලට යොමු කරන ලදුව, පුවත්පත් වල පළ වූ අවස්ථාවල් නැත්තේ ද නොවේ.

මගේ හිතවතුන් විසින් ද, එම සටහන් කියවා රස විඳීමෙන් පමණක්ම නොනැවති, එකී සටහන් ක්‍රමවත් අයුරින් සකස් කොට මුද්‍රණය කරවන්නේ නම්, ඒවා තවත් බොහෝ දෙනෙකු හට ප්‍රයෝජනවත් විය හැකි බවට මා දැනුවත් කිරීමට ද ඔවුහු පසුබට නොවිය.

එහෙත් එවැන්නක් උදෙසා මගේ සිත යොමු නොවූයේ, පොතක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන්නට යැමේදී ඇති වන දුෂ්කරතාවයන් හා එහි ඇති බැරෑරුම්කම මවිසින් තේරුම් ගෙන තිබූ

බැවිනි. කරණු එක්රැස්කර පොතක් ලිවීම තරම්, පොතක් මුද්‍රණය කරවීම පහසු නැත. අද හැම දෙයම මිළ අධිකය. කඩදාසි මිළ හා අනෙකුත් ආම්පන්නයන්ගේ මිළ අධික කම හේතුවෙන් මුද්‍රණ ගාස්තු ද ඉහළ ගොස් තිබීම අරුමයක් නොවේ. කවර දුෂ්කරතාවයන් මධ්‍යයේ හෝ පොතක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කළේ වුවද, ඒවා අලෙවිකර ගැනීම මේ හැමටම වඩා දුෂ්කර වී ඇත්තේ පොත් අළෙවි සැල් හැම ලේඛකයෙකු හටම නොමැති බැවින් හා අළෙවි සැල් හිමියන් හට පොත් අළෙවිය සඳහා අධික වට්ටම් මුදලක් ගෙවීමට සිදුවන බැවිනි.

කෙසේ හෝ වේවා, හිතවතුන්ගේ ඉල්ලීම් හා පෙළැඹවීම් ප්‍රතික්ෂේප කළ නොහැකි තත්ත්වයකට මා පත්වූ හෙයින් මවිසින් ලියා තිබූ ප්‍රකාශයන් ඒක රාශිකොට පොතක් වශයෙන් මුද්‍රණය කරවීමට මම තීරණය කළෙමි. ඒ අනුව ඉදිරි කටයුතු ඇරඹුවෙමි.

මෙම කටයුත්තෙහිදී, මා භාෂා විශාරදයෙක් නොවන බැවින්, රචනා ශෛලිය තුළ විවිධ අඩුපාඩුකම් න, ණ, ල, ළ දෝෂ වැනි දුර්වලතාවයන් තිබිය නොහැකිවා නොවෙයි. මම ලිව්වේ මට හිතෙන දේය. පාඨකයා හට ඒවා කියවා තේරුම් ගත හැකි වන්නේ නම්, මම එයින් සෑහීමට පත්වන්නෙමි.

මෙම සටහන් ලිවීමෙහි දී - කවර අයුරකින් හෝ කිසිවෙකු කෙරෙහි පෞද්ගලිකව ඇති කරගත් ද්වේශයක්, අමනාපයක්, හෝ කිසිවෙකු හට පහර ගැසීමේ අරමුණක් මා තුල නොවූ බව, මෙහිලා අවධාරණයෙන්ම කිව යුතුව ඇත.

1960 දශකයේ අග භාගයේදී පුවත් පතක පළකිරීම සඳහා මවිසින් යොමුකරන ලද කෙටිකතාවක්, අපේක්ෂිත අයුරින් අදාල පුවත් පතෙහි පල නොවුන නමුදු, ඉන් මාස කිහිපයකට පසුව - එම කෙටිකථා වේ නමත් කථානායක යාගේ නම හා තවත් සුළු වෙනස්කම් කිහිපයක් සිදු කරමින් - වෙනත් අයෙකුගේ නමින්, එම පුවත් පතෙහිම පළවී තිබෙනු දකින විට, එහි නියම හිමිකරු වූ ලේඛකයාහට කුමක් සිතෙන්නට ඇත්දැ'යි ඔබට කිව හැකිද? කුමක් සිතුනේ වුවද කම් නැත.

දැන් එහි අවශ්‍යයතාවයක් නැත. "තවත් මිනිහෙක්" නම් වූ එම කෙටි කථාව - මෙම පොතට ඇතුලත් කිරීමට මම පියවර ගත්තෙමි.

ප්‍රසිද්ධ පාසලක් අසළ, බස් නැවතුම් පොලකදී, කුඩා දරුවෙකු හා පියෙකු අතර ඇති වූ රසවත් සංවාදයක් මා හට අසන්නට ලැබුණි. එම සංවාදය තුල ගැබ්වූ හරය වැදගත් දෙයක් ලෙස මට හැඟී ගිය හෙයින් "අභිමානයක තරම" නමින් එම සිදුවීම සංවාදානුරූපයෙන්ම මෙහි ඇතුලත් කර ඇත.

මේවාට අමතරව විෂයයන් ගණනාවක්ම පිළිබඳව සම්බන්ධකම් දැක්වෙන කරුණු සහිත ලිපි ඉදිරිපත් කිරීමට, මට හැකි විය. මෙම පොත කියවන ඔබට ඒවා සවිස්තරාත්මකව බලාගත හැකි බැවින් ඒ පිළිබඳව වැඩිදුර සඳහන් කිරීමක් අවශ්‍යය වේයැ'යි මම නොසිතමි.

මෙම පොතෙහි එක් ලිපියක් දෙකක් පමණක් කියවා,

පොත පිළිබඳව නිගමනයනට නොඑළැඹෙන ලෙසත්, පොත අවසන් වනතුරු කියවා බැලීමෙන් අනතුරුව පමණක් නිගමනයකට එළැඹෙන ලෙසත් ඉල්ලීමක් කරනු කැමැත්තෙමි.

මෙම පොත කියවන විට ඔබ තුල කෝපයක් ඇතිවන්නේ නම්, කලබලයට පත් නොවිය යුතුය. ඔබ කෝපයට පත් වූයේ ඔබ තුල පවතින කවර හෝ දුර්ගුණයක්, දුර්වලකමක් එහි දක්වා ඇති නිසා විය හැකිය. එසේනම් ඔබ විසින් සිදුකළ යුත්තේ, ඔබ තුල පවතින දුර්ගුණයෙන් මිදීම හෝ දුර්වලකමින් බැහැර වීම මිස, මා කෙරෙහි ක්‍රෝධ සිත් ඇති කරගනිමින් තව තවත් ඔබ පීඩාවට පත්වීමක් නොවේ. සත්‍යයට මුහුණ දීමේ හැකියාවක් ඇත්තේ නම්, ක්‍රෝධය ඇති වන්නේ නැති බව මම අත්දැකීමෙන්ම දනිමි.

මෙම පොත නිමාවට පත් කිරීමේ කාර්‍යයෙහිදී මගේ බිරිඳ **"ඉන්ද්‍රානි"** සිරිත් පරිදි මගේ සහයට මා ළඟින්ම සිටියාය. අප දෙදෙනාගේ ජීවන බරින් වැඩි කොටසක් තම උරමතට ගනිමින් නිශාන්ති ධම්මිකා හේවාපතිරණ දියණිය විසින් දක්වනු ලබන අනුග්‍රහය ලඝුකොට තැකිය හැක්කේ ද නොවෙයි. ජීවිතය බරක් කරගන්නට නොදී, ජීවිතය පිළිබඳව යථාර්ථය අවබෝධ කරගනිමින් - දුක් නොවී ජීවත් වීම සඳහා මඟ දැකීමට මා පෙළැඹවූ ප්‍රසාද් සංජීව හේවාපතිරණ පුතු විසින් ද ලබා දෙනුයේ අමිල සහයකි. දිවයිනේ සිටියේ හෝ වේවා! දිවයිනෙන් බැහැර වූයේ වේවා! කවර තැනක සිටියේ වුවද යෙලිණි කාන්ති අමරසූරිය මෙනවිය මෙම කටයුත්තේදී නිරන්තරයෙන්ම මා දිරිමත් කිරීමේ නිරත වූවාය. මේ සැමගේ සහය නොවන්නට, අනුග්‍රහය නොවන්නට ජීවත්වීම

උදෙසා ජීවිත සටනේ යෙදෙනු මිස, මෙවන් කටයුත්තක නිරතවීමට මා හට අවස්ථාවක් නොලැබෙනු ඇත. එහෙයින් මෙම කාර්‍යයේ දී මගේ සියළු ජවය වූයේ ඔවුන්ය. නියොන් කොමියුනිකේෂන් ආයතනය හිමි දිනේෂ් හා තුෂාරි යුවලද දැක්වූයේ මහඟු සහයකි.

මම පොතක් මුද්‍රණය කරවීමට සූදානම් වන බව දැනගත් මගේ මිතුරන් බොහෝ දෙනෙකු ඒ සඳහා මූල්‍ය ආධාරයන් ලබාදීමට ඉදිරිපත් විය. එය මා හට ලැබුණ විශාල දිරි ගැන්වීමකි. ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් මෙහිලා දැක්වීමට නොහැකිවීම පිළිබඳව මම කණගාටු වෙමි. ඔවුන් ඒ පිළිබඳව මා සමඟ අමනාප නොවනු ඇතැයි ද, මම විශ්වාස කරමි. එමෙන්ම කෘතගුණ දත් ඒ හැමට මම කෘතඥ වන්නෙමි.

පොතෙහි පිට කවරය සැකැසීම මා තුල ඇති වූ තවත් ගැටළුවකි. එහෙත් එය තවදුරටත් මා හට ගැටළුවක් නොවූයේ මා වෙතින්, පාරම්පරික කාල විධාන ශාස්ත්‍රීය - සම්මතයන් හදාරනු ලබන ශිෂ්‍යාවක වන රුෂාන්ති ආටිගල මහත්මිය ඒ සඳහා ඉදිරිපත්වීම නිසාය. ඇයගේ සැමියා වන ඩබ්ලිව්. එම්. පියරත්න මහතා විසින් මා සිතා සිටි ආකාරයටම සරිලන ලෙසින් අලංකාරවත් අයුරින් පොතෙහි පිටකවරය සකස්කර දීමට කාරුණික විය.

පොත පිළිබඳව, හැඳින්වීම්, පෙරවදන් වැනි දෑ වියතුන් ලවා ලියවා දීමට මගේ හිතවතුන් ඉදිරිපත් විය. එම කටයුතු උදෙසා තවත් කාලයක් ගතවන බැවින් ද පොත මුද්‍රණය

කරවිමේ වගකීමෙන් හැකි ඉක්මනින් නිදහස් වීම මගේ අරමුණ වූ බැවින් ද - ඒ සඳහා නම්‍යශීලී වීමට මා හට නොහැකි විය. කෙසේ වෙතත් ඒ වෙනුවෙන් උත්සාහයේ යෙදුන මගේ හිතවතුන්ගේ කැපවීම මම අගය කරන්නෙමි.

පොතෙහි පිට කවරයෙහි පිටුපස මගේ ඡායාරූපයක්ද සමග මා පිළිබඳව හැඳින්වීමක් පළ කිරීමට ද මගේ හිතවතුන් හට ඕනෑ විය. එහෙත් මා පිළිබඳව ලියන්නට යමක් තිබේයැ'යි මම නොසිතන බැවින්, මම එය සඳහා ද එකඟ නොවීමි. මගේ හිතවතුන් ඒ පිළිබඳ මා සමග අමනාප නොවෙනු ඇත.

වෙළඳපොළ මිල ගනන් කෙසේ වුවත් ලාභාපේක්ෂාවෙන් තොරව, මෙම පොත මුද්‍රණය කර දීමට රංගික ෆොන්සේකා මහතාගේ ඉදිරිපත්වීම පිළිබඳව මම අතිශයින්ම ප්‍රසන්නතාවයට පත්ව සිටින්නෙමි. මුදල හමුවේ සියල්ල ලඝුකොට සළකන සමාජයක - ජීවත්වන රංගික ෆොන්සේකා තරුණයා මෙහිදී සැබැවින්ම මහත්මා ගති ලක්ෂණ ප්‍රදර්ශනය කර ඇත්තේය. මෙම පොත මුද්‍රණය කොට නිමාවට පත් කිරීමේදී - නන් අයුරින් ඒ සඳහා සහය වූ නිව් සන් ග්‍රැෆික් ආයතනයේ සියළු දෙනාගේ කැපවීම හා සහය කෘතවේදීව අගය කරන්නෙමි.

මෙහි සඳහන් කර ඇති මෙන්ම, සඳහන් කිරීමට නොහැකි වූ බොහෝ පිරිසකගේ කැපවීම, පරිත්‍යාගශීලීත්වය, ඕනෑකම හමුවේ "දිගු ගමනක අතර මඟදී" නම් වූ මෙම කෘතිය එළිදක්වන්නට මා හට හැකි විය. ඒ සඳහා සහය

දැක්වූ සැමගේ සේවය - පිනායන සිතින් යුතුව කෘතඥතා පූර්වකව අගය කරන්නෙමි. මෙම කාර්යයට සහය වූ සැමගේ සිත් තුල, පහළවුනාවූ යහපත් අරමුණු සියල්ලම කිසියම් දිනෙක ජිවිතය පිළිබඳ තත්ත්වාවබෝධය ලබා ගැනීම පිණිස ඔවුන්හට උපකාර වන ශක්තිමත්, කුශල් සිත්ම වනු නොඅනුමානය.

මා මෙපමණ කලක් ගමන් කොට ඇත්තේ කොහේද?... මවිසින් සිතින් මවා ගත් ලෝකයකය. මා මිය ගිය සැනෙකින් මගේ ලෝකය නිමාවෙනු ඇත. එහෙත් ගමන නිමා වේදැයි කිව නොහැක. මා තුල පවතින්නා වූ, සසර පිළිබඳව වූ තත්ත්වාවබෝධය අනුව එය නිගමනය වනු ඇත.


ආරියරත්න හේවාපතිරණ

එස්/1/10, ද. සොයිසාපුර,
මොරටුව.
2008.02.23
දුරකථන : 077 6337697

# පටුන


| | | |
|---|---|---|
| 1. | විශ්වාසය හා පිළිගැනීම | 17 |
| 2. | ඔබ සිටිය යුත්තේ | 18 |
| 3. | භවය හා නිවන | 19 |
| 4. | වත්ත බද්දට දී - ඇස්සට දත නියැවීම | 29 |
| 5. | අනේ මෙහෙමත් කථා | 33 |
| 6. | විද්‍යාවේ දියුණුව | 37 |
| 7. | කෘතගුණ වීම - නොවීම | 41 |
| 8. | අකෘතඥයා | 44 |
| 9. | කෙළෙහි ගුණ නොදන්න | 46 |
| 10. | අභිමානයක තරම | 48 |
| 11. | තවත් මිනිහෙක් | 51 |
| 12. | අවබෝධය | 63 |
| 13. | සිංහල අළුත් අවුරුද්ද | 68 |
| 14. | ජ්‍යොතිෂ්‍යය යනු | 76 |
| 15. | සෙනසුරු මාරුව - විකුණා කෑම | 88 |
| 16. | මෙහෙමත් පොරොන්දම් බැලීමක් | 96 |
| 17. | මරුවා කොහේද | 102 |
| 18. | අනුමෝදනාව | 106 |
| 19. | ධර්මානුශාසනාව හා බණ | 108 |
| 20. | ධනවතා හා දුප්පතා | 112 |
| 21. | ශ්‍රද්ධාව හා පින | 117 |
| 22. | පිස්සෙක් සහ පිස්සෙක් | 121 |
| 23. | බෞද්ධයා යනු | 125 |
| 24. | උපේක්ෂාව හා අපේක්ෂාව | 127 |
| 25. | දිගු ගමනක අතර මඟදී | 128 |
| 26. | මඟියා හා ගමන· | 149 |

27. සතුට 151
28. සතුට ඔබ කොහේද? 153
29. සතුට හමුවිය 155
30. ප්‍රඥාව හා විඳීම 157
31. චිත්ත විකාර 159
32. සිතක් හා අඹ ගසක් 161
33. මට එපා!... එවන් සුව 165
34. මාන්නය 167
35. ජීවිතය 169
36. සසර ඉම 171
37. අපි අසරණ වෙලා නැතේ 172
38. මම කවරෙක්ද? 180
39. මම 184
40. ප්‍රසිද්ධිය හා අනතුර 185
41. බලාපොරොත්තුවක් කළ හරිය 188
42. සතුට සෙවිය යුතුද? 190
43. අරමුණම - දුක විය 193
44. අඳුර හා ආලෝකය 194
45. හිතවත් - අහිතවත් 199
46. සම්මුතිය හා රංගනය 200
47. වචනය හා අරුත 203
48. බුද්ධිය හා ප්‍රඥාව 207
49. ඊයේ, අද සහ හෙට 209
50. නිමිත්ත, විඥාණය හා සිහිය 213
51. නිමිත්ත සිත සහ මතකය 216
52. අරමුණු, සිත සහ ජලය 218
53. සිත හා සමාධිය 221
54. ජීවිතය කවි 222

# 1

## විශ්වාසය හා පිළිගැනීම

විශ්වාසය හා පිළිගැනීම ඇත්තාහට ගලින් කළේ හෝ මැටියෙන් කළේ හෝ වුවද, එය බුදුරුවක් හෝ දෙව්රුවක් වනු ඇත.

විශ්වාසය හා පිළිගැනීම නැත්තා හමුවෙහි ඒවා ගල් හෝ මැටි පිඬු පමණි.

තෝරාගැනීම එතැනය.

විශ්වාසය මිනිසාව වහළෙකු කරයි.

## 2

# ඔබ සිටිය යුත්තේ....

ඔබ සිටිය යුත්තේ, ඔබහට ආදරය කරන්න වුන් සමඟය.

ඔබ ආදරය කරන්නේ වුවද, ඔවුන් ඔබට ආදරය නොකරන්නෙහි නම්, ඔබ නොපමාව එතැනින් ඉවත් විය යුතුය.

ඔබ එසේ ඉවත් නොවුයේ නම් ඔබහට ශේෂ වනුයේ දුක, පරාජය හා සංතාපය පමණි.

# 3

# භවය හා නිවන

නිවනෙහි භවය නැත. භවයෙහි නිවන නැත. භව නිරෝධයම නිවන වන්නේය. තථාගතයන් වහන්සේ සත්ත්වයාගේ භව නිරෝධයට මඟ කියා දුන් සේක. සත්ත්වයා විසින් කළ යුත්තේ ඒ මඟ ඔස්සේ යමින් භව නිරෝධයට පත්වීම පමණකි.

මිනිසුන් බොහෝ දෙනෙකු "නිවන්" දැකීමට කැමතිය. එහෙත් භව තෘෂ්ණාව අත් හැරීමටද නොකැමැතිය. එහෙයින් - ධර්මාවබෝධය ලද බුද්ධ පුත්‍රයන් වහන්සේලා විසින් භව නිරෝධය පිළිබඳව විග්‍රහත්මකව කරනු ලබන ධර්ම දේශණාවන් ඇසීමට ඔවුන් රැඳෙන්නේ නැත. එවන් තැනින් බැහැර වෙති. එබැවින් අද දවසේ හරවත් ධර්ම දේශණාවක් පවත්වන තැනක බොහෝවිට දක්නට හැකි වනුයේ සුළු පිරිසක් පමණකි.

දුක් විඳින්නට මිනිසා කැමති නැත. දුකෙන් මිදෙන්නට ඔවුනට ඕනෑකම ඇත. නිර්වාණය පරම සුවය බව ඔවුන් අනුමාන වශයෙන් දනිති. එය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ වුවමනාවක්

ඔවුනට නැතිවා නොවේ. එහෙත් මෝහයෙන් වෙලී සිටින මිනිසා තුළ සාරධර්මයන් යටපත් කෙරෙමින් ත්‍රිවිධ තණ්හාවම පෙරට එන්නේය.

සැප සම්පත් සොයන මිනිසා - අද දවසේද සැප විඳිමට වෙහෙසෙමින් කාම තෘෂ්ණාව වඩන්නේය. හෙට දවසේ ද - අනාගත ජාතියේද දෙව් බ්‍රහ්ම සැප පතමින් භව තෘෂ්ණාව වඩන්නෝය. විඳිමින් සිටින වේදනාවන් ගෙන් ඈත් වීමට සිතමින් නොයෙක් ආකාරයේ ක්‍රියාවන්හි නිරත වන්නෝය. දුක ඉන් නිමාවෙනු ඇතැයි සිතමින් විභව තණ්හාව වඩන්නෝය.

බුද්ධ පුත්‍රයන් වුවද - ධර්මාවබෝධය නොලැබූ ඇතැමුන් විසින් කරනු ලබන දේශණාවලට බොහෝ දෙනෙකුගේ කැමැත්ත ඇති බවක් පෙනෙන්නට තිබෙයි. මෙවන් ඇතැම් දේශකයින් විසින් යම්යම් කුසල ක්‍රියාවන්ගේ ආනිශංශයන් පිළිබඳව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙති. අනාගත භවයන්හි සුඛිත මුදිත විය හැකි ආකාරයන් පිළිබඳව දෙසති. වත්මන් ජාතියෙහි විඳින දුකින් මිදී අනාගත භවය හෝ සැපවත් කර ගැනීමේ අරමුණින් යුතුව මිනිසුන් පෙළ ගැසෙති. භව තණ්හාවම අරමුණු කර ගනිමින් පිංකම් ආදියෙහි යෙදෙති. විවිධාකාරයේ මිථ්‍යාවන් වැළඳ ගන්නා මිනිසුන්, ඔවුන්ව මෙවන් බන්ධනයනට හසුකරනු ලබන දේශකයින්ම උත්තමයින් ලෙසින් සළකති. ඔවුනගේ ගැලවුම්කරුවන් ලෙසින් දකිති. එහෙයින්ම මිනිසුන් විසින් එවන් දේශකයින්හට මහත් භක්තියාදරයෙන් යුක්තව ගෞරවාදරයෙන් සංග්‍රහ කෙරෙති.

මෙවන් සංග්‍රහයන් ගෙන් මුළාවට පත්වන දේශකයින්ද, වඩ වඩාත් සංග්‍රහයන් භුක්ති විඳිති. භෞතික සැප සම්පත්

ලබති. ඔවුන් තුළම මතුවන කාම තණ්හාවම වඩති. භව තණ්හාවට අනුබල දෙති. ඇතැමුන් විසින් ශ්‍රමණකම ජීවත්වීම සඳහා ඇති පහසුම වෘත්තිය බවට පත්කර ගනිති. බුද්ධාගම ව්‍යාපාරයක් බවට පත්කර ගන්නා ඔවුන්, තමන් විසින්ම අපාගත වීමට අකුසල් සිදුකර ගනිමින් අන් අයවද සසර දුකට පත් කරවති.

මුළාවට පත් වූ මිනිසුන් අනාගත ජීවිතය සාර්ථක වීමට ප්‍රාර්ථනාවන් කරති. ධනවත් වීමේ අරමුණින්; සැපවත් වීමේ අරමුණින් යුතුව දාන මාන පිංකම් කරති. දෙවිවරුන් වෙන්නට පෙරුම් පුරති. බ්‍රහ්ම ලෝකවල සුව විඳින්නට පතති. මුළාවට පත් වී සිටින බැවින් ඔවුන් විසින් වඩනා භව තණ්හාව පිළිබඳව ඔවුනට නොවැටහෙන්නේමය.

පිං කැමති ඇතැමුන් බෝධි පූජා පවත්වති. ඒ ගෞතම බුදුන් වහන්සේ බෝරුකක් මුලදී බුද්ධත්වයට පත්වූ බව සඳහන් වන බැවිනි. මින් සමහරෙකු හට ගෞතම බුදුන් වහන්සේට පමණක් වැඳුම් පිදුම් කෙරුවාට මදිය. ඔවුනට සූවිසි බුදුවරුන් වහන්සේලාම වුවමනාය. එහෙයින් බෝධිය වටා සූවිසි බුදුවරුන් වහන්සේලාගේ නමින් පිළිම තබති. ඒවාට වන්දනා මාන කරති. ගෞතම බුදුන් වහන්සේ හැරුණු කොට සෙසු බුදුවරයන් වහන්සේලා බුද්ධත්වය ලැබූයේ බෝ රුකක් මුලදීම නොවන බව ඔවුනට අමතක වී ඇතිවා සේය.

භක්තිය කොහොරමිද යත්, එක මලක් හෝ මල් කිහිපයක් පූජා කිරීමෙන් ඔවුහු සෑහීමට පත් නොවෙති. ලක්ෂ ගනනින් මල් පූජා කිරීමට ඔවුනට අවැසිය. එක් පහනක් හෝ කිහිපයක් දැල්වීමෙන් සෑහීමට පත්වීමට නොහැකි නිසාදෝ ඔවුන් අසූහාර

දහසේ පහන් පිංකම් සංවිධානය කරති. උත්සවාකාරයෙන් ඒවා පවත්වති.

බුදුන් වහන්සේ පෙන්වා වදාළ දහම අනුව නම් මෙවන් කවර ස්ථානයක හෝ භවයම වැඩෙන්නේය. මේ ජාතියෙහි ද දුකට පත්වී සිටින මිනිසා දුකෙහි ගැලෙන්නට නොකැමැතිය. භවය ප්‍රාර්ථනා කරමින්ම දුකද පිළිකෙව් කරන්නේය. අනාගතයේ දී සිදුවිය හැකි දුක, පමණක්ම නොව, වර්තමානයේ විඳිමින් සිටින දුකින් මිදීමටද ඔවුනට ඕනෑ කරයි.

දුකින් මිදීමේ අපේක්ෂාවෙන් යුතු වූ මිනිසුන් දෙවියන් වඳිති. දෙවියන්ගේ පිළිසරණ පතති. පුද පූජා පවත්වති. භාරහාර වෙති. දුෂ්කර වන්දනා ගමනේ යෙදෙති. ගස්, ගල් වලට වඳිති. වෘක්ෂයනට පට සිවුරු අන්දවති. ඒවා කිරි දියෙන් නහවති. ඍද්ධි ප්‍රතිහාර්යයන් පාන්නන් ලෙසින් සම්මත කරගත්තවුන්ගේ සරණ පතා යති. උපවාස ශීලයන් පවත්වති. මහත් ලෙසින් මුළාවෙන් මුළාවටත්, විකාරයෙන් විකාරයටත් පත්වෙති.

එක්දහස් නවසිය හැට දශකයෙහි පළවූ ප්‍රසිද්ධ මාසික සඟරාවක - සංස්කාරකවරිය විසින් මෙවන් ආකාරයේ කවියක් පළකර තිබුණි.

නිසි රිසි අහර නැති
මෙහි ළදරුවෝ මියයති
හිමි සඳුනි සැදැහැති
දනෝ බෝගස් කිරෙන් නහවති

භක්තියෙන් අන්ද වූ මිනිසාගේ, මානසික තත්ත්වය

මොනතරම් මුළාවකට පත් වී තිබේද,යි යන්න අවබෝධ කර ගැනීමට එහි දැක්වෙන ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවන්නේද,'යි ඇසිය යුතු නොවන්නේමය.

බුදුන් වහන්සේ විසින් අනුදැන වදාරා ඇත්තේ උන්වහන්සේ විසින් තත්ත්වාවබෝධයෙන් යුතුව දේශණා කළ ආර්‍ය්‍ය මාර්ගය අනුගමනය කරමින් සසර දුකින් මිදීම පිණිස මිනිසුන් දැනුවත් කිරීමටය. එමඟින් මිනිසුන් දුකින් මිදීමේ මඟට යොමු කිරීමටය. බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළ ඇත්තන් අතර සිටි ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලබා සිටි අය ක්ෂණයෙන් ධර්මාවබෝධය ලබා රහත් ඵලයට පත් වූ බවත්, ද්විහේතුකයින් මාර්ග ඵලයනට එළැඹ ඇති බවත්, ඒක හේතුකයින් ආර්‍ය්‍ය මාර්ගයට පිවිසි බවත් - අහේතුකයින් එම ආර්‍ය්‍ය මාර්ගය දෙසට යොමු නොවී ඇති බවත් ධර්ම ග්‍රන්ථයන් පරිශීලනය කිරීමේදී අපට අවබෝධ කර ගත හැකිය. එසේ නොමැතිව සියළු දෙනාහටම ඒකාකාරයෙන් නිවන් අවබෝධ කරවීමේ හැකියාවක් සම්‍යක් සම්බුදුන් වහන්සේ හටද තිබී නැති බවත් පැහැදිළිය.

තුම්හේහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති - ඣායිනො මාර බන්ධනා

යනුවෙන් බුදුන් වහන්සේ විසින්ම වදාරා ඇත්තේ ද එබැවිනි. - "තථාගතයන් වහන්සේ මඟ පෙන්වා දෙන සේක. ඔබ, ඔබ විසින්ම එම මඟෙහි ගමන් කළ යුතුය. පමාවකින් තොරව එම මඟට පිවිසියෙක් වෙයි නම්, හෙතෙම මාරයාගේ බන්ධනයෙන් මිදෙනු ඇත.

බුදුන් දවස සිටි පාලකයින්, ඔවුන්ගේ රාජ්‍යයන්

භාරගන්නා ලෙස බුදුන් වහන්සේ හට ඇරැයුම් කළ බවත්, එවැනි ඇරැයුම් උන්වහන්සේ විසින් ප්‍රතික්ෂේපකර ඇති බවත් - පැරණි දහම් පොත් පරිශීලනය කිරීමේදී අපට දැකගන්නට හැකිය.

තත්ත්වය එසේ තිබියදී - වර්තමානයේ ඇතැම් භික්ෂු කණ්ඩායම් "ධර්ම රාජ්‍යයක්" ගොඩනැඟීමට යැයි කියමින් බුදුන් වහන්සේ විසින් අනුදැන නොවදාළ - ආර්‍ය ධර්මය හා නොසැසඳෙන ක්‍රියාවන්හි නිරත වෙති. ඔව්හු ධර්මරාජ්‍යයක ඇති අවශ්‍යයතාවය පිළිබඳව දේශණා කරති. බුදු දහම පිළිබඳව නිසි අවබෝධයක් නොමැති, බෞද්ධයන් යැයි තමන් විසින්ම තමන්ව හඳුන්වා ගන්නා ඇතැම් පිරිස් අන්ධානුකරණයෙන් මෙන් - ධර්මරාජ්‍යවාදීන්ව අනුගමනය කරති. තවත් සමහරෙකු - අනාගතයේදී ඇතිවේ යැයි සිතන ධර්ම රාජ්‍යයක විවිධ තනතුරු දැරීමේ අපේක්ෂාවෙන් ධර්ම රාජ්‍යයක් බිහිකළ යුතු බවට මොර දෙති.

බුදුන් වහන්සේගේ අනුශාසනාව වනුයේ තමා තුළින් තමන් දකින ලෙසය. සත්‍ය අවබෝධවනුයේ එවිටය. එය සිදුකළ යුතු ආකාරය තමන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව පස්වග මහනුන් අමතමින් පැවැත්වූ ප්‍රථම ධර්ම දේශණය වන දම්සක් පැවතුම් සූත්‍රය තුලින් පැහැදිළි කොට දක්වා වදාරා ඇති සේක.

මහණෙනි! පැවිද්දන් විසින් නොසෙවිය යුතු අන්තයෝ දෙකකි. එනම් ලාමක වූ, ග්‍රාම්‍ය වූ පෘථග්ජනයින් විසින් පුරුදු කරන ලද අනාර්‍ය වූ, අනර්ථයක්ම ඇසුරු කරන්නාවූ වස්තු කාමයන් කෙරෙහි යම් මේ කාමසුඛල්ලිකානු යෝගයක් ඇත් ද, එසේම දුක් උපදවන්නාවූ අනාර්‍ය වූ අනර්ථයක් ම

ඇසුරු කරන්නාවූ යම් මේ අත්තකිලමථානු යෝගයක් ඇත්ද?, මහණෙනි! ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද මධ්‍යම ප්‍රතිපදා තොමෝ ප්‍රඥා චක්‍ෂුස පිරිසිදු කරන්නිය. නුවණැස ඇති කරන්නිය. කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුරාර්‍ය සත්‍ය ප්‍රතිවේධය පිණිස ඔවුන්ගේම අවබෝධය පිණිස නිවන් පිණිස පවත්නිය.

මහණෙනි! තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබෝධ කරන ලද ඒ කවර මධ්‍යම ප්‍රතිපදාවක් තොමෝ ප්‍රඥා ඇස පිරිසිදු කරන්නි. නුවණ ඇස ඇති කරන්නි, කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුරාර්‍ය සත්‍යය අවබෝධ පිණිස ඔවුන්ගේම අවබෝධ පිණිස නිවන් පිණිස පවත්නිද? මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය මැයි. ඒ කවරේද යත්, සම්‍යක් දෘෂ්ඨිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචන, සම්‍යක් ක්‍රියා, සම්‍යක් පැවතුම්, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘති (සිහිය), සම්‍යක් සමාධිය යන මොහුයි. මහණෙනි! තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද මේ ඒ මධ්‍යම ප්‍රතිපදා තොමෝ ප්‍රඥා ඇස පිරිසිදු කරන්නිය, නුවණැස ඇති කරන්නිය, කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුස්සත්‍ය ප්‍රතිවේධනය පිණිස සම්බෝධිය පිණිස, නිවන් පිණිස පවත්නිය.

මහණෙනි! මේ වනාහි දුක්ඛ ආර්‍ය සත්‍ය වේ. ඉපදීම දුකය, ජරාවෙද දුකය. රෝගී වීම දුකය. මරණය ද දුකය. අප්‍රියයන් හා එක්වීම දුකය. ප්‍රියයන් ගෙන් වෙන්වීම දුකය. කැමති යමක් නොලැබේද, ඒ ද දුකය, සැකෙවින් පඤ්ච උපාදාන ස්කන්ධයෝ දුක් වන්නාහුය.

මහණෙනි! මේ වනාහි දුක්ඛ සමුදය ආර්‍ය සත්‍ය නම්

වේ. යම් මේ .... පුනරුත්පත්තිය ඇති කෙරේද, නන්දිරාග සහගත වන්නිද? ඒ ඒ භවයෙහි විශේෂයෙන් සතුට ඇතිකරන්නිද, ඕ තෘෂ්ණාව කවරීද යත්, කාම තණ්හාවය, භව තණ්හාවය, හෙවත් ශාස්වත දෘෂ්ඨිය හා යෙදෙන තණ්හාවය, විභව තණ්හාව හෙවත් උච්ඡේද දෘෂ්ඨිය හා යෙදෙන තණ්හාවය යන මොහුයි.

මහණෙනි! ඒ තෘෂ්ණාවයෝම යම් සම්පූර්ණ නොඇලීමක්, නැතිකිරීමක් වේද, අත්හැරීමක් වේද, දුරලීමක් වේද, නොඇලීමක් වේද, මෙය වනාහි දුක්ඛ නිරෝධ ආයඝී සත්‍යයයි.

මහණෙනි! මෙය වනාහි දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදායඝී සත්‍ය වේ. එනම් මේ ආයඝී අෂ්ඨාංගික මාර්ගයමය. ඒ කවරේද යත්, සම්‍යක් දෘෂ්ඨිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජිවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සති, සම්‍යක් සමාධි යන මෙය වෙයි. මෙය බුද්ධ දේශණාවයි.

බෞද්ධයන් විසින් සිදු කළ යුත්තේ මෙම ආයඝී මාර්ගයෙහි ගමන් කිරීමය. උපදේශයන් අනුගමනය කිරීමය. ප්‍රඥාව වැඩීමය. පිළිවෙත් පිරීමය. ඉන් බැහැරව ප්‍රාර්ථනාවෙන්ම පමණක් නිවන පසක් කළ නොහැකිය.

උපදින මිනිසා - මිය යන්නේය. එම කරුණු දෙක එකිනෙකා වෙන් කළ නොහැකි අයුරින්ම බැඳී වෙලී පවතින්නකි. - එහෙත් ඇතැමුන් මරණය තමන්ට හිමි දෙයක් බව නොසිතති. ජිවිතයම හිමි බව සිතති. ඒ අනුව කටයුතු කරති. මරණයට බිය වෙති. මරණයෙන් ගැලවීමට උපමාරු යොදති. එහෙත් භවය ඇතිතාක් මරණයෙන් මිදිය නොහැකි බව බුද්ධ දේශණාවන් අනුව පැහැදිළිය.

ඉපදීම දුකය, ජරාවට යෑම දුකය. ඇතැමෙකු මෙය අර්ථ කථනය කරනු ලබන්නේ - ඉපදීම, මහළුවීම (වයසට පත්වීම) දුකකි යනුවෙනි. එහෙත් එය එසේ නොවන්නේය. උපන්දා සිටම ජරාවට පත් වීමද පවතින්නේය. නිදසුනක් වශයෙන් ඔබ එක් දිනක් හෝ ශරීරකෘත්‍යයන් ගෙන් බැහැර වන්නේ නම්, එවිට එහි පවතින ජරාවේ තත්ත්වය ප්‍රත්‍යක්‍ෂ කර ගැනිමට ඔබ හටම හැකිවනු ඇත. භවයේ ස්වභාවය එයයි. සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් දේශණා කොට වදාරා ඇත්තේ, එම භවය නිරෝධ කළ හැකි ආකාරයයි. මාර්ගයයි. ප්‍රතිපදාවයි. ආර්‍ය මාර්‍ගයෙහි ගමන් නොකොට අන්‍ය මාර්‍ගයන්හි ගමනේ යෙදෙමින් භව නිරෝධය අපේක්‍ෂා කරන්නේ නම් ඒ ඒ වනාහි දැලකින් සුළඟ බඳින්නට යන්නාක් වැනි, දැලකින් ගින්න බඳින්නට යන්නාක් වැනි, දැලකින් වතුර බඳින්නට යන්නාක් වැනි, හුදෙක්ම නිශ්ඵල ව්‍යායාමයන් පමණක්ම වනු ඇත.

අද දවසේද මාර්ගඵල ලාභී බුද්ධ පුත්‍රයන් වහන්සේලා වැඩ වෙසෙති. උන්වහන්සේලාව හඳුනා ගැනිමේ හැකියාවක් පෘථග්ජනයින් වන අපහට නැත. උන්වහන්සේලාද තමන් ලබා ඇති මාර්‍ගඵල ගැන ප්‍රකාශනයන් නොකරති. නිරාමිශ ප්‍රීතියෙන් යුතුව එහි ඵලය අත් විඳිති.

අප විසින්ද උත්සාහ කළ යුත්තේ එම උතුම් වූ ඵලයන් අවබෝධකර ගැනිම සඳහාය. ඒ සඳහා හැකියාව අද දවසේද නැත්තේ නොවෙයි.

බුදුන් වහන්සේ පිරිනිවන් පෑමට මොහොතකට මත්තෙන් සුභද්‍රා නම් පරිබ්‍රාජකයා හට කර ඇති දේශණාවෙන් එය මැනවින් පැහැදිලි වෙයි.

අසද්ධා පරප්පවාදා සමණෙහි අසද්ධද'ති
ඉමේච සුභද්ද භික්ඛු සම්මා විහරෙය්‍යුං
අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සාති

අනෙක් පරවාදීහු ශ්‍රමණයන්ගෙන් ශූන්‍යයහ. සුභද්‍ර! භික්ෂුහු මැනවින් පිළිවෙත් රක්නාහු නම් ලෝකය රහතුන්ගෙන් ශූන්‍ය නොවන්නේය.

මෙය බුදුන් වහන්සේගේ දේශනාව විය.

බුදු දහම සියල්ල අත්හරින්නට නොවේ. සසර පිළිබඳව තත්ත්වාබෝධය පිණිසමය. බුදුන් දවස සිටි අනේපිඩු සිටානන් වැනි මහධනවතුන් ගිහිගෙහි වෙසෙමින්ම - මහඵල ලබා ඇති බව බෞද්ධ පොත පතෙහි දැක්වෙයි. සුද්දෝධන රජතුමාද එවැන්නෙකි.

මේ ජාතියෙහිදීම තත්ත්වාවබෝධය ලැබ සතුටින් ජීවත්ව, අවසානයේ භව නිරෝධයෙන් දුක කෙළවර කිරීම ආර්‍ය මාර්ග දැක්මයි.

භව නිරෝධය පිණිස පිළිවෙත් රැකියයුත්තන් එම පිළිවෙත් නොරකින්නෙහි නම්, නිවන? කෙසේ ලබන්නද?

# 4

# වත්ත බද්දට දී - ඇස්සට දත නියැවීම

විරුද්ධ පාක්ෂික දේශපාලකයින් නිරන්තරයෙන්ම ජනතා පරමාධිපත්‍ය පිළිබඳව කථා කරනු බොහෝවිට ඇසිය හැකිය. ඔවුනට ජනතාවගේ අයිතීන් පිළිබඳව සිහිපත් වනුයේ බලයෙන් පිරිහුන තැනේ දීය. බලයේ සිටියදී තම බලය රැක ගැනීම පිණිස කවර හෝ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරනු ලබන පාලකයින් - බලයෙන් පිරිහුන තැනේ සිට, යළි බලය ලබාගැනීම - ජනතාවගේ කැමැත්තෙන් බැහැරව කළ නොහැකි බැවින් - ඔවුන් ජනතාවගේ අයිතිය පිළිබඳව කථා කරමින් ජනතාව මුළාවට පත්කළ හැකි සුරංගනා කථා කියති.

අවාසනාවකට මෙන් වත්මන් සමාජයේ ජනතාවද එවන් සුරංගනා කථා හමුවෙහි මුළාවට පත් වෙති. තමන් අත තිබෙන බලය නිසි අයුරින් පරිහරණය නොකරති. ජනතා පරමාධිපත්‍යය රැකෙන අයුරින් කටයුතු කිරීමට හැකි - එසේ කටයුතු කරනු ලබන පිරිසක් බලයට පත් කිරීමට හෝ එසේ පත්කළ හැකි ආණ්ඩුක්‍රමයක් සකසා ගැනීමට යුහුසුළු

නොවන ඔවුන් පවතින ක්‍රමයෙහි කොපමණ අඩුලුහුඬු කම් පැවතියේ වුවද, එය තුලම රැඳෙමින් - තවත් අවස්ථාවාදීන් කොටසකට බලය පවරා දෙති.

තමන් සතු බලය නිවැරදි නොවන කොටසකට පවරා දෙනු ලබන ජනතාව - තමන් සතු බලය ලබාගත්තවුන් විසින් ඔවුනගේ අභිමථය අනුව ආපසු ලබා දෙන යමක් අපේක්ෂාවෙන් බලා සිටිති. බලය ලබා ගත්තවුන් ඉසුරුමත් වෙද්දී - බලය ලබාදුන් ජනතාව මැසිවිලි නගති.

මේ වනාහි පැරණි කියමනක් වන "වත්ත බද්දට දී ඇස්සට දත නියවනවා" යන කියමන සනාථ කරනු ලබන අවස්ථාවකි.

මෙම යථා තත්ත්වය ජනතාව විසින් කවදා අවබෝධ කරගන්නේදැයි සිතිම පවා අද, දවසේ දුෂ්කරව ඇත්තේ තමන්ට ලැබෙන පෞද්ගලික ලාභ සංග්‍රහ හමුවෙහිදී, ඕනෑම පහත් කටයුත්තක් කිරීමට බොහෝ දෙනෙකු පෙළඹී ඇති බැවිනි.

බලය ලබා ගැනීමේ අරමුණින් යුතුව - තම පක්ෂය පිළිබඳව වාගාඩම්බරයෙන් කථා කරන දේශපාලකයින් විසින් ජනතාව එකිනෙකා වෛර කරවති. එකිනෙකා භේද කරවති. තම පවිත්‍රතාවයන් හුවා දැක්වීම පිණිස අනෙක් කණ්ඩායම් නිර්දය ලෙස විවේචනය කරති. ඒවා අසන පාක්ෂිකයින් ඔල්වරසන් දෙති. අත්පුඩි ගසති. හූරේ දමති.

මැතිවරණ අවසානයෙහිදී දෙපිල බෙදුන පාක්ෂිකයින් එකිනෙකා ගහ මරා ගනිති. අඬ දබර කර ගනිති. දේපල

විනාශ කර ගනිති. ජනතාව මෙසේ විනාශය කරා ගමන් කරද්දී, තනතුරු තණ්හාවෙන් පෙළුන නායකයින් පක්ෂ මාරු කරති. තනතුරු ලබති. බලයට එන්නට පෙර දැඩි දෝෂදර්ශණයට ලක් කළ කණ්ඩායම් පිළිබඳව ගුණ දකිති. එම ගුණ ගායනාවන් කරති. තමන් එසේ පක්ෂය මාරු කළේ ආත්ම ලාභය සඳහා නොව, රටට ඇති ආදරය නිසා බව කියති. ජනතාවට ඇති ආදරය නිසා බව කියති. ආත්ම ලාභය සඳහා කැසකවන ඇතැමුන් ප්‍රතිපත්ති පසෙක ලා මෙවැන්නක් පසු පසින් යති.

බුද්ධිමත් ජනතාව - විසින් දේශපාලකයින්ගේ මෙවැනි කථා පිළිකුලින් යුතුව හෙළා දකිති. එහෙත් ඒ බැව් ප්‍රකාශ කිරීමට බොහෝ අයෙකු හට හඬක් නැත. පක්ෂවලට බෙදී යමින් තමන් පත් කළ නායකයින් තමන්ගේ බුද්ධියට නිගා කරන බව ඔවුන් දනිති. ඒ සඳහා ප්‍රති ක්‍රියාකාරකම් දැක්වීමට අවස්ථාව එනතෙක් ඔවුහු බලා සිටිති.

ඡන්දදායකයා එසේ පෙළෙද්දී - තනතුරු ලෝභී නායකයින් - තනතුරු ලබමින් ආරක්ෂක රැකවරණ ලබමින් යෙහෙන් වැජඹෙති. යළි ජය ලබාගැනීම සඳහා උපාමාරු සකසති.

අවස්ථාව එළැඹෙති. වත්තේ අයිතිය යළි ජනතාව අතට පත්වී ඇත. එය බද්දට දීමට නියමිතය. එම කටයුත්ත බුද්ධිමත්ව කළ යුත්තකි. ජනතාව බුද්ධිමත් නොවන්නේ නම් - යළිත් සිදුවනුයේ වත්ත බද්දට දී - ඇස්සට දත නියවීමටය.

අද රටට අවැසිවන්නේ - ජාතික නායකයින් මිස - දේශපාලන නායකයින් නොවේ. අවාසනාවකට මෙන් අද නැත්තේද ජාතික නායකයින්ය. ජාතික නායකයින් බිහිකර

ගැනීමේ පරිසරය සකසා ගැනීමත් - ඒ සඳහා සුදුසුකම් ඇති අයව පමණක් තෝරා පත්කර ගැනීම ජනතාවගේ යුතුකම හා වගකීම වන්නේය. ජනතාව විසින්ම මෙය වටහාගත යුත්තේය. හැඟීමට වහල් නො වන්නටත් - බුද්ධිමත්ව ක්‍රියා කිරීමටත් පුහුණු විය යුත්තේය. ආත්ම ලාභය සඳහා නොව පොදු උන්නතිය උදෙසා කටයුතු කිරීමට කැපවීමෙන් ක්‍රියා කළ යුතුය. එවිට කලක් ගතවීමෙන් පසුව වුවද ජාතික නායකයින් බිහිවනු දැකිය හැකි වනු ඇත. .... ජනතාව බුද්ධිමත්ව, පරාර්ථශීලීව කටයුතු නොකර - ආත්මාර්ථයම හඹා යන්නෙහි නම්, තවදුරටත් නිස්සන් පසෙකට විසි වී ගොස් පුස්සන්ම රජ කරනු ඇත.

# 5

# අනේ මෙහෙමත් කථා

එය අධි පොසොන් පෝය දිනයකි. ප්‍රසිද්ධ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ජාලයකින් සිදුකළ විකාශයක් මමද බලා සිටියෙමි. එය විහාරස්ථානයකදී ශීල සමාධිත උවසු උවැසියන් උදෙසා ධර්ම දේශණයක් පවත්වනු ලබන අවස්ථාවකි.

එම දේශණය පවත්වමින්, හාමුදුරුවෝ මෙසේ කිය. දැන් බලන්න ගිහියන්ට රකින්න තියෙන්නෙ පන්සිල් පද පහ විතරයි. අපිට එහෙමද? ... අපට රකින්න කෝටියක් සංවර ශීල තියෙනවා. එහෙම විශාල සංඛ්‍යාවක් රකින්න තියෙන අපව, පන්සිල් පදපහ නොරකින ගිහියන් විසින් විවේචනය කරනවා. අපව දුශ්ශීලයන් හැටියට හඳුන්වනවා. අනුන්ව විවේචනය කරන්න ඉස්සර වෙලා තමුන්ගෙ වැරදි හදාගන්න ඕනෙ නෙ.

හාමුදුරුවන්ගේ දේශණය කොහොම වුනත් අන්තිම ටික හරිම අගෙයි. මොකද, අනුන්ව විවේචනය කරන්න ඉස්සර වෙලා තමුන්නෙ වැරදි හදාගන්න කියපු කියමන.

කිසිම පන්සලක මොන යම් අවස්ථාවකදීවත් කිසිම කෙනෙකුව බලහත්කාරයෙන් මහණ කරන්නේ නැති බව හැමෝම දන්නවා. ඉතින් කවුරුන් හෝ ශ්‍රමණභාවය ලබාගන්නවා නම්, ඒ වෙනුවෙන් පනවා ඇති විනය ප්‍රතිපත්ති පිළිගැනීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තක්.

කවුරුන් හට හෝ එවැනි විනය ප්‍රතිපත්ති රැකීමේ අපහසුවක් තියෙනවා නම් ඉන් ඉවත්ව යෑමේ කිසිම බාධාවක්, අප දන්නා තරමින් බුද්ධ ශාසනය තුළ නැහැ. හැබැයි ශාසනයට ඇතුලත්වී ශ්‍රමණ භාවය ලබා ගන්නා තැනැත්තෝ, සංසාර දුක්ඛයෙන් මිදී මහඑල පසක් කර ගැනීමේ අරමුණින් යුතුව එහි පිළිපන් අයෙකු බැවින්, එවන් අයගේ චර්යාවන් නිවැරදිව පවත්වා ගැනීම පිණිස පනවා ඇති විනය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නිරායාසයෙන්ම බැඳෙන බව නම් සැබෑවකි. නිර්වාණගාමිත්ත්වය අපේක්ෂාවෙන් යුක්තව, කෙළෙසුන් ප්‍රහීණ කිරීමේ නිරතවන යතිවරයන් වහන්සේලාහට සිවු පසයෙන් සංග්‍රහ කිරීම ගිහියන් විසින් ඉතාමත් ඕනෑකමින් සිදුකරනු වර්තමානයේදී ද හොඳින්ම දැකගත හැකි බවද පැවසීම මුසාවක් නොවන්නේය. පැවිද්ද ලැබූ අය සංසාර විමුක්තිය උදෙසා වෙර දැරිය යුතුය.

ගිහියා එසේ නොවේ. පෘථග්ජනයෙකි. ඔවුන් අතුරෙන් බොහොමයක් සසර දුක පිළිබඳව නිරවුල්ව නොදකිති. දුකෙහිම ගැටෙමින් එය සැපය යයි සිතමින් සැපය සොයති. එවන් ජන කොටසකට දුකින් මිදීමට මඟ කියාදීමත්, ඔවුනට දුකින් මිදීමට උපකාර කිරීමත් කළ යුතු බවට, බුදුන් වහන්සේ විසින්ම, බුද්ධ පුත්‍රයන් වහන්සේලාට අනුදැන වදාරා ඇති උපදේශයකි.

ඒ අනුව ගිහියා හට හරි මඟ පෙන්වා දීම එක කටයුත්තකි. ගිහියාව ඒ මඟ ගමන් කිරීමට පෙළැඹවීම තවත් කටයුත්තකි.

ගිහියා හට ධර්ම මාර්ගය පෙන්වා දුන්නේ වුවද - ඔහු ධර්ම මාර්ගයෙහි ගමන් නොකරන්නේ නම්, ඒ ඔහුගේ කර්මයයි. ඒ පිළිබඳව බුද්ධ පුත්‍රයන් වහන්සේලා කැළඹීමට පත්විය යුතු නොවෙයි. තමන් වහන්සේ විසින් ඇති කරගත් සසර දුකින් එතෙරවීමේ අරමුණ සාක්‍ෂාත් කරගැනීමේ කාර්යය නිවැරදිව කර ගැනීම වඩාත් වැදගත් වන්නේ නොවේද?


බුදුන් වහන්සේ විසින් දේශණා කරනු ලැබ ඇත්තේ ද මෙසේය. තථාගතයන් වහන්සේ මඟ පෙන්වා දෙනු ලබන සේක. ඔබ, ඔබ විසින්ම එම මාර්ගයේ යා යුත්තේය. පමාවකින් තොරව එම මඟට පිළිපන් තැනැත්තේ මාරයාගේ බන්ධනයෙන් මිදෙන්නේය.

තුම්හේහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා
පටිපන්නො පමොක්ඛන්ති -ඣායිනො මාර බාධනා

සියළුම ලෝක ජනතාව එකම තැනකදී නිවන් දැක්වීමේ හැකියාවක් තිබුණේ නම්, තථාගතයන් වහන්සේ විසින් ඉහත සඳහන් ගාථාව දේශනා නොකරනු ඇත. ඒ වෙනුවට එක කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා සියළු ජනයාව නිවන් දක්වනු ඇත. එහෙත් එවැන්නක් සිදු වී නැත. එසේ සිදුකළ හැකි බවක්ද නොපැවසෙයි.

ගිහියා සිල් රකිනවා බලා සිටිනවාට වඩා, සසුන් ගතවී සිටින ඔබ වහන්සේ හෝ නිසි අයුරින් ධර්මාවබෝධය ලබමින්

මහඵල ලාභියෙක් බවට පත්වන්නේ නම් වඩාත් උචිත දෙය එයම නොවන්නේද?... එය එවන් අයුරින් සිදුවන්නෙහි නම් ... එවැනි යුගයක ඉපදී සිටින අපද සැබැවින්ම පිං වන්තයන් නොවන්නේද?... මේවාට පිළිතුරු ඇත්තේද ඔබ වහන්සේලා තුළමය. නොපමාව ඒවා එළි දක්වන්නේ නම් .. එයද මහඟු පිංකමක් වනු නොඅනුමානය.



# 6

# විද්‍යාවෙහි දියුණුව

අද විද්‍යාව දියුණු යැයි බොහෝ දෙනෙකු කියනු ඇසෙයි. යහපත් දෙයක දියුණුවක් වේ නම් එය සැබැවින්ම අගය කළ යුත්තේ ය. එය එසේම විය යුත්තේ, එම දියුණුව සත්ත්ව සන්තතියේ යහපත සඳහාම පමණක් හේතු වන්නේ නම් පමණකි.

නොදියුණු සමාජයකැයි කියන ඈත අතීතයේ ජීවත් වූ මිනිසුන් අතර ද අඬ දබර - කලකෝලාහල සිදුවී ඇත. එවන් කාලය තුලදී අනතුරට හෝ ආපදාවට පත්වී ඇත්තේ, එකී අරගලයකට යොමුවූ අය පමණකි. එදා ගල් මුගුරු - පොලු - කැති - පිහි - මන්නා, කඩු හී, තෝමර - හෙල්ල වැනි ආයුධ පාවිච්චි කරමින් සිදුවූ සටන්වලදී සිදුවී ඇති හානි විශාල ලෙස එවකට සිටි අය දුටු බවට ඉතිහාසය තුළින් සාධක ඕනෑ තරම් දැකිය හැකිය.

කාලිංග දේශය ආක්‍රමණය කළ චණ්ඩාශෝක රජු -

එම සංග්‍රාමයේ බිහිසුණු බව නිසාවෙන්, විනාශ වී ඇති ජීවිත හා දේපළ - ගලායන රුධිරය දැක ඉන් කම්පාවට පත්වීම හේතුවෙන් සියළු ආක්‍රමණයන් අත්හැර දැහැමි අයෙකු බවට පත්වී, ධර්මාශෝක නමින් බුද්ධ ශාසනයෙහි උන්නතිය උදෙසා අමිල මෙහෙයක් සිදුකොට ඇත.

ප්‍රචණ්ඩත්වයෙහි සැබෑ මුහුණුවර කුරිරුය. වේදනාකාරීය, බල අරගලයෙහි නිරතවන වත්මන් බල ලෝභීන් - ස්වකීය බලය පවත්වා ගැනීම පිණිස විවිධ උපක්‍රම යොදති. ආයුධයන් තනති. තනවති. මුදල් වැය කරති. මේ හැම දෙයකම මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ තම බලය ආරක්ෂා කර ගැනීමය.

තමන් විසින් සැළසුම් කරනු ලබන ප්‍රචණ්ඩත්වය හමුවෙහි සත්ත්ව ප්‍රජාවට හෝ භෞතික සම්පත්වලට සිදුවන හානිය පිළිබඳව බලලෝභීත්වයෙන් පෙළෙන ඔවුන්ගේ මනැසට ගෝචරවී නොමැතිවීම ඛේදජනකය.

විද්‍යාවේ දියුණුවේ නාමයෙන් අද දවසේ නිපදවා ඇති - ජලකර - පරමාණු - නියුට්‍රෝන් වැනි අවි අති භයානකය. එවන් අවි ප්‍රහාරයන් සිදු වුවහොත් එයට ගොදුරුවන සියළුම දේ විනාශ වන්නේමය.

රාජ්‍යයක් ඇතිවීමට භූමියක් තිබිය යුතුය. භූමියක් තිබූ පමණින්ම එය රාජ්‍යයක් නොවන්නේය. භූමියක් මත රාජ්‍යයක් ඇතිවීමට නම් එහි ජනතාවක් සිටිය යුතුය. පාලකයින් හා පාලිතයින් ඇතිවන්නේ එවිටය.

සත්ත්ව ප්‍රජාව සුන්නත් දූවිලි කරමින් - සියළු භෞතික සම්පත් වනසා, ස්වභාව ධර්මයාගේ සමතුලිත භාවයට හානි

සිදුකරමින්, පවත්වා ගන්නට යන බලය කුමක්දැයි බල තණ්හාධිකයින් හට නොපෙනෙන බැවින් එහි පවතින අනතුර අති විශාලය.

මෙවන් විනාශයක් කළ හැකි භයානක අවි ආයුධ සොයා ගැනීම - නිපදවීම - මිනිසා විසින් සිදුකරන්නෙහි නම්, ඒවායින් සියළුම සත්ත්වයින්ගේ විනාශය සිදුවන්නේ නම් එවන් ක්‍රම වේදයක් - දියුණු විද්‍යාවකැයි පිළිගන්නේ කෙසේද? එහි ඇති දියුණුව කුමක්ද?

සත්ත්වයාගේ යහ පැවැත්ම, උන්නතිය සඳහා හේතුවන අරමුණුවලින් බැහැරව යමින් - සත්ත්ව ප්‍රජාවන්ගේ විනාශය පිණිසම හේතුවන කටයුතු කරන්නවුන් හට මෙය විද්‍යාවේ දියුණුව ලෙස පෙනෙන්නේ නම්...

කිව යුතුව ඇත්තේ මෙයයි... වේදයෙහි විෂ්ණුගේ අවතාර අතරින් අවසාන අවතාරය "කල්කි"ය. මිනිසා විසින් දියුණු කර ගන්නා බුද්ධිය හේතුවෙන්ම මිනිස් වර්ගයාගේ විනාශය ඇතිවන අයුරු ඉන් විග්‍රහ කෙරෙයි.

විද්‍යාවෙන් දියුණුයැයි වහසිබස් දොඩන බටහිර ජාතින් - හට ස්වභාවධර්මය අභිබවා යාගත නොහැකිව අඳෝනා නගනු ඇසිය හැකි ය. ඔවිහු අනපේක්ෂිත සුළි සුළං වලින් පහර කති. මහා කුණාටු, භූමි කම්පාවලින් වැළකී ගත නොහැකිව මැසිවිලි නගති. හිම කුණාටුවලට යටවෙති. අනපේක්ෂිත හිම පතනයන් හේතු කොටගෙන තම දෛනික කටයුතු අත්හැර දමති. ... ස්වභාව ධර්මයෙහි ක්‍රියාකාරීත්වය හමුවෙහි විද්‍යාඥයින් අනාථයන් වී ඇත. ස්වභාව ධර්මයේ

ක්‍රියාවලිය හමුවෙහි දී පරාජය වී මැසිවිලි නඟන්නට සිදු වී ඇති තැන ඔවුන් ලබා ඇති විද්‍යාවේ දියුණුව කුමක්ද?

ලිප ගිනි මොළවන තෙක් දිය සැලියේ
සැපයක් යැයි කකුළුව දිය කෙලියේ

යන්නද වත්මන් විද්‍යාවේ දියුණුව පිළිබඳව වහසි බස් දොඩන්නවුනට - අධ්‍යයනය කිරීම උදෙසා දිය යුතු මහඟු උපදේශයකි.

# 7

# කෘතගුණවේදී වීම - නොවීම

මිනිසා උපදින විට අසරණය. කුඩා බිළිදෙකු වශයෙන් මෙලොව උපත ලද තැනැත්තා හට ... තම අවශ්‍යයතාවයන් ඉටුකර ගැනීමේ හැකියාවක් නැත. කළ හැකි එකම දේ හැඬීම පමණකි.

කෙනෙකුන් වියපත් වී, තමාගේ කටයුතු කරගැනීමේ හැකියාව ඇතිවන තෙක්, ඔහුට අන් අයගේ උපකාරයන් නැතිවම බැරිය. එසේ අන් අයගේ උපකාරයන් නොලැබෙන්නට බිළිඳා - බිළිදෙකු ලෙසින්ම මිය යනු නොඅනුමානය.

බිළිඳාගේ කැත කුණු සෝදා, පිරිසිදු කිරීමටත් කවා පොවා පෝෂණය කිරීමටත්, අම්මා. තාත්තා, නැන්දා, මාමා, අයියා, අක්කා වැනි හෝ මෙකී නොකී කවරෙකුගේ හෝ සහය නොවන්නට බිළිඳා හට අත්වන ඉරණම "මරණයම" නොවන්නේද? කෙසේ හෝ වේවා, තම දිවි සරුකර ගැනීමට බිළිදාගේ කය වැඩී උස් මහත් වීමම පමණක් ප්‍රමාණවත් නොවන්නේය. නිසි අධ්‍යාපනයක් මෙන්ම අනෙකුත් ඕනෑ එපා

කම්ද සැපයිය යුතුය. මෙවන් කටයුතු වලදී, මව්පියන් විසින් ඔවුනගේ පෞද්ගලික සැප විහරණයන්ද නොතකා හරිමින් තම දරුවන්ගේ අභිවෘද්ධියම අපේක්ෂා කරමින් කටයුතු කරති.

සියළු දේ දරුවා වෙනුවෙන්ම කැප කරති.

මෙවන් කැපවීම් නිසාම, උස් මහත් වී වැඩුන දරුවා තමාගේ දියුණුවට අත හිත දුන් අයව අමතක කර දමා, තම ආත්ම අභිවෘද්ධිය සඳහාම පමණක් පවතින්නේ නම් එවන් පුද්ගලයෙකුගෙන් සමාජයට - රටට - ලෝකයට කවර නම් වූ ආකාරයක යහපතක් අපේක්ෂා කළ හැකිද?... එවැනි හැකියාවක් නොවන්නේමය.

මෙවන් චරිත ඇති ඇතැමුන් ලෝකයා හමුවෙහි මහා දානපතියන් සේ හැසිරෙන්නෝය. සැබැවින්ම එවැන්නන් මහාදානපතියන් නොව ආත්ම වංචනිකයෝ ය.

අතීතයේ පැවති ඇති දූදරු මාපිය සෙනෙහස පිළිබඳ කථාවන් බෙහෝය. එවන් යුගවල කවර අවස්ථාවකදී හෝ මව්පියන් තම දරුවන් කසළ ගොඩවලට විසිකර දැමූ බවක් දකින්නට නැත. එවැන්නක් සිදුවී ඇත්තේ නම් එයද ඉතාමත් විරළ දෙයක් වශයෙනි.

වර්තමානයේ එසේ නොව, දරුවන් අත්හල දෙමාපියන් පිළිබඳව - කසළ ගොඩවල දමා ගොස් ඇති දරුවන් පිළිබඳව නිරන්තරයෙන්ම ඇසිය හැකි තත්ත්වයක් උදාවී තිබීම ඛේදජනකය.

ඇතැම්විට ඒවා ඛේදනීය සිද්ධි වශයෙන් දැකීමද

සාධාරණ නොවන්නේයැ'යි කෙනෙකු හට සිතෙන්නට ද බැරිකමක් නැත. මෙලොව වශයෙන් තම දියුණුවට උපකාර කළ දෙමව්පියන් නොසළකා හැරිය, දෙමව්පියන්ගේ අගය හඳුනා නොගත් අයෙකු විසින් කවර නම් වූ ජාති අවස්ථාවකදී හෝ කෙසේ නම් මව් පිය සෙනෙහස ලබන්නද? නොලබන්නේම ය. ඒ වනාහි ඔවුන් විසින් සිදුකළ මව් පියන් නොසළකා හැරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතික්‍රියාවන් පමණකි.

# 8

## අකෘතඥයා

ජීවත්වන සැම සියළු අයෙකු හටම, ලෞකික ජීවිතයේ උන්නතිය උදෙසා අන් අයගේ පිළිසරණ ඕනෑ වන්නේය.

එකිනෙකා හට උපකාරී වීම ජීවියාගේ ස්වභාවයයි. තම අවැසිතාවයන් උදෙසා අනේක අප්‍රමාණ උපකාර ලබාගත් අකෘතඥ පුද්ගලයා - ප්‍රතිඋපකාර කිරීම හෝ කෘතඥභාවය පළ කිරීම වෙනුවට සිදුකරනු ලබනුයේ කුමක් හෝ හේතුවක් ගෙන හැර පාමින්, එය හුවා දක්වමින් - අමනාපයක් ඇතිකොට ගෙන - තමන් විසින් දැක්විය යුතුව ඇති කෘතඥතාවයෙන් බැහැරවී සිටීමය.

එය ජයග්‍රහණයක් ලෙස ගනිමින් උද්දාමයට පත්වීමත් යළිත් තම අවැසිතාවයක් ඇතිවූ මොහොතකදී - තම වැරදි සඟවා ගනිමින් - ගුණවත් පුද්ගලයා වෙත ගොස් පිළිසරණ පැතීමට තරම් දීනයෙක් වීමත් අකෘතඥයා හට එතරම් අපහසු කටයුත්තක් නොවන්නේ ය.

තමා විසින් සිදුකරන ලද සියළු වැරදි අනුන් මත පැටවීමට පසුබට නොවන හෙතෙම - අනුන් විසින් සිදු කරන ලද සියළු යහපත් දේ තමා විසින් කරන ලදැයි කියමින් ඒවායේ උරුමයට හිමිකම් පාන්නට තරම් නිර්ලප්ජිතයෙක් ද වන්නේය.

# 9

## "කෙලෙහි" ගුණ නොදන්නා...

මුඛය තුළ ඇති බෙඩ ග්‍රන්ථීන් ගෙන් ශ්‍රාවය වන "කෙල" නම් වූ ද්‍රව්‍ය - සත්ත්වයාගේ පැවැත්මට ඉටුකරන කාර්යය අති මහත් එකකි.

කෙළ ඇති නොවන්නට මුවෙහි තෙත් ගතිය නැතිවීමෙන් දිවෙන් රස බැලීමට නොහැකිවනු ඇත. කථා කිරීමේ හැකියාව නැතිවී යනු ඇත. ආහාර දිරවීමේ ක්‍රියාවලියට අවහිරතාවයන් මතුවනු ඇත. කෙල කොතරම් සත්ත්වයාට සමීප වන්නේද යත් - කිසියම් රසක් හෝ ප්‍රියකර ආහාරමය සුවඳක් වැනි දෙයක් දැනුන විට - කටට උනන්නේද කෙලය. එබැවින් "කෙල"ය යනු අගය ඇති දෙයකි.

එහෙත් එහි අගය පවතින්නේ ඒවා මුව තුළ තිබෙන තාක් පමණකි. කවර හේතුවක් නිසා හෝ "කෙල" මුවෙන් බැහැර කරනු ලැබුයේ නම් - එතැන්සිට එය අප්‍රිය ජනක දෙයකි. - එහි දක්නේ දුර්ගුණය පමණකි. මුව තුළ සිටියදී කොතරම් මහෝපකාරී වූයේ වුවද - මුවින් බැහැර වූ සැනින්

ඒ සියළු උපකාරයන් දුරුවී යන්නේය. කෙලවලින් ප්‍රයෝජනය ගත් තැනැත්තෝ එහි ගුණය අමතක කොට බැහැරවූ කෙලෙහි නුගුණම පවසන්නෝය.

මෙය කෙලවලට පමණක් සීමා වූවක් නොවේ. තමන්ගේ ප්‍රයෝජනය - ලාභය සඳහා තමන් සමඟ වෙසෙමින් කටයුතු කරනු ලබන්නෙ කවරෙකු වුවද - තමා වෙතින් බැහැර වූ තැන් පටන් අනේක විධ ලාභ උපකාර ඇතිකර දුන් තැනැත්තාගේ දෝශයම දකින්නේය. දුර්ගුණයම ප්‍රකාශ කරන්නේය. හොඳක් නම් නොදකින්නේය.

පෘථග්ජන තැනැත්තාගේ ස්වභාවයම එය වෙයි.

# 10

## අභිමානයක තරම

රණසිංහ තම සය හැවිරිදි පුතුන් සමඟ පාසැලේ විවෘත කිරීමේ උත්සවයට ගොස් ආපසු නිවසට යමින් සිටියෝය. රණසිංහ මෝටර් රථය පදවන අතර ඔහුගේ පුතා සිටියේ ඉදිරිපස අනෙක් අසුනෙහි ය.

තාත්තේ ... අර කොඩිය උස්සන කොට හැමෝම නැගිට්ටෙ ඇයි?

රිය තුල තිබූ නිහැඬිතාවය බිඳිනු ලැබුයේ රණසිංහගේ පුතු කසුන් විසිනි.

පුතේ... ඒක අපේ චාරිත්‍රයක්. ඕනැම උත්සව අවස්ථාවකදී ජාතික කොඩිය එසැවීම සිරිතක්. ඉතින් එහෙම ජාතික කොඩිය ඔසවන කොට හැමෝම එයට ගරු කිරීමක් වශයෙන් නැගී සිටිනවා.

ඉතින් තාත්තේ ජාතික කොඩියක් මොකටද?...

පුතේ ඕනැම රටක තමන්ගේ රට වෙනුවෙන් සකස්

කරපු කොඩියක් තියෙනවා. ජාතික උත්සවවලදී වගේම ජාත්‍යන්තරයේදීත් ඒ ඒ රටවල් නියෝජනය වන බව ඒ ඒ රටවලට අයත් කොඩි ඔසවා තිබීමෙන්, අනෙක් අයට දැනගන්නට පුළුවන් වෙනවා. මොන රටක මොන යම් ජාතියක අයෙක් වුනත් ඒ ඒ රටවල ජාතික කොඩියට ගෞරව දක්වනවා.

ඉතින් තාත්තෙ අපේ ජාතික කොඩියේ සිංහයෙකු ගේ රූපයක් තියෙන්නෙ ඇයි?...

පුතේ සිංහයා කියන්නේ එඩිතර සතෙක්. වීරත්වය පෙන්වන කෙනෙක්. අනෙක, කැලේ සත්තුන්ගේ නායකයා. ඉතින් එඩිතරකම, වීරත්වය නායකත්වය සංකේතවත් කරන්න අපේ කොඩියේ සිංහයෙකු ගේ රූපය බොහොම ඈත කාලයක රජ දවසේ පටන් පවත්වාගෙන එනවා.

ඒත් තාත්තෙ සිංහයාට කඩුවක් දීල තියෙන්නෙ මොකද?... සිංහයා කඩුවෙන් සටන් කරන්න දන්නවාද?

නැහැ පුතේ... සිංහයා කඩුවෙන් සටන් කරන්නේ නැහැ. එඩිතර වීරයෙක් වුන සිංහයාගේ අතට කඩුවකුත් ලැබුණාම තවත් වීරත්ත්වය වැඩිවෙලා පෙනෙනවානේ. එතැන වැඩි අභිමානයක් තියෙනවා නේ.

කසුන් අසිරුතාවයෙන් මෙන් ඇඹරුණේය. රණසිංහ හටද ඒ බැව් දැනිණ. ඔහු කසුන් දෙස බැලුවේය.

ඇයි පුතා.... මොකද?....

නැහැ තාත්තෙ මම හිතුවෙ ... අපරාදෙ සිංහයාගෙ අතට කඩුවක් දීල තියෙන්නෙ. එක අතකින් කඩුව අල්ලගෙන

හින්දා සිංහයා ඉන්නෙ කකුල් තුනෙන්. ඉතින් සිංහයාට කකුල් තුනෙන් ඇවිදින්න බැහැනෙ. අපරාදෙ. කඩුවක් අල්ල ගන්න ගිහිල්ල සිංහයාට එක තැනම හිටගෙන ඉන්න වෙලා. අමුතු වීරකමක් තියා, තියෙන වීරකම වත් පෙන්වන්න බැහැ.... හරිම මෝඩ වැඩක්... නේද තාත්තෙ.

රණසිංහ කැළඹිල්ලට පත්විය. ජාතික අභිමානය පිළිබඳව කියා දෙන්නට ගොස් තමන් අමාරුවක වැටුන බවක් රණසිංහට සිතුණි. පුතුට යමක් කිව යුතුය. එහෙත් කුමක් කියන්නද? .... පුතා කියන්නේ සත්‍යයක් බව රණසිංහට ද වැටහි තිබුණි.

වරදක් සිදුවී ඇත. ලොකු අඩුවක් තිබේ. එහෙත් එම වරද නිවැරදි කිරීමේ හැකියාවක් තමන් සතුව නොමැති බව සිතන රණසිංහ අනාථ වූවෙකු මෙන් වටපිට බැලුවේය.

කසුන් කිසියම් සිතිවිල්ලක නිමග්නව සිටි බව පෙනුනි. ඔහුගේ මුවෙහි සිහින් උපහාසාත්මක සිනහවක් මතුවී තිබුණි.

අභිමානය පිළිබඳව තවත් කිසිවක් තම පුතුට පැවසීමට රණසිංහ තුල සවියක් නොවීය. පොඩි දරුවාට වුවද පෙනෙන වරදක් නිවැරදි කිරීමේ හැකියාව නොමැති වැඩිහිටි කම කොතරම් නිසරුදැයි රණසිංහට සිතුන. ඔහු බලධාරියෙකු නොවන නිසා ඔහුට කළ හැකි කිසිවක් තිබුනේ ද නැත. අනේ පුතේ නුඹලා ලොකු වෙලා හරි නිවැරදි කළ යුතු දේ නිවැරදි කරාපල්ලා යැ'යි සිතාගත් රණසිංහ... සුසුමක් හෙළමින් එහි වගකීමද ඉදිරි පරම්පරාව වෙත පවරා තම සිත සැහැල්ලු කරගත්තේ ය.

# 11

## තවත් මිනිහෙක්

වාට්ටුව පුරා පැතිර තිබූ බෙහෙත්වල සුවඳ හමායන මද සුළඟේ මුසුව වාට්ටුව කෙළවරේ තිබූ කාමරය තුළ ද විසිර ගියේය. කාමරය තුල වූයේ ගැඹුරු නිහැඬිතාවයකි. එහි ක්‍රමවත් අයුරින් තැබූ වෛද්‍ය උපකරණ තැන්පත් කළ විදුරු අල්මාරිය දොස්තර මහතාගේ මේසයට දකුණු පසින්ද, ලිපි ද්‍රව්‍ය ආදිය අඩංගු අල්මාරිය මේසයට වම් පසින්ද විය. මේසය මත කඩදාසි බරුවට යටව තිබූ රෝග සටහන් පත්, මේසයට ඉහලින් කරකැවෙමින් තිබූ විදුලි පංකාවේ සුළං රැල්ලේ පිහිටෙන් මේසයෙන් ඉවතට යන්නට බොළඳ උත්සාහයක් දැරිය. ප්‍රධාන වෛද්‍ය නිලධාරි යනුවෙන් සටහන් කර ඔප මට්ටම් කරන ලද හැඳින්වීම් පුවරුව මේසය මත වම් පසින් විය. මේසය අද්දර හා පසෙක පුටු දෙකක් විය. පසෙක ඇති පුටුව හිස්ව තිබුණ අතර, මේසය අද්දර පුටුවේ වාඩි වී සිටියේ වයසින් අවුරුදු හතලිහක් පමණ තරම් යැයි කිව හැකි කඩවසම් පෙනුමැති වෛද්‍යවරයෙකි.

ඔහු අත රෝගියෙකුගේ රෝග තත්ත්වය පිළිබඳ සටහන් පත් කිහිපයක් විය. මේ වන විට ඔහුගේ දැඩි අවධානය එය වෙත යොමු වී ඇති බවත් පෙනෙන්නට තිබුණි. මෙතෙක් කාමරය තුල රජ කළ නිහැඬියාව බිඳ හෙලමින් ඔරලෝසුව නාද විය. වෛද්‍යවරයාගේ අවධානය සටහන් පත් කෙරෙන් මදකට ඉවත්වී ඔරලෝසුව දෙසට යොමු විය.

රෑ. දොළහයි.... ඔහු තමාටම කොඳුරා ගත්තේය. මනාව පීරා ඇති ඔහුගේ රැළි හිසකේ අතරින් කෙස් කැරළි කිහිපයක් නළල මත වැටී, විදුලි පංකාවෙන් එන සුළං රැලි නිසා ඒ මේ අත පැද්දෙමින් තිබිණ. එය ඔහුට වදයක් විය. ඔහු කිහිපවිටක්ම එය සියතින් සකස් කළ නමුදු එය යලි යලිත් පහලට වැටී පෙර මෙන් නලියන්නට විය. අත තිබූ සටහන් පත් මේසය මත තැබූ ඔහු තම අසුනින් නැගී සිටියේය. වාට්ටුව තුල ඇත්තේ දැඩි නිහැඬියාවකි. ඔහු සෙමින් සෙමින් කාමරයේ දොරටුව දෙසට පියමං කළේය. නැවත මේසය අසළට ආවේය. ආපසු දොරටුව දෙසට පිය නැඟිය. ... මාලිකා ගෙදර ඇවිත් ඇද්ද?

ඔහු සිතුවේය..... නැතුව ඇති. .... අහංකාර ගෑණි ..... මිනිහෙක් ඉන්නව කියල නිකම්වත් හිතන්නෙ නැහැ. ..... එයාගෙ යාළුවොයි..... පැෂන් එකයි තිබුනම එයාට හොඳටම ඇති. ..... ඇයි දෙයියනේ ...... මම මාලිකාව කසාද බැන්දේ. ...... තාත්තගෙ හිත රිදවන්න බැරිකම නිසානෙ. .....දැවැද්ද.... බුදලේ.... හිතේ සතුටක් නැතිව මොකටද මේවා .... ඉහළ අතු අල්ලන්න තාත්තගේ තිබුණ ආශාව ..... ඔව් ....... තාත්තා සතුටු වුණා. ..... මට හිතෙනවා..... හැම දෙයක්ම අත හැරල....

කොහේ හරි යන්න. .... කවුද මා ගැන හිතන්නෙ. .......මට අනුකම්පා කරන්නේ ....ඒත් එක අතකට ....... මේ අහිංසක මිනිසුන්ට උදව්කරන එක හොඳයි. .... මේ මිනිස්සු ගාව අනුකම්පාව - මිනිස්කම තියෙනවා .... ඔහුගේ මනැසින් වැල නොකැඩී සිතුවිලි ගැලුවේය.

ටක් .... ටක් .... ටක්.... වාට්ටුව තුල ඇවිදින සාත්තු සේවිකාවකගේ පාවහන් ගැටෙන හඬින් ඔහුගේ සිතුවිලි බිඳුනි. මෙතෙක් වේලා දොරකඩට වී සිටි ඔහු වාට්ටුව සිසාරා දෙනෙත් එළැවීය. සියල්ල නිහඬය. තම කාමරයට යාබද ඇඳේ නිදන රෝගියා දෙස ඔහු සුපරීක්ෂාරීව බැලුවේය. දැඩි නින්දකට පත් වී සිටි රෝගියාගේ ශරීරගත කිරීමට එල්වා තිබූ සේලයින් බෝතලයේ අඩකටත් වඩා දැනට අවසන් වී ඇති බවත් ඔහු දුටුවේය. සිහින් සුසුමක් ඔහු මුවින් පිට විය. තමාත් කුමන හෝ අයුරකින් රෝගී සිල්වා ගේ තත්වයට ඉතාමත් සමීපව සිටින බවක් ඔහුට සිතුණි. ඔහු යළිත් කාමරය තුළට වැදී තම අසුන මත ඇද වැටුණේය. සිල්වා තමා සමග කළ ඔහුගේ ජීවිත කථාව වෛද්‍යවරයාගේ සිතට නැගී ආවේය. කාමරයේ ඉදිරිපස බිත්තියේ සවිකොට තිබූ බුදුරුව ඉදිරියේ නිවී නිවී දැල්වෙන රතු විදුලි බුබුල ඔහුගේ සිතට බිය මුසු අවිනිශ්චිත බවක් දැනවිය. යළිත් මේසය මත තිබූ රෝග සටහන් පත් කිහිපය අතට ගත් ඔහු තම අවධානය එදෙසට යොමු කළේය. ඔහු ධ්‍යානයකට සම වැදුනාක් මෙන් එදෙස බලා සිටියේය. රෝගී සිල්වාගේ කටහඬ ඔහුගේ දෙසවනෙහි පතිත වන්නාක් මෙන් ඔහුට හැඟිණ. ඔහුගේ මනස තුළ සිල්වාගේ වදන් දෝංකාරය නංවන්නට විය.

ලෝකයා හරි දරුණුයි සර්.... මිනිස්සු හැම තිස්සෙම හිතන්නෙ හරිම ආත්මාර්ථකාමී විදියට. .... ඔවුන් හැම තිස්සෙම බලන්නෙ අනුන්ව විවේචනය කර තමන්ගෙ වැරදි වහගෙන .... තමන් හොඳ මිනිසුන් බව අනෙක් අයට පෙන්වන්නයි.... මිනිහෙක් අතින් වරදක් වුණාම, ඒ මිනිහා අතින් එම වරද වුණේ ඇයි කියලවත් .... ඒ වරද කරන්න පෙළැඹුනේ ඇයි කියලවත් මිනිසුන් හිතන්නේ නැහැ. ....උන් එක පාරටම ඒ මිනිහව වැරදිකාරයෙක් හැටියට හංවඩු ගහලා මුළු සමාජයෙන්ම කොන් කරන්න බලනවා. .... ඒක කිසිම අනුකම්පාවක් නැති අසාධාරණ වැඩක්. .... එහෙව් ලෝකයා ගෙන් මම කිසිම අනුකම්පාවක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. කුහක ලෝකයාගේ අනුකම්පාව දැන් ඉතින් මට ඕනෙත් නැහැ. ... ඒ වුනත් කා එක්ක හරි මේකෙ ඇත්ත තත්ත්වය කියල මගේ හිත නිදහස් කර ගන්න. .... මම හිතාගෙනයි උන්නෙ. ... සර්ට මේ ගැන කියන්න ලැබ්විච එකත් වාසනාවක් කියලයි මට හිතෙන්නෙ.

මම බැඳපු මිනිහෙක් සර්. ... ඔව්. .... ලෝක චාරිත්‍ර අනුව කසාද බැඳපු මිනිහෙක්. ... මම බඳින්න ඉස්සර වෙලා අවුරුදු ගණනක් ආදරයෙන් ඉඳල .... කරදර .... බාධක .... රාශියක් මැද්දෙ මම එයාව බැඳ ගත්තෙ. ඒ දවස්වල මගේ සිත දහසකුත් එකක් සිතුවිලි වලින් පිරී තිබුණා. අපට විරුද්ධකම් පෑව අයට පෙන්වන්නත් එක්ක හොඳින් සතුටින් ජීවත් වෙන්න මම සිහින දැක්කා. .... ඒත් අපි දෙන්නට අවුරුද්දක්වත් සතුටින් ජීවත් වෙන්න බැරි වුණා. ... ඒකෙ වැරැද්ද කාගෙද කියල හිතා ගන්න මට එදා අමාරු වුණා. කොහොම වුනත් ඒ හිටපු අවුරුද්දක් විතර කාලයක් මම

ගත කළේ මටම පොදු වෙච්ච ලෝකයක් තුළට වී මානසික අසහනයකනුයි. ... එයා මට හරිම ආදරෙයි. ... කරුණාවන්තයි. ඒ වුනත් එයාගේ ලොකු අඩුවක් තිබුණා. ... ඒ අඩුව මඟ හරවන්නට මම නොගත් උත්සාහයක් නැහැ. ..... නමුත් හරි ගියේ නැහැ. .... ඒක නිසාම ටිකෙන් ටික මට එයාව එපා වුණා. ... එයා නිසා මා ලැබූ මානසික අසහනය හැම විටම මට තනියම විඳගන්න සිදුවුණා. .... ලෝකයාට කියන්න බැරි රහසක් එතැන තිබුණා. ... ඇත්තෙන්ම කියන්නට බැරි රහසක් නොවුණත් .... ප්‍රසිද්ධියේ කියන්නට බැරි ලැජ්ජ හිතෙන කාරණයක් ඒක. ... ඒ නිසා මම හැම විටම පෙළුනේ අතෘප්තිකර ආශාවකින්. මම එයා ළඟට: එයාගේ පහස අපේක්ෂා කරගෙන ගියාම ... එයා මාව ඉවතට තල්ලු කරනවා. ... එහෙමත් නැත්නම් නැඟටල ගිහින් වෙන තැනකින් නිදිය ගන්නවා. බොහොම වෙලාවලදී මම ඇගෙන් පහස ලැබුවේ බලහත්කාරයෙන් වගේ. මම හුඟක් දුරට ඉවසුවා. .... සමාජය ආශ්‍රයෙන් ඇත්ව හැදුන ගතිගුණ නිසා ඇයට මෙහෙම වෙලා ඇති'යි මම ඇතැම් වෙලාවට හිතුවා. ... කොහොම හරි එයාව හැඩගස්ස ගන්න ඕනේ. ... කියලත් හිතුව. සමහර දවස්වලට මම එයාව එක්කර ගෙන ගිහින් .... සමහර චිත්‍රපටි පෙන්නනවා. .... (නමුත් සර්... හරියටම ඕනැ කරන තැන්වලදී එයා අහක බලනවා. ... නැත්නම් ඇස් පියා ගන්නවා. ....) සමහර විට මේක අසනීපයක් කියල හිතා ගෙන වෙදකම් කෙරෙව්වා. ... ඒ එකකින් වත් පලක් වුණේ නැහැ. මගේ අසහනය එන්න එන්නම වැඩි වුණා. ... එක වෙලාවකට මට එයාගෙන් වෙන් වෙන්නට පවා සිතුණා. ඒත් එයාගේ කරුණාවන්ත සැලකිළිත් කීකරුකමත් නිසා ඒකත් අමාරු වුණා.

මේ ගැන මේ ලෝකෙ කෙනෙකුට කියන්න බැරි තත්ත්වයකයි මම පසු වුනේ .... සමහර වෙලාවකට මගේ අසහනය වැඩිවෙන කොට .... වේදනාව වැඩි වෙනකොට .... මගේ ජිවිතය නැතිකර ගන්නත් හිතුණා. ...

මුලදී, කන්තෝරුවෙ වැඩ ඉවරවුන ගමන්ම ගෙදර එන්න පුරුදුවෙලා හිටිය මම ටිකෙන් ටික ඒ ක්‍රමය වෙනස් කරල දඩාවතේ ඇවිදින්න වුණා. ...අතෘප්තිකර ආශාවන් මගේ සිත තුළ නලියන වේගය දවසින් දවස වැඩිවන බවත් මට දැනුණා. ...මට දැනුනෙ හරිම වේදනාවෙන්... ඒත් තෘප්තිය ලබන්න කල යුතු දෙයක් ගැන හිතා ගන්නට මට පුළුවන් කමක් තිබුණෙ නැහැ. ....

මම මේ හැම කරදරයක්ම නැති කරල සැනසීම සොයන්න හිතාගෙන මත්පැන්වලට පුරුදු වුණා. ... මම දවස ගානෙම බීගෙන ගෙදර ආවා. .... නොකා නිදියත් ගත්තා. ... ඒත් මට ගෙදර කිසිම වෙනසක් පෙනෙන්න තිබුණෙ නැහැ. ... සමහර දවස්වලට රෑට මම නින්දෙන් ඇහැරෙනවා. ... ඒ වෙලාවට එයත් මගේ ළඟ නිදි. ... මම නොදැනුවත් කමින් වගේ මගේ අත එයාගෙ ඇඟට උඩින් දමනවා. ... එයාට ඇහැරුනොත් අත පැත්තකට ඇද දාලා අනික් පැත්තට හැරිල නිදාගන්නව... ඒ වෙලාවට ඒකිගෙ බෙල්ල මිරිකල මරන්න මට හිතුන වාර අනන්තයි. ... ඒත් ටික වෙලාවක් යනකොට ඒ හැඟීමම අනුකම්පාවකට පෙරළෙනවා. ....

මම ටිකින් ටික ගෙදර ගත කරන කාලය අඩු කළා. ... ඒ වෙනුවට හැම තැනම බීම හල්වලට රිංගා ගෙන ... සැනසීම සොයන්න වුණා. ... ඔය අතරම දවසක් මම හොඳ

ගනනකට බීගෙන ඇවිත් ගෙදර යන්න හිතාගෙන ... බසයකට නැග්ගා. ... මම හිටියෙ කෙලින් ඉන්නත් අපහසු තත්වයකයි. ඒත් මට හොඳට කල්පනාව තිබුණා. ... බස් එක ඇතුලෙ එකම එක හිස් ආසනයයි තිබුණෙ. ... ඒ ආසනයේ අනෙක් කෙළවර හිඳගෙන හිටියෙ ගැහැණියක්. ... මමත් වැනි වැනි ගිහින් එතැන වාඩි වුණා. ... බසය ගියේ තරමක වේගයෙන්. ... බසය ඒ වේගයෙන්ම වංගුවලදී හරවන විට දෙදෙනාගේ සිරුර එකිනෙකට ගැටුණා. ටික වෙලාවකින් එයාගේ සිරුර මගේ සිරුරටම හේත්තු වෙලා තියෙන බවත් මට දැනුනා......

මගේ සිරුරත් නහර වැලුත් විනිවිද ගෙන යන .... අන්දමේ .... මට නුහුරු සුවයක්.... ඇගේ සිරුරේ උණුසුමින් ලැබෙන බවත් මට හැඟුණා. මගේ හිත තුල දුක් විඳින අතෘප්තිකර ආශාවන් යලිත් වේගයෙන් මතුවන්නට වුනා.... ඇගේ සිරුරින් ලැබෙන සුවය... ඒ මිහිර විඳීමේ ආශාවන් මටත් මොහොතකට හෝ ඇතිවුනා... මමත් ටිකින් ටික ඇගේ ඇඟටම හේත්තු වුනා... ඇගේ අත මගේ අත උඩින් වැටුනා... ඒ වේලෙහි මා ලද ආශ්වාදය මෙතෙකැයි කියන්න බැරි තරම්... මම එයාට ඕනෙ විදියට ඔහේ හිටිය.

අතර මහදී එයා මගේ අතින් අල්ලාගෙන බසයෙන් බහිමු කිව්වා.... අතෘප්තිකර ආශාවේ සීමාව ඉක්මවා සිටි මම ඇගේ කීමට අවනත වුනා... මගේ ජිවිතයේ රසවත්ම දවසත්... ඒ වගේම විනාශකාරී දවසත් එදා බව කියන්න පුළුවනි... ඇගෙන් ලැබූ පහස.... අතෘප්තිකර ආශාවේ දැවෙමින් සිටි මම එදා ඇය නිසා තෘප්තිමත් වුනා... එදා ඇගෙන් ලද පහස සිහිවන මොහොතක් ගානෙ මම ඇයව සොයාගෙන යාමට පුරුදු වුනා.. සමහර වෙලාවට ඇය ගෙදර නැති

වේලාවලුත් තිබුනා... ඒක ඇගේ රක්ෂාව.... එහෙම වෙලාවට මම වෙන කාව හරි සොයා ගෙන යන්න පුරුදු වුනා... මුලින්ම මට හමුවුන ඇගේ නම වාලටී... ටික කාලයකින් මට වාලටිල, මේබල්ලා, මේරිල... වගේ තවත් කොච්චරවත් අය හඳුනාගන්න ලැබුණා.

ඊට පස්සෙ මම ගෙදර ගැන ඒ තරම් තැකීමක් කළේ නැහැ. ... මගේ පාඩුවේ හිතේ හැටියට ජීවත් වෙන්න පුරුදු වුණා. ... දවසක් උණකුත් එක්ක මගේ යටි බඩ පෙදෙසේ ඉවසන්න බැරි තරම් වේදනාවක් ඇති වුණා. ... ටිකෙන් ටික ඒ වේදනාව උහුලගෙන ඉන්න බැරිතරම් වුණා. ... මම දවස් දෙක තුනක් බොහොම අමාරුවෙන් ගත කළා. ... බැරිම තැන මම බෙහෙත් ගන්න දොස්තර ළඟට ගියාම ... එයා මට ලියමනක් දීල ... ඕ.පී.ඩී. එකට යන්න කිව්ව. ... මම ඕ.පී.ඩී. එකට ආවේ හරිම බයකින්. ... ඒ මදිවට වේදනාව .... එතැනදී මාව පරීක්ෂා කල දොස්තර මහතා මට පැත්තකින් වාඩි වෙන්න කියලා ... ළඟ සිටි මිසිට කතා කළා .... නර්ස් ... ලෙඩාව වාට්ටුවට ඇතුල් කරගන්න කිව්වා.

මිසී මා දිහා බැලුවේ හරිම පිළිකුලකින්.... හරියට දවස් ගණනක් කුණුවෙච්ච මී කුණක් දිහා බලන්නා වගෙ... මට හිතා ගන්න බැහැ ඇයි එහෙම බැලුවෙ කියලා.... ටික වේලාවකින් ඇටෙන්ඩන්ට්ල දෙන්නෙක් ස්ට්‍රෙචරයක් තල්ලු කරගෙන ඇවිත් මට ඒකට නඟින්න කිව්ව... ස්ට්‍රෙචරයට නඟින්න තියා කෙලින් වෙන්නත් බැරි වේදනාවකිනුයි මම හිටියෙ ... මම නැඟිටින්නෙ නැතිව එහෙමම ඉඳගෙන ඉන්නවා දැක්කම .... එකෙක් බනින්න පටන් ගත්තා.

වනවරකම් කරන කොට අමාරු නැහැ.... දැන් එනවා මෙතැන අපිට වද දෙන්න... උඹලා මේ ලෝකෙ තියන්න හොඳ මිනිස්සු නොවෙයි. .... වනවර යක්කු .... රටේ ගෑණු ගාවට ගිහින් මේවා කර ගන්නෙ නැතිව .... දෙයියනේ කියලා කසාදයක් බැඳගත්තම මුන්ට පෙන ගහනවද .... ඒ යකා එක දිගටම කියා ගෙන ගියා. .... මගේ කේන්තියත් ඉහ වහා ගියා. .... ඒත් මගේ වේදනාවත් බැරිකමත් නිසා කරගන්නට දෙයක් නැතිව මම නිහඬ වුණා. ....ඇටෙන්ඩන්ට්ලා දෙන්නෙක් ඇවිත් මාව උස්සලා ස්ට්‍රෙචරය උඩට අත හැරියා. .... මගේ වේදනාව උහුලන්න බැරිව ගියා. ... මුන් ගෙන් වද විඳින්න ආවට වැඩිය හොඳයි ගෙදරට වෙලා ඉඳල මැරිල ගියා නම්... කියලත් මට හිතුනා. ....

ටික වේලාවකට පස්සෙ මට බැනපු ඇටෙන්ඩන්ට් ස්ට්‍රෙචරයක් තල්ලු කරගෙන මාව වාට්ටුවකට ගෙනියන්න පිටත් වුණා. .... මම යටිබඩ අල්ලගෙන වේදනාවෙන් ඇඹරුණා. ... හිටි හැටියේ ස්ට්‍රෙචරය නතර වුන බවත් දැනිලා ...මම යන්තම් ඔළුව උස්සලා බැලුවා... ස්ට්‍රෙචරය තල්ලු කරගෙන ආපු ඇටෙන්ඩන්ට් තවත් ගෑනු ඇටෙන්ඩන්ට් කෙනෙකු එක්ක කතාවට වැටිලා. ... ස්ට්‍රෙචරය නවත්වා ගෙන සිටියෙ අව්වෙ... උන්ට මා ගැන කල්පනාවක් නැතිව වගෙ.... වේදනාව වගේම සැර අව්වත් මා පීඩාවට පත් කළා. .... උන් දෙන්නා මොනවාද ගැන ටික වේලාවක් කතා කර කර උන්නා. ඊට පස්සේ ඒ ගෑණි යන්න හැරුනම ඇටෙන්ඩන්ට් ඒකිගෙ අත මිරිකල හිනා වුනා. .... ඒ ගෑණි මහ අසික්කිත විදියේ කාමුක බැල්මකින් ඇටෙන්ඩන්ට් දිහා බැලුවා. ... ඇටෙන්ඩන්ට් ආයෙත් හිනා වුනා. .... පස්සේ ගෑණිත් හිනා වෙලා යන්න ගියා...

ඇටෙන්ඩන්ට් ගැන මගේ හිතේ ඇති වුණේ වචනයෙන් කිව නොහැකි අන්දමේ පිළිකුලක්... ඌ මහ අවලමෙක් කියලත් මට හිතුනා... ඌ මා ගැන නොදැන ... මගේ යථා තත්ත්වය නොදැන, මට දොස් කීවාට වැඩි යමක් .... අවලම් ගතිගුණ ඇති ඒකා ගැන කතා කරන්න පුළුවන් කමක් මට ඇති බවක් හිතුනා. .... ඒත් මට කතා කරන්න ඕනෑ කමක් තිබුණෙ නැහැ. ... මට තිබුණෙ .... ඒ මිනිහා මා ගැන වැරදි විදියට හිතුව නිසා .... ඇති වුන පසුතැවිල්ලයි. කෙනෙකුගේ යථා තත්ත්වය නොදැන ... ඔහුව විවේචනය කිරීම මොන තරම් අසාධාරණද? ... කියා මට ඒ වෙලාවෙදි හිතුනා. ඒත්... එය තේරුම් නොගත් තවත් මිනිස්සු... අප වැනි අයව නින්දා අපහාසයට ලක්කොට... අප ඉදිරියේ වීරයින් වගේ හැසිරෙන අන්දම මට මැවී පෙනුණා. ... ඒ වන විට මට ඒ අය පිළිබඳව ඇතිවුණේ ඉවසන්නට බැරි කෝපයක්... මට මා ගැන කලකිරීමක් ඇති වන්නට වුණා. අවුරුදු ගණනක් මා තැවුණු අතෘප්තිකර ආශාවෙන් මිදී තෘප්තිය ලැබීමට ගොස් මා සතු වුන වේදනාවන් හා චිත්ත සන්තාපයන් සිහිවෙන කොට ... මෙලොව ජිවත් වීමේ ආශාව මා කෙරෙන් තුරන් වී ගෙන යන්නට වුණා. ... මේ ප්‍රශ්ණය මට පමණක් මූණ දීමට සිදුවූවක් ද.... එහෙම වෙන්න බැහැ. ..... මම වගේ මේ ප්‍රශ්ණයට මුහුණ දීපු තවත් අය කොච්චර වත් ලෝකයේ ඇති.... 'යි කියලා .... මම හිත හදා ගන්න උත්සාහ කළා.... එහෙත් ඒ උත්සාහයෙන් ඵලක් නොවන්න පුළුවන්....

මම වාට්ටුවේ නැවතිලා දවස් පහක් පමණ වුණා. ... ඒත් මගේ ගෑනි මාව බලන්න ආවේ මුල් දවසේ පමණයි. එදා මට හැදිලා තියෙන ලෙඩේ... මොකක්ද කියලා කාගෙන්

හරි දැන ගන්න ඇති. .... ඒක හැදෙන්නෙ කොහොමද කියලත් දැනගන්න ඇති.... එදා ඒකි මා දිහා බැලුවේ අප්පිරියාවෙන් වගේ.... ඒක දැක්කම මට තවත් ඉක්මණින් ජිවිතය නැති කර ගන්න හිතුණා. ... මට මේ වගේ දෙයකට මුහුණ දෙන්න සිදුවුණේ ඒකි නිසා බව .... ඒකි නිකන්වත් හිතුවෙ නැහැ. ... එක අතකට ඒ ගැණි මාව බලන්න නොඑන එකත් ලොකු දෙයක්.... ජිවිතය කියන්නේ වේදනාව.... පරාජය වගේ දේවල් වැඩියෙනුත් .... ජය....විනෝදය වගේ දේවල් අඩුවෙනුත් පවතින ලෙස නිර්මාණය වුන එකක්... මට තව එක තත්පරයක්වත් මෙලොව වශයෙන් ජිවත් විමට ආශාවක් නැහැ. ... මට වේදනාවකට ඉතුරු වෙලා තිබුණේ.... මට මුහුණ දෙන්නට සිදුවුන මෙම සිදුවිමේ සත්‍ය තත්ත්වය කිසි කෙනෙකුට කියා ගන්න බැරිවෙච්ච එක ගැනයි. ... ඒත් ඒ වේදනාවත් අද ඉවරයි. .... මම හිතන්නේ .... සර් ..... සර් හරි මාව හරිහැටි වටහා ගනියි කියලා....

වාට්ටුව දෙසින් ඇසුන සපත්තු දෑමුවකුගේ කඩිසර පියවර හඬින් දොස්තරගේ ආවර්ජනය නැවතුණි. ඔහු සුරතින් නළලේ තිබූ දහඩිය බින්දු කිහිපය පිස දැමුවේය. තම හදවතේ ස්පන්දනය ද වේගවත් වි ඇති ලෙසක් දොස්තරට දැනුණි. ඔහු තුළ සිල්වා පිළිබඳව ජනිත වී ඇත්තේ ශුභවාදී හැඟීමකි. ... සිල්වා අසරණ තත්ත්වයක සිටියත් .... ඔහුගේ ජිවිතයේදී ... බලාපොරොත්තු වූ අන්දමේ තෘප්තියක් ලැබිමේ වාසනාව ඔහු සතු වී තිබුණි. ඔහු තම ප්‍රශ්ණයන්ට තනිව මුහුණ දී පිළිතුරු සොයා ගත්තේය. කොතරම් වේදනා විඳ වුවද මිනිස්කමේ යථාර්ථය සුළු වශයෙන් හෝ දැන ගත්තේය. කොටින්ම තවත් මිනිහෙකුගේ වේදනාව .... වේදනාත්මක

ලෙසින් වටහා ගැනීමේ ශක්තිය ලැබුවේය. ... තමා සිල්වාටත් වඩා අන්ත පරාජිතයෙක් බැව් දොස්තරට සිතුණි. තමා තුළද ඇති රිදුම් දෙන වේදනාත්මක හැඟුම් පිළිබඳව ඇසීමට සුදුස්සා සිල්වාම බව දොස්තර තිරණය කළේය. තමාගේ පෞද්ගලික ජීවිතයේ වේදනාත්මක පැත්ත සිල්වා සමග පැවසීමෙන්, ඔහු සහනයක් ලබන්නට සිතුවා විය හැකිය. කෙසේ වුවද සිල්වාව අසාධ්‍ය රෝගී තත්ත්වයෙන් මුදවා ගැනීමට දොස්තර සියලු වෙර දැරීය.

කාමරය දෙසට එන පියවර හඬ වේගවත් විය. සර්.... සර්... නොම්මර පහේ ලෙඩාට අමාරුයි වගේ හරියට දඟලනවා. ... කාමරයට ඇතුලුවූ සාත්තු සේවිකාව කිවාය.

තවත් යමක් ඇසීමට නොසිටි දොස්තර එක් වරම තම අසුණින් නැගිට පියවර කිහිපයකින් ... සිල්වාගේ ඇඳ අසලට දිව ගියේ ය. ... දැඟලීමක් නොකර නිහඬව තිබෙන සිල්වාගේ රූප කාය ඇඳ අසලට යත්ම දොස්තර දුටුවේය. ඔහු ඉක්මණින් සිල්වාගේ අත අල්ලා ගත්තේ නාඩි වැටෙනු බැලීම පිණිස විය හැක. .... එහෙත් ..... ඒ වනවිටත් සිල්වාගේ ප්‍රාණය නිරුද්ධ වී තිබුණි.

# 12

# අවබෝධය

සැඳෑ අඳුර සිරිදාසගේ කුටිය වැළඳගත් හෙයින් ඔහු මේසය මත තිබුණ විදුලි ලාම්පුව දැල්විය. ඉන් නික්මුන මඳ ආලෝකයෙන් අඳුර තුනී විය. මේසය මත ගොඩ ගැසූ පොත් රැසක සෙවනැල්ල විහිදු ගොස් බිත්තියේ එල්ලා ඇති සිරිදාසගේ මංගල දිනයේදී ගත් ඡායා රූපයෙහි අඩක් වසා ගෙන තිබුණි. සිරිදාසගේ බිරිඳගේ රුව සහිත පෙදෙස එම සෙවනැල්ලෙන් අඳුරු විය. රෑ කෑම සූදානම් කිරීමට යසෝමා පිහන් සෝදන හඬ සිරිදාසගේ කන වැකුණි

යසෝමා සිරිදාසගේ බිරිඳය. ඔහු මෙතෙක් වාඩි වී සිටි පුටුවෙන් නැගිට ගොස් කාමරයේ දොර ඇරියේ ය.

ආලින්දයද අඳුරින් වැසී ඇත. ආලින්දයේ විදුලි ලාම්පුව දැල්වීමට ඔහු අදහස් කරනවාත් සමගම ඉදිරිපස නිවසේ ආලින්දයේ විදුලි ලාම්පුව දැල්වුණි. සිරිදාසගේ ආලින්දයේ අඳුරද දුරුකරමින් පැමිණි එම ආලෝකය සිරිදාසගේ කාමරය

තුලටද ගලා ගොස් තිබුණි. ඔහු ආපසු හැරී ගොස් ඉදිරිපස නිවස පෙනෙන අයුරින් තබා තිබූ පුටුවෙහි වාඩි විය.

කාමරයෙන් අඩක් හොඳින් ආලෝකවත්ව ඇත. මෙම ආලෝකයෙන් කාමර තුළ ඇති බොහෝ දේ ඔහු දැක ගත්තේ ය.

මේසය මත තිබූ අළුත්ම නවකථා පොත අතට ගත් ඔහු එය කියැවීමට සැරසුණි. එය ආදර කථාවකි. ඉදිරිපස නිවසින් විහිදුන විදුලි ආලෝකය ආලින්දයේ සිටි ඔහුට කියැවීමට උපකාරී විය.

ඉදිරිපස නිවස දෙසින් විහිද ගිය සෙවනැල්ලක් සිරිදාස මත වැටී - ඉන් ඔහුව වැසී ගියේය. එම සෙවනැල්ල සිරිදාසගේ කාමරයටද පිවිස තිබුණේය. ආදර කථාව කියැවීමට සිරිදාසට ආලෝකය මඳ විය. ඔහු හිස ඔසවා ඉදිරිපස බැලිය. මාලිකා ඇගේ මෑණියන්ද සමඟ ඔවුන්ගේම දොරකඩ සිටියාය. සිරිදාස හිස ඔසවා බලත්ම මාලිකා සිනහසුනාය. ඔහුද ඇය හා සිනහසුණි.

ගෙය තුළ කිසිවක් වේගයෙන් පෙරැළෙන හඬක් සිරිදාසට ඇසුණි. එය කුමක්දැයි නැඟිට ගොස් බැලීමට ඔහුට ඕනැවිය. එහෙත් නැඟිට යෑමට ඔහුගේ සිත ඉඩ දුන්නේ නැත.

ආලින්දය ඔස්සේ හමා ආ සුළං දහර ඔහු අත තිබූ පොතෙහි පිටු එක පිට එක පෙරැළිය. මාලිකාව දකින විට තම සිත මෙතරම් සසල වන්නේ ඇයි දැයි සිතා ගැනීමට සිරිදාසට නොහැකි විය. මාලිකාගේ කෙළිලොල් පැවැත්ම

ඔහු ප්‍රිය කළේය. ඇයගේ දක්ෂකාරී බැල්ම විසින් ඔහුගේ හැඟීම් කුප්පවනු ලැබීය. එබැවින් ඔහුගේ සිත මැලිකා දෙසට ඇදී යෑම නවතා ගැනීමේ අවශ්‍යයතාවයක් සිරිදාස තුළ ඇති නොවුණි.

ආලින්දය ඔස්සේ හමා එන සුළං රැල්ලට අසුවී අතරමං වුන සමනළයෙකු විත් සිරිදාසගේ මුහුණෙහි හැපුණි. ඔහු එක්වරම තිගැස්සී ගිය නමුදු, යලි ශාන්ත විය. සමනළයා බිත්තිය හැඩ කිරීමට තබා තිබූ කඩදාසි මල් ගොඩෙහි වැසුවේය. ටික වේලාවකින් ඌ ඉන් ඉවත්වී ඔබ මොබ පියාඹන්නට විය.

සිරිදාස සමනළයා දෙස ඕනෑ කමින් බලා සිටියේ ය. ඔබ මොබ පියාඹා වෙහෙසට පත් වූ සමනළයා බිත්තියෙහි රැඳුණි. මඳක් එසේ රැදී සිටි සමනළයා අනතුරුව ඉන් ඉවත් වී විවරව තිබූ ජනෙල් කවුළුව ඔස්සේ පිටතට පියැඹීය.

සිරිදාසගේ මුවගට සිනහවක් නැඟුණි.

යසෝමා කාමරය තුළට ආවාය. සිරිදාස නිසොල්මන් විය. ඇය ආපසු මුළුතැන් ගෙය දෙසට ගියාය. සිරිදාස යසෝමා ගැන සිතුවේය. ඇගේ අහිංසක බව ඔහුට සැනසීමකි. එහෙත් තමන් ප්‍රිය කරන කලාකාමී දිවියට ඇගෙන් අනුබලයක් නොවීම, ඔහුගේ මනස්තාපයට හේතු විය. ඇතැම් අවස්ථාවලදී ඔහු අගය කළ පොත් පත් පිළිබඳව මාලිකා විසින් කළ වර්ණනාවන් ඔහුට කර්ණ රසායනය විය. ඇයගේ දක්ෂකාරී බව ඔහුගේ සිතට නුහුරු කුතුහලය මුසු සුවයක් දැනවීය.

ඕනෑම මිනිහෙක් තමන් ආශා කරන දේ තිබෙන තැනට යෑමට උත්සාහ කිරීම ස්වාභාවික දෙයක් බැවි ඒ වනවිට

සිරිදාසට හැඟී ගොස් තිබුණි. තම කලාකාමී ජීවිතයට යසෝමා උදව් කරනවා නම් ඇතිවන සතුට කොපමණ විය හැකිදැයි ඔහු තනිවම සිතුවේය.

යසෝමා කෙරෙහි කළකිරීමක් සිරිදාස තුළ ජනිතවෙමින් ඇත.

සිරිදාස විසින් ලියන ලද කෙටිකතා කිහිපයක් මේසය මත විසිර තිබුණෙන්, ඔහු ඒවා එකලස් කරන්නට විය.

යසෝමා තේ එකක් ද රැගෙන සිරිදාස වෙත පැමිණියා ය. අඩවන් වී ඇති දොරත් එය තුලින් පෙනෙන මාලිකාගේ රුවත් ඇය දුටුවාය. මාලිකා නෙත් පිය නොහෙලා සිරිදාස දෙස බලා සිටින ලෙසක් යසෝමාට හැඟුණි. සිරිදාසගේ මුව පුරා තිබූ කනස්සලු සහගත ස්වරූපයත් ඇය ඒ අතරින් දැක ගත්තාය.

යසෝමාගේ සිත නුහුරු බියකින් පිරී යන්නට විය. සිරිදාසගේ කනස්සල්ලත්, ටික දිනෙක පටන් ඔහු තමා කෙරෙන් ඉවත් වන බවත් යසෝමා තේරුම් ගෙන තිබුණාය. දැන් දැන් මාලිකාව ඇයට පෙනෙනුයේ මාර දූතියක ලෙසිනි. යසෝමා සිරිදාස වෙත ගොස් තේ එක දිගු කළාය.

ඔහොම තියන්න.... මම පස්සේ බොන්නම්...යි කියමින් සිරිදාස පුටුව මත හරිබරි ගැහුණේය.

යසෝමා හට ඇගේ හදවත වේගයෙන් ගැහෙන බවක් දැනෙන්නට විය. ඇය සිරිදාස වාඩිවී සිටි පුටුව ඇන්දේ වාඩි වී සිරිදාසගේ කරට අත දැමුවාය. මොහොතක දිගු නිහැඬියාවක් පැවතුණි. සිරිදාස තම හිස පහතට නැඹුරු කරගත් ගමන් පසුවිය.

එක්වරම පුටු ඇන්දෙන් නැඟි සිටි යසෝමා සිරිදාසගේ පොත් මේසය වෙත ගොස් - ඒ මත වූ පොත් ගොන්නක් ඔසවා ගෙන සිරිදාස වෙත පැමිණියාය.

සිරි... මටත් බලන්න හොඳ ලස්සන පොතක් තෝරල දෙන්නැ'යි ඇය තම මුව මත නඟාගත් මඳ හසරැල්ලකින් යුතුව කීවාය.

සිරිදාස මවිත වූවෙකු ලෙසින් ඇ දෙස හිස ඔසවා බැලුවේය. යසෝමාගේ සෙනෙහෙබර මුහුණ ඔහුට පෙනුණි. ඈ බයාදු ගතියකින් මුසු සිනහවකින් යුතු වූවාය. සිරිදාස මොහොතකට අන්ද - මන්ද විය.

මේසය මත තිබූ පොත් ගොඩ ඉවත ගත් බැවින්, එහි සෙවනැල්ලෙන් අඳුරු වී තිබූ සිරිදාසගේ මංගල ඡායාරූපය මත ආලෝකය වැටී සමසේ විසිර ගොස් තිබුණි. අදහාගත නොහැකි ආකාරයේ විවිධ සිතුවිලි වලින් සිරිදාසගේ හදවත තෙරපෙන්නට විය.

යසෝමා කාමරයේ ලොකු විදුලි බුබුල දැල්වූවාය. කාමරය ඒකා ලෝක විය. ඇය හඬ නගා සිනහසුනාය. සිරිදාසද හඬ නඟා සිනහසුණේය. ඔවුන්ගේ සිනහ හඬ ආලින්දය ඔස්සේ විසිර යද්දී - මාලිකා දොර වසාගෙන ගෙට ගියාය. සිරිදාස ද හුන් තැනින් නැඟිට ගොස් ඉදිරිපස දොර වැසුවේ යසෝමාගේ අත තදින් අල්ලා ගෙනය.

(දවස පුවත්පත් ආයතනය විසින් - කිවිපති විමලේන්ද්‍ර චතුරේගම කිවියාණන්ගේ කර්තෘත්වය යටතේ පවත්වාගෙන යනු ලැබූ "ප්‍රියාවී" පත්‍රයේ 1979 සැප්තැම්බර් මස 21 - 27 (සතියට නියමිත) කලාපයෙහි මෙම කෙටි කථාව පළකරනු ලැබිය.)

# 13

# සිංහල අළුත් අවුරුද්ද !

බක් මාසය සිංහලයන්ගේ උත්සව සමයයි. අළුත් අවුරුදු උදාවත් සමග, සංස්කෘතික ගුණාංගයන් ගෙන් පිරුණු වත් පිළිවෙත් සපුරමින් සැණකෙළි පවත්වමින් ඔවුහු විනෝද වෙති. මෙම උත්සව කටයුතුවලදී නක්ෂත්‍රය මූලික අංගයක් විය. අදාල නක්ෂත්‍ර කටයුතු සූදානම් කර - ජනතාවට ඒවා ඉදිරිපත් කිරීම රාජකීය දෛවඥයාගේ හා රාජකීය වෛද්‍යවරයාගේ කාර්යය විය.

බක්පුර පැළවිය ආසන්නයේදීම මීනයෙන්, මේෂයට සූර්යයාගේ සංක්‍රාන්තිය සිදු වන්නේය. ලෝක පාලකයන් ලෙස සැලකූ හිරු සඳු දෙදෙනා ගෙන් යෙදුන ක්‍රියාවලිය තුල ඒවාට අනුගත වෙමින් තම තමන්ගේ ජීවිත හා ගොවිතැන් බත් කිරීමේ, කටයුතුද අළුත් කර ගනිමින් ජීවන රටාව සකස්කර ගැනීමට මෙරට ජනතාව චිරාත් කාලයක සිට පුරුදු වී ඇති අතර එය අද දක්වාමත්, පරම්පරාවෙන්

පරම්පරාවට අවිච්ඡින්නව ගලාගෙන විත් ඇත. වර්තමානයේ ජීවත්වන අප විසින් ද, එම සංස්කෘතික ගුණාංගයන් නිවැරදි අයුරින් පරිහරණය කරමින් අනාගත පරපුරටද දායක කළ යුතුව ඇති බැවින්, එවන් සංස්කෘතික ක්‍රම වේදයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව, ඒවා ක්‍රියාවට නැංවීම වැදගත් වන්නේය. එසේ නොවන්නේ නම් ශේෂවනුයේ මුළාව පමණි.

අතීතයේ විසූ අපගෙ මුතුන් මිත්තන් හට රෝම කැලැන්ඩරය හෝ ඔරලෝසුව නොතිබුණි. එවන් සමයක පවා ඔවුන් සතුව භාවිතා කළ දින මානයන් හා කාල මානයන් විය. ඔවුන් සතු පාරම්පරික ක්‍රමයේ වර්ෂාරම්භය සිදුවූයේ බක් පුර පැලවියෙනි. ඔවුන්ගේ මාස ක්‍රමය, චන්ද්‍ර මාස ක්‍රමය වූ අතර දින ක්‍රමය වී ඇත්තේ තිථියයි. එදා සිට අද දක්වාත් නක්ෂත්‍රීය කටයුතුවලදී භාවිතවනුයේ මෙම ශාස්ත්‍රීය ක්‍රමවේද යයි. වර්තමානයේ ඇතැමුන් ඔරලෝසුව හා රෝම කැලැන්ඩරය, පැරණි ශාස්ත්‍රීය ක්‍රමවේදයන් සමග පටලවා ගනිමින් අවුලෙන් අවුලට පත්වී සිටිනු නිරන්තරයෙන් දැකිය හැකිය.

පාරම්පරිකව මුතුන් මිත්තන්ගේ ඇසුරින් අධ්‍යයනය කළ ශාස්ත්‍රීය වේදාංගයන් අපගේ ගුරුවරුන් විසින් අපහට ඉගැන්වූයේ ද, එදා ඔවුන් තම ගුරුවරුන් ඇසුරින් ශිල්ප ශාස්ත්‍රයන් උගත් ආකාරයෙන්මය. එය පරපුරෙන් පරපුරට පැමිණි හෙවත් පාරම්පරික ක්‍රමය විය. එදා අප ගුරුන් ඇසුරින් අධ්‍යයනය ලබද්දී - දවස - මාසය හා කාලය පිළිබඳව ඉගෙන ගත්තේ මෙසේය.

දවසට සැට පැයක
දිවා රෑ යන නියමෙක
අට දිනක් පෝයෙක
පෝය සතරක් වේය මාසෙක
මාස දොළසක් වූ
දින තුන්සිය හැටක් වූ
අට සාලිසක් වූ
පෝය දිනවල් මේය දැක්වූ

මේ අනුව චන්ද්‍ර මාසයත්, එය තුළ පෝයටත් ලබාදී ඇති වැදගත්කම මැනවින් කැපී පෙනෙයි. පෝය යනු කුමක්ද? එම දිනයන් එසේ වෙන්කිරීමට හේතු කවරේදැයි ඉගෙනීම වෙනත් අවස්ථාවකදී සිදුකළ යුතුය.

මෙහිදී අප සළකා බැලීමට උත්සුක වනුයේ සිංහලයාගේ අළුත් අවුරුද්ද උදාවීම හා එය හා බැඳී පවතින චාරිත්‍ර ක්‍රම වේදයන් පිළිබඳව පමණක් බව සඳහන් කළ යුතුව ඇත්තේය.

ශාස්ත්‍රිය ක්‍රම වේදයන් අනුව අළුත් අවුරුදු සංවත්සර පත්‍රය සැකසීමේදී එම වසරෙහි රාජාධිපතියා වනුයේ, බක් මස පුර පැලවිය තිථිය උදාවන දවසෙහි අධිපති ග්‍රහයා ය. සූර්‍ය්‍ය මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රාන්තිය වන දවසේ අධිපතියා මන්ත්‍රියාධිපතියාය. මෙයට අමතරව හිරු කටක රාශි ගතවන දිනාධිපතියා - ශශපාධිපති යනුවෙන් ද හිරු තුලා රාශියට සංක්‍රාන්ති වන දවසෙහි අධිපතියා රසාධිපතියා වශයෙන්ද යනාදී ක්‍රමයෙන් ඒ ඒ අධිපතියන් නම් කරනු ලබයි.

මෙහිදී රාජාධිපතිකම ලබා දී ඇත්තේ බක් පුර පැලවිය තිථිය උදාවන දවසේ අධිපති හට බව අමතක නොකළ යුතුය. එහිදී විශේෂත්වයක් දක්වා ඇති බව පැහැදිළිය.

සූර්යයා මීන රාශියෙහි අවසානයේ සිට මේෂ රාශියට සම්ප්‍රාප්තවීම දක්වන, සංක්‍රාන්ති කාලය තුළ - ලිත් පැය තිස් දෙකක් පුණ්‍ය කාලය වශයෙන් දක්වා තිබෙයි.

අමාවක තිථිය හා යෙදෙන නාග කරණය තුළ - උදාවන අවසන් නවාංශකය ගත කිරීමට චන්ද්‍රයාහට ලිත්පැය දහසයක් ගතවෙයි. එය අවසානයේ පුර පැලවියට යෙදෙන කිංතුග්න කරණය හා මුල් නවාංශකයෙහි චන්ද්‍රයා තවත් ලිත් පැය දහසයක් ගත කරනු ලබයි. අතීතයේ සඳු අමාවක යෙහි අවසන් නවාංශකය තුළ සිටින කාලය පූර්ව පුණ්‍ය කාලය ලෙසත් පැලවියෙහි මුල් නවාංශකය තුළ සඳු ගත කරනු ලබන පැය දහසයක කාලය අපර පුණ්‍ය කාලය වශයෙනුත් යොදාගෙන ඇත. අශුභ කරණයක් වන නාග කරණය හා යෙදෙන පූර්ව පුණ්‍ය කාලය තුලදී සියළු වැඩ කටයුතු අත්හැර දමා පුණ්‍ය කර්මයන්හි යෙදෙන ජනතාව අපර පුණ්‍ය කාලය තුලදී නව වසර සඳහා අළුතින් කටයුතු අරඹන්නේය. පාරම්පරික චාරිත්‍රය එයයි.

එහෙත් පසු කාලයේදී මෙරට ඇතිවූ සූර්ය වංශික රජවරුන්ගේ බලපෑම යටතේ ශක වර්ෂය හිස ඔසවා ඇත. ඒ අනුව සූර්යයා මීන රාශියෙහි අවසානයේ ලිත් පැය දහසයක් පූර්ව පුණ්‍ය කාලය ලෙසද - මේෂ රාශියට එළැඹ ලිත්පැය දහසයක් අපර පුණ්‍ය කාලය ලෙස ද වත්මන් නැකත් කරුවන් විසින් සළකනු ලැබේ. ඒ අනුව අපර පුණ්‍ය කාලයට

අයත්වන දහසය පැය ඉක්ම යන්නට පෙර ශුභ මොහොතකදී අළුත් අවුරුද්ද සඳහා සියළු කටයුතු ආරම්භ කිරීමට පෙර ඇති නියමය අද දවසේ බොහෝ දෙනෙකු විසින් අධ්‍යයනය නොකර, එම පුණ්‍ය කාලය තුල කේන්ද්‍ර කුණ්ඩලියක් සකස් කර ගනිමින් ඒවා තුල පවතින ග්‍රහ පිහිටීම් අනුව යෙදෙතැයි කියනු ලබන ශුභා ශුභ පිළිබඳව නිරර්ථක වාද විවාද වල යෙදෙනු දක්නට හැකිය.

මෙය ශාස්ත්‍රීය නොවන අභාග්‍ය සම්පන්නවූ තත්ත්වයකි. මෙවන් පසුබිම් තුළ මෙරට ජනතාව, අවුරුදු සිරිත් - සංස්කෘතික ගුණාංගයන් හා නක්ෂත්‍රීය කටයුතු පිළිබඳව ගුණාත්මක ආකල්පයන් ගෙන් මිදී පිරිහී යාමට ඉඩ ඇත. එසේ වීමට ඉඩ හැරීම තුල, අප අතර චිරාත්කාලයක් පැවති සාර ධර්මයන්ද විනාශ මුඛයට පත්වීම නොවැලැක්විය හැකිය. එය ජාතික වශයෙන් මුළු මහත් ජාතියේම විනාශයට හේතු පාදක විය හැකි බැවින් - එවන් තත්ත්වයක් ඇති නොවීම පිණිස කටයුතු කිරීම නක්ෂත්‍රීය වේද වේදාංගයන් හදාරා එවැනි කටයුතුවල නිරතවන කාගේත් ඒකායන අරමුණ විය යුත්තේය.

අපගේ පූර්වාචාරීන් වහන්සේලා - අළුත් අවුරුදු එලාඑල - කථනය උදෙසා භාවිතයට ගනු ලැබුයේ බක් මස පුර පැලවිය උදා මොහොතෙහි තත්කාල කේන්ද්‍රය මිස, සූර්‍ය්‍ය සංක්‍රාන්තියට අනුව අපර පුණ්‍ය කාලය තුලදී අළුත් අවුරුද්දට වැඩ අරැඹීමට ගන්නා හෝරාවෙහි යෙදෙන තත්කාල කේන්ද්‍රයක් නොවේ. අපර පුණ්‍ය කාලය ගතවීමට පෙරදී ශුභ හෝරාවක් තුල කටයුතු අරඹන්නට නියම කොට ඇත්තේද එබැවිනි.

බක් මස පුර පැලවිය දවසෙහි දිනාධිපතියා - එම වසරෙහි රාජාධිපතියා ලෙස සළකමින් - සූර්‍ය්‍යා, මීනයෙන්

මේෂයට සංක්‍රාන්ති වන දවසේ - අපර පුණ්‍ය කාලය තුලදී - රාජධිපති ග්‍රහයාගේ හෝරාව - පංචමය - රජතුමාගේ ජන්ම පත්‍රය - එදින බලවත්ව සිටින ග්‍රහයාගේ හෝරාව හෝ යොදා එළැඹෙන ශුභ කාලයන් අනුව රාජකීය දෛවඥයා විසින් ශුද්ධකර දක්වනු ලබන ශුභ කාලය තුලදී අළුත් අවුරුද්දට වැඩ ඇරඹීම පසු කාලීනව ඇතිවූ සම්ප්‍රදායික ක්‍රමය වී තිබේ. මෙම කටයුත්තෙහිදී රාජකීය දෛවඥයාත් රාජකීය වෛද්‍යවරයාත් ප්‍රමුඛත්ත්වය ගෙන කටයුතු කර ඇති අතර - රජතුමා ඔවුන් විසින් කරනු ලබන අනුශාසනයන් අනුව කටයුතු කර ඇති බවත් ඉතිහාසයෙන් දැකිය හැකිය. රාජකීය දෛවඥයා විසින් ශුද්ධ කර දුන් ශුභ මොහොතෙහි දී - රජතුමන් සියළු රටවැසියන් හා එක්ව, එකම අවස්ථාවකදී අළුත් අවුරුද්දට කටයුතු ඇරඹීමේ උත්සවය, සිංහලයන් සතු මාහැඟි සංස්කෘතික ලක්‍ෂණයකි. මෙවන් තත්ත්වයක් ලොව අන් කවර ස්ථානයකවත් නොමැති බව සමාජ විද්‍යාඥයින් පවසති.

අතීතයේ මෙරට වැසියනට රාජකීය දෛවඥයා දුන් ශුභ මොහොතින් අළුත් අවුරුද්දට කටයුතු ඇරඹීමේදී, ශුභ මොහොත පිළිබඳව තර්ක විතර්ක හෝ ගැටළු ඇතිවූ බවක් පැහැදිලි වනු නොපෙනේ. ඒ එසේ වීමට හේතුව එවකට රාජකීය දෛවඥයා හැරුණකොට වෙනත් දෛවඥයින් නොසිටි නිසා යැයි නොසිතිය යුතුය. කොපමණවත් දෛවඥයින් මෙරට සිටින්නට ඇත. ශාස්ත්‍රීය නියමයන් පරිදි අපර පුණ්‍ය කාලය තුළ - ශුභ හෝරා පංචමාදිය පදනම්කර ගනිමින් රජුගේ ජන්ම පත්‍රය කේන්ද්‍රකර ගනිමින් ශුභ හෝරාව රාජකීය දෛවඥයා විසින් සකස්කර තිබීම හේතුවෙන් ඔවුනොවුන්

අතර විවිධ මතවාදයන් පැන නොනැගීමට හේතු වූවා විය හැකිය.

කෘෂි ආර්ථික ක්‍රමවේදයක දායකයන් වූ අපගේ මුතුන් මිත්තන් හට, මහ පොළොවත් හිරු හා සඳුත් ආරක්ෂකයන් වූහ. සඳුගේ වාරයෙන් යෙදුන රාජාධිපතින් - හිරුගේ වාරයෙන් යෙදුන මංත්‍රියාධිපතිත් ඒක රාශි කරගනිමින්, ඉන් ලැබෙන බලය අළුත් අවුරුද්ද මුළුල්ලේම ක්‍රියාත්මකව පවත්වා ගැනීමේ අරමුණින් යුතුව, පූර්වාචාරීන් විසින් අනුගමනය කර ඇති ශාස්ත්‍රීය ක්‍රම වේදයන් අපගේ මුතුන් මිත්තන් විසින් ද ක්‍රමවත්ව, අඛණ්ඩව පවත්වා ගනිමින් නූතන පරපුරෙහි සාමාජිකයින් වන අපහට ද දායාද කර දී තිබේ. එවන් සාරධර්ම හා සංස්කෘතික ගුණාංගයන් මතු මතුත් ආරක්ෂා කර ගනිමින් පවත්වාගෙන යෑම අප සැමගේ ඒකායන අරමුණ විය යුත්තේය. අපගේ යුතුකම ද එයයි.

අළුත් අවුරුද්දේ ශුභ මොහොතින් වැඩ ඇල්ලීම යනු එම වසර සඳහා කටයුතු ඇරඹීමයි. කළ යුත්තේ එතැන්සිට ක්‍රියාත්මක වීමයි. පැරණි ක්‍රමයද එයම වෙයි.

එහෙත් අද දවසේ ඇතැමුන් රැකියා සඳහා පිටත්ව යෑමටද වෙනම නැකත් දෙති. එහි වරදක් නැත. එහෙත් එවන් වේලාවක් සැකසීම නක්ෂත්‍රීය සිද්ධාන්ත පදනම් කොට ගෙන සිදුවිය යුතුය.

එවන් අවස්ථාවකදී ශාස්ත්‍රීය ක්‍රමවේදයන් විනා - ප්‍රායෝගික යැයි කියමින් වැරදි මඟ නොයා යුතුය. 2004 දී අමාවක - සූර්යග්‍රහණය පැවති දිනක, නව වසරේ

රැකියාවන් සඳහා පිටත්ව යැමට නැකත් වශයෙන් සංස්කෘතික අමාත්‍යාංශයේ නැකත් කමිටුව විසින් වේලාව ලබාදී තිබුණ බව මෙරට ජනතාවට අමතක විය නොහැකිය. සිදුවී ඇති වරද, හමුවෙහි එවැනි වේලාවක්, ශුභ වේලාවක් වශයෙන් දැක්වූ අය, ශ්‍රව්‍ය - දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ පැවති සංවාදයකදී - කරුණු පැහැදිලි කරමින් මෙරට ජනතාවට දැක්වූයේ, රජයේ හා පෞද්ගලික ආයතනවල සේවය කරනු ලබන සේවකයින් දින හතක පමණ නිවාඩු කාලයකට පසුව, නැකත් තිබුණත් නැතත් ඔවුන් සේවයට යන බවත්ය. එවැනි පසුබිමක් තුළ ප්‍රායෝගික වීමේ අවශ්‍යයතාවය මත සුයනීග්‍රහණය පවතිනු දකිමින්ම, නව වසරෙහි දී රැකියාවට පිටත්ව යැම පිණිස මෙවැනි දවසක්, ශුභ දිනයක් ලෙසින් ලබාදුන් බවය.

ශාස්ත්‍රීය ක්‍රම වේදයන් වන සිද්ධාන්තයන් එකකි. ප්‍රායෝගික වීම යනු අනෙකකි. රටක ජනතාවගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමට ඉදිරිපත් වන්නවුන් මෙවැනි හාසෝත්පාදක අයුරින් ක්‍රියා නොකළ යුතුය. එහෙයින් ඔවුන් ලබන්නාවූ මෙම අළුත් අවුරුද්දේදී හෝ නිවැරදි මඟට පිවිසිය යුතුව ඇත.

ජාතික සංස්කෘතිය හා චාරිත්‍ර වාරිත්‍ර රැකිමට නම් ජනතාව ඒවා පිළිබඳව දැනුවත් විය යුතුය. නිසි දැනුමින් යුතුව ඒවා පරිහරණය කළ යුතුය. එවිට විරාත් කාලයක් අප සතුව තිබූ ශ්‍රේෂ්ඨ ගුණාංගයන් ගෙන් පරිපූර්ණ වූ සිරිත් විරිත් හා සංස්කෘතික ලක්ෂණයන් අනාගත පරපුරටද දායාද කිරීමේ හැකියාව සැළසෙනු ඇත. නිරන්තරයෙන්ම අපි කැපවිය යුත්තේ ඒ සඳහාය.

# 14

# ජ්‍යොතිෂය යනු

ජ්‍යොතිෂය වෛද්‍යකම වැනි දේ කවදා - කවුරුන් විසින් කොතැනකදී සොයා ගත්තේද යන්න කිසිවෙකු හටත් පැවසිය නොහැකිය. මිනිසාගේ පරිනාමයේ ආරම්භයේ සිටම ඒවාද විකාශනය වෙමින් පැවත එන්නට ඇති බව නම් සිතිය හැකිය. කෙසේ වෙතත් ජ්‍යොතිෂය වැනි ශාස්ත්‍ර ඥානය ලැබීම පිණිස අපට ලැබුණ පාරම්පරික දැනුම හා බද්ධව තිබෙන ක්‍රමවේදයන් ඇසුරින් දැකිය හැකි පැහැදිලි කරුණු නම් ස්වකීය සිත් දියුණු කිරීම තුලින් අධ්‍යාත්මික දියුණුවක් ලැබූ ඍෂිවරුන් වශයෙන් හැඳින්වුන බුද්ධිමත් පූර්වාචාරීන් පිරිසක් විසින් මෙම ශාස්ත්‍රයන් පිළිබඳව ලොවට හෙළිකළ බවය. ජ්‍යොතිෂය හැදෑරීමේදී එවැනි ඍෂිවරුන් දසඅට දෙනෙකුගේ නම් අපට හමුවෙයි. එසේ තම තමුන් දියුණු කරගත් අධ්‍යාත්මික චිත්තයන් ඔස්සේ දැකගත් කරුණු අනුව මෙසේ සඳහන් කර ඇති බව දැකිය හැකිය.

ග්‍රහයින්ගේ ගමන අන්‍යොන්‍ය මිශ්‍රය. එබැවින් වෙනම ග්‍රහ ඵලයන් නිශ්චිත කිරීම විපර්‍යය වේ. ජිවිත කාලය මනින

ආයුෂ ද, ලෝක ජනයන්ගේ සුඛ දුක්ඛ මාර්ග සිහි කිරීමද මේ ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙහි ඇති ප්‍රයෝජනයන් වෙයි.

විශේෂයෙන් කලියුගයේ හීන බුද්ධි ඇති මනුෂ්‍යයින් සත්‍ය අනාවැකි කීමෙහි සමර්ථ වෙත්ද? නොවෙත්මය. නෂ්ධ වස්තු ආදියෙහිද, ද්‍රේකාණ, සප්තාංශක ආදි ඔවුන්ගේ ඵලයන්හි දැනීමේ සමර්ථ නොවෙති. ව්‍යාකරණාදිය දත් පණ්ඩිත තෙම ගුරු මුඛයෙන් ප්‍රකාශ කරන ලද මේ ශාස්ත්‍රය අසන්නේය. පරම්පරාවෙන් මේ ඥාන පරිපාක කාලය පැමිණියේ මේ ශාස්ත්‍රයේ විශාල බුද්ධිමතෙක් වේ.

මේ පැරණි ගුරු උපදේශයන්ය.

ජ්‍යොතිෂය යනු කුමක්ද? ඇතැමෙකු ජ්‍යොතිෂය යනු දිලිසීමය. ආලෝකයය යනුවෙන් විග්‍රහ කරති. එය 'ජ්‍යොතිෂය' යන වචනය පිළිබඳව කරන පැහැදිළි කිරීමක් නම් නොවන්නේය.

ජ්‍යොතිෂය යන්නට විවිධ නම් භාවිතා වී ඇති අතර එය 'කාල විඥාන' ශාස්ත්‍රය වශයෙන් පාරම්පරික ශාස්ත්‍රවේදීන් විසින් භාවිතා කරනු ලැබූ බවත් පැහැදිළිය.

ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙහි ගැබ්ව ඇත්තේ - අවකාශය හා කාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඥාන දර්ශණයයි.

අවකාශ කුහරය තුල, ආපෝ -තේජෝ - වායෝ - පඨවි නම් භූත තත්ත්වයන්ගේ හා කාල, දිග්, මනස්, ආත්ම, හැසිරීම් හා ක්‍රියාවලියන් හඳුනා ගැනීමට හා එමගින් මිනිසාගේ හා සත්වයාගේ පැවැත්මට උපකාරී වන අයුරින් ඒවායේ ප්‍රයෝජනය ලබා ගැනීමට මඟ පෙන්වන ශාස්ත්‍රයයි.

ආපෝ භූතයාගේ ගමන ඉහල සිට පහලට වන අතර තේජෝ භූතයා පහල සිට ඉහලට ගමන් කරයි. වායෝ භූතයා තිරස් අතට ගමන් ගනී.

පඨවි භූතයා විසින් පෙරකී භූත තිදෙනා හා ගැවසෙමින් විවිධත්වයෙන් යුතුව ක්‍රියාත්මක වෙමින් ස්කන්ධයන් නිපදවයි. ගහ - කොල, ඇල දොල, පොලොව, ග්‍රහ වස්තු, සත්තු, පක්ෂි මෙකී නොකී විවිධත්වයෙන් යුතු හැඳින්වීම් වලට ඒ පාදක වෙයි. - කාල, දිග්, මනස්, ආත්ම, විඥාණ කාරක වෙයි. උල්ලාසය හා ශකුණය එහි උපාංගයෝය.

පරම්පරාවෙන් පරම්පරාවට පැමිණි මේ මාහැඟි ශාස්ත්‍රය සීමිත දෙනෙකු අත පමණක් රැඳී තිබුණ හෙයින් එහි අගය නොඅඩුව පැවතුණි. ශාස්ත්‍රිය වටිනාකම රැක ගැනීමද, මෙම ශාස්ත්‍රය බහුල ලෙස ඉගැන්වීමක් නොකිරීම තුලින් දැකිය හැක්කේය.

දිගු කලක් පරම්පරිකව සීමිත කොටසක් තුල රැඳී තිබූ මෙම ශාස්ත්‍රයේ විශ්මිත එල අත්දැක සිටි සැමටම එය ඉගෙනීමේ ආශාවන් ඇති නොවූයේ යැයි කාට නම් කිව හැකිද? එසේ ආශාවන් ඇති වුවද, ඉගෙනීමේ අවස්ථාවන් නම් ඉතාමත් අල්ප විය.

මෙම තත්ත්වයන් යටතේ බොහෝ විට රජවරුන් හා රාජ්‍ය ප්‍රධානීන් මෙන්ම පන්සල්වල ස්වාමීන් වහන්සේලා විසින් මෙම ශාස්ත්‍රධාරීන් ගෙන් එම ශාස්ත්‍රිය කරුණු පිළිබඳව විමසනු ලබන අවස්ථාවලදී කිසිවක් භූවා දැක්වීම් වශයෙන් ශාස්ත්‍රයේ යම් යම් කොටස් පිළිබඳව හෙළිකරන ලද අවස්ථාවන් ඇති නමුදු ඒ කවර අවස්ථාවකදී හෝ ශාස්ත්‍රීය

මූලිකාංගයන් එළිදක්වනු ලැබ නොමැත. එහෙත් එතෙක් කිසිවක් නොදැන සිටි අසා දැනගත් අය, ඒවා අගය කරමින් තම දැනුම ලෙස තබා ගන්නටත් බෙදා ගන්නටත් පසුබට නොවන්නට ඇත. එහෙයින්ම බොහෝ දෙනකු අතට පත් ජ්‍යොතිෂ ශාස්ත්‍රයට අයත් යම් යම් කරුණු බහුල වශයෙන් වත්මන් සමාජයේදී වුවද අපට දැකගන්නට ඇති නමුදු ඉන් පූර්ණ ප්‍රතිඵල ලැබිය නොහැකි බව කැපී පෙනෙන්නකි.

පාරම්පරිකව ගුරු ආභාෂයෙන් මෙම දැනුම නොලද අය වෙතින් පූර්ණ ජ්‍යොතිෂ දැනුමක් අපේක්ෂා කළ නොහැක්කේ, ජ්‍යොතිෂයේ වැදගත් රහස් ශිල්පීය ක්‍රමවේදයන් පරම්පරා තුලම රැඳී ඇති බැවිනි.

වර්තමානයේ පලවන බොහෝ පොත පත ඇසුරින් ජ්‍යොතිෂය පිළිබඳ ශාස්ත්‍රීය ඥානයක් ලැබිය නොහැකිය. ජ්‍යොතිෂය පිළිබඳව කිසියම් දැනුමක් නම් ලැබිය හැකිය. එවන් පොත පත හෝ නොවූයේ නම් මෙම මා හැඟි ශාස්ත්‍රය මේ වන විටත් ජනයාගෙන් අත්හැරී ගොස් තිබෙනු නොඅනුමානය.

පූර්ණ ශිල්පීය ඥානයෙන් තොරව ලබන දැනුම අඩු එකකි. ඒ අනුව එකී තැනැත්තා සතුව ඇත්තේ සීමිත දැනුමක් පමණක් බැවින් පුලුල්වූ යමක් එවැනි කෙනෙකුගෙන් අපේක්‍ෂා කළ නොහැක්කේය.

වර්තමානයේ විවිධාකාර, ජ්‍යොතිෂය ඉගැන්වීම් කරන පංති පිළිබඳව අසන්නට දකින්නට ලැබේ. එහෙත් ඒවායේ ඉගෙනුම ලබන කී දෙනකුට නම් නිසි ජන්ම ඵල කථනයක් කළ හැක්කේද යන්න විමසිය යුතුය.

කේන්ද්‍රයක් ගණනය කොට සකස්කර ගැනීමේ හැකියාව ඔවුනට තිබිය හැක. එහෙත් එම කේන්ද්‍රය විග්‍රහ කිරීමේ හැකියාව නොමැත්තේ නම් එහි ඵලය කිම?.... දෝෂ දුරු කොට නැකතක් ශුද්ධකර ගැනීමට වත්මන් බොහෝ දෙනකු නොදනිති. ලිතේ දැක්වෙන දින ශුද්ධිය නොමැති නම් එවැනි අයට නැකත් ඇත්තේද නැත.

මේවා අවධානයට ලක් කළ යුතු කරුණුය. පාරම්පරික ජ්‍යොතිෂය හැදෑරුවනට නම් මේවා ගැටලු නොවේ. ඒ ඔවුන් ග්‍රහයින් ගෙන් ඒ ඒ තැන්වලට අනුව දක්වන සංඥාවන් තේරුම් ගෙන ඒවාට උචිත වන අයුරින් විග්‍රහ කර ගැනීම මිස ග්‍රහයින් මත ආරෝපනය කළ සර්වබලධාරී බලයක් නොමැති බව පාරම්පරික ජ්‍යොතිෂය හැදෑරීමේදී ඉගෙන ගෙන ඇති බැවිනි.

ග්‍රහයින් පමණක් නොව, සෑම සියලු දෙයකම නෛසර්ගික ශක්තීන් ඇත. ඒවා ගෝචර අයුරින් හා තත්කාලීන අයුරින් විවිධත්වයක් දක්වන බැවි ඒවා කෙරෙහි විමසිළිමත්ව බැලීමෙන් වටහා ගත හැකිය.

මෙවැනි තත්ත්වයන් පිළිබඳව පූර්වාචාරීන් විසින් මැනවින් හදාරා ඇත්තේ ඔවුන්ගේ දියුණු වූ චෛතසික ශක්තිය හා බැඳුනු අධ්‍යාත්මික බලය උපයෝගී කර ගනිමිනි. එහෙයින් එවැනි දෑ දැකීමට නූතන අප හට වුවද දියුණු අධ්‍යාත්මික ශක්තියක් ඇතිකර ගත යුතු වන්නේමය. අධ්‍යාත්මික ශක්තියකින් තොරව මෙවැනි ශාස්ත්‍ර ප්‍රගුණ කිරීමේ හැකියාව අති දුර්ලභය. සිත කිසියම් අරමුණකට යොමුකොට ඒකාග්‍රතාවයකට පත්වීම හුරුවීම ඔස්සේ කලක් දියුණු කරගෙන යැමේදී ඇතිවන

දියුණු මානසික ක්‍රියාකාරිත්වය තුලින්ම අධ්‍යාත්මික ශක්තිය වර්ධනය වෙයි. දුවන මිනිසෙකු හට කිසිවක් මැනවින් දැකගත නොහැකිය. සවිස්තරාත්මක අයුරින් දැක ගැනීමට නම් නතරවී විමසුම් සහිතව බැලිය යුතුය. එවිට දුවන අවස්ථාවේදී දුටුවාට වැඩි යමක් නිශ්චිතවම අවබෝධයකින් යුතුව දැකිය හැකි වන්නේය.

ජ්‍යොතිෂයේදී නව වැන්නේ රවි සිටියදී තෙවැන්නේ ශනි සිටී නම් එම ජන්ම පත්‍රය හිමියා යාචකයකු වේ.... කියා යමෙකු කියන්නේ යැයි මදකට සිතමු.

දැන් මෙය මේ ලෙසින්ම බොහෝ දෙනකු සිහිතබා ගනිති. එය වැරදිය. මෙසේ රවි හා ශනිගේ පිහිටීම ජන්ම පත්‍රය හිමියාට බලපෑමට හේතුව කවරේදැයි විමසිය යුතුය. සහේතුකව මිස අහේතුකව මෙවැන්නක් සිදුවිය නොහැකිය. යමෙක් කෙරෙහි අරමුණු කොට, මනස මෙහෙයවන්නට හුරු නැනැත්තා හට මෙවැනි අවස්ථාවලදී එම පුරුද්ද නිතැතින්ම පෙරට එයි. කෙනෙකු විසින් යෝගයක් ප්‍රකාශ කළ සැනින්ම එය භාර ගැනීම නොකළ යුත්තක් බව මෙහිදී ඔබට පෙනෙනු ඇත.

මෙය ඔබට එක එල්ලේ සිතා ගැනීමට අපහසු වන්නේ නම් තවත් විග්‍රහයක් උපකාරයක් සේ දක්වමි. එනම් ජන්ම පත්‍රයේ රවි නවවැන්නේ නීචව සිටියදී, ශනි එම ජන්ම පත්‍රයේ තෙවැන්නේ සිටී නම් කේන්ද්‍ර හිමියා යාචකයෙකුගේ තත්ත්වයට පත්වෙයි.

දැන් ඔබට මෙය තේරුම් ගැනීම අපහසු නොවනු ඇතැයි සිතමි.

ජන්ම පත්‍රයෙහි නවවැන්නේ රවි නීච බවක් කියැවේ. රවි නීච වන්නේ තුලා රාශියෙහිදීය. එසේ නම් මෙම ජන්ම පත්‍රයෙහි ලග්නය කුමක්ද?

ඒකාන්තයෙන්ම එම ජන්ම ලග්නය කුම්භය වේ. කුම්භය ලග්නය වූ කළ ලග්නාධිපතියා 'ශනි' ය. ශනි තෙවැන්නේය. කුම්භයේ සිට තෙවැන්න 'මේෂ' රාශයයි. ශනි මේෂයේ නීචය. දැන් ඔබට තත්ත්වය පැහැදිලි වනු ඇත. එය එපමණක්ම නොවේ. සත්වැන්නාධිපති රවි භාග්‍ය ස්ථානය වූ නවවැන්නේ නීචව සිටියදී ලග්නාධිපති ශනි වික්‍රමස්ථානයේදී නීච වීමත් සමග යාචකත්වය හැර අන් කවර දෙයක් ලබන්නද?

වත්මන් සමාජයේ බොහෝ දෙනකු හට සිදුවී ඇත්තේ ජ්‍යොතිෂය හා තාරකා විද්‍යාව අතර අතරමං වීමටය. ජ්‍යොතිෂය යනු තාරකා විද්‍යාව නොවේ. එයට හාත්පසින්ම වෙනත් ශාස්ත්‍රයකි. කාලය හා අවකාශයේ ක්‍රියාවලිය හඳුනා ප්‍රයෝජනයට ගැනීමට පැරණි පූර්වාචාරීන් විසින් අවකාශය විවිධාකාරයේ බෙදීම්වලට ලක් කරනු ලැබ තිබේ. අවකාශය කොටස් දොළහකට බෙදමින් රාශි දොළහක් වශයෙන් නම් කර ඇත. එම එක් රාශියක් අංශක 30ක් විය. අවකාශය අංශක 360 කින් යුතු වෘත්තයක් සේ සංකේතවත් කළෝය. යලි එකී රාශි දොළස රාශි අර්ධ වශයෙන් විසි හතරකට බෙදූ අතර ඒවායේ අයිතිය රවි හා සඳු අතර බෙදා දී ඇත. එකම රාශිය අංශක 10 බැගින් කොටස් තුනකට බෙදමින් දේ‍රෂ්කාණ වශයෙන් කොටස් තිස් හයකට බෙදා දක්වා තිබේ.

මෙයාකාරයෙන් ශොඩශාංසක වශයෙන් කොටස් 72 කටද, සප්තාංශක වශයෙන් කොටස් 84 කටද, නවාංශක වශයෙන් කොටස් 108 කටද, ද්වාදශාංශ වශයෙන් කොටස් 144 කටද, අංශකයෙන් අංශකයක් වශයෙන් ත්‍රිංශාංශකද, අංශක භාගයක් වශයෙන් ෂෂ්ඨාංශකද, ආදී වශයෙන් වඩ වඩාත් සියුම් ලෙස බෙදමින් දක්වා ඇත්තේ නිවැරදිව එහි ක්‍රියාවලියන් අවබෝධ කර ගැනීමේ පහසුව සඳහාමය.

අවකාශයේ ඉරි ගසා හෝ සළකුණු යොදා යම් යම් දේ දැක්විය නොහැකි බැවින් ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන භූතයින්ගෙන්ම නිර්මිතව තිබූ විවිධ ග්‍රහ වස්තූන් හඳුනාගෙන ඒවාට සංඥා නාමදී - ඒවා අනුව යමින් අවකාශයේ ඒ ඒ ප්‍රදේශවල සිදුවන ක්‍රියාවන් හඳුනාගැනීමේ මංපෙත් පහදා දී ඇත්තේය. ජ්‍යොතිෂයට හිරු සඳු පෘථිවිය අතර වූ චන්ද්‍ර කලාවම මූලිකවී ඇති බව පැහැදිලිය.

දවස - නැකත - තිථිය - කරණය, යෝගය - දග්ධ, මර, අව, පුර, කාණ, දසමහ දෝෂ, විසි මහා දෝෂ යනාදී මෙකී නොකී සියලු දේ චන්ද්‍ර කලාව මූලික කොට ගන්නා අයුරු පැහැදිලිවම දැකගත හැකිය. සෙසු ග්‍රහයින්ගෙන් එල නොගන්නා යයි මින් අදහස් නොකෙරේ. සෙසු ග්‍රහයින් සිටි, දුටු අයුරු ඇසුරු කොට ගනිමින් ඒවායින් දැක්වෙන සංඥා හෙවත් නිවේදනය උපයෝගි කර ගත යුත්තේය.

ඒ පිළිබඳව අපි මදකට විමසමු. එත්මන් ජ්‍යොතිෂ ඉගැන්වීම්වලදී හිරු, කුජ, ශනි, අව පක්ෂ චන්ද්‍රයා, පාපින්ට එක්වූ බුධ හා පාපීන් සේ දැක්වෙන අතර පුර, සඳු, බුධ, ගුරු, කිවි ග්‍රහයින් වශයෙන් හඳුන්වයි. මේ අනුව බලන කල

පාපින් හා ශුභයින් නිතැතින්ම අපට හඳුනාගත හැකිවනු ඇත. එහෙත් එය එසේ නොවන්නේය.

උදාහරණයක් වශයෙන් වෘෂභ ලග්න කේන්ද්‍රයක් ගනිමු. ඕනෑම කේන්ද්‍රයක 6 - 8 - 12 රිපඃ හෙවත් දුෂ්ඨ ස්ථාන වශයෙන් හඳුන්වනු ලැබේ. මේ අනුව මෙකී දුෂ්ඨ ස්ථාන අධිපතියෙක් යම් භාවයකට පත්වූ කල එහි ඵල හානියට පත් කරන බවක් ඉගැන්වෙයි. ඒ අනුව වෘෂභ ජන්මියාගේ අටවැන්නාධිපති ගුරුය. අශුභයා සිටි තැන ඵලය හානිවීමේ න්‍යාය අනුව අශුභ භාව හිමියෙක්වූ ගුරුගෙන් අපේක්ෂා කළ හැක්කේ කවර නම් වූ ශුභයක්ද? ශුභයක් නොකර අශුභ ඵල ගෙන දෙන්නේ නම් එවන් ග්‍රහයා ශුභයකු සේ සැළකිය හැකිද?

එමෙන්ම වෘෂභ ජන්මියාගේ කේන්ද්‍රයේ නමවැන්න හා දසවැන්න අධිපතියා 'ශනි' ය. පෙර දැක්වීම අනුව ශනි පාපියෙකි. එහෙත් වෘෂභ ජන්ම හිමියාට ධර්ම කර්මාධිපති යෝගය ඇති කරන්නේ 'ශනි' විසිනි. ශනි පාපියෙකුම නම් එවැනි බලවත් යෝගයන් ඇතිකර දෙන්නේ කෙසේද?

මෙම යෝගය මෙසේ වූයේ වුවද මෙය තුලම පවතින අන්‍ය පිහිටීම් අනුව එයම රාජ යෝගයක් විමටද බැරිකමක් නැත. ඒවා තේරුම් ගැනීමට මනා චෛතසික දියුණුවක් තිබිය යුත්තේය. ජ්‍යෙතිෂයට අදාලවන මූලික ඥාන දර්ශණය මැනවින් ලබා සිටිය යුත්තේය.


හසල දැනුමැති ජ්‍යොතියුර්වේදියා - උච්ච ග්‍රහයාගෙන අදාල ග්‍රහයාට ආරෝපණය කොට දක්වා ඇති භූත කොටසේ බලවත් වීමත්, නීච ග්‍රහයාගෙන් අදාල ග්‍රහයාට ආරෝපණය

කොට දක්වා ඇති භූත කොටසේ දුබලවීමත් හඳුනා ගනී. ඒ අනුව නිවැදි නිගමනයක් ඔහු විසින් දක්වනු ඇත. කිසිවකුගේ ජන්ම පත්‍රයේ කිසියම් ග්‍රහයකුගේ නීච වීමක් දැක්වෙන්නේ යැයි සිතමු.

ඒ පිළිබඳව අවබෝධය ඇති ප්‍රඥාවන්තවූ ජ්‍යොතිර්වේදියා පංච ස්වර ප්‍රමුඛව ඇති අක්ෂරයන් ගෙන් පරිනිර්මිත මන්ත්‍ර ශාස්ත්‍රය හෝ එකී දුර්වල භූත කොටස ප්‍රබල කිරීමට උපයෝගී කොට ගත හැකි ගස්වැල්, ශාඛ හෝ වෙනත් දෑ භාවිතයට ගනිමින් ජන්මියාට ජන්මයේදී අඩුවී ඇති බව දැක්වෙන භූත කොටස ලබාදීමෙන් ඔහුගේ පැවැත්මේ සමබරතාවය රැකදීමට අවශ්‍යය උපදෙස් දීම හෝ කටයුතු කර දීමට ක්‍රියා කරනු ඇත. ඒවා යාග හෝම, යන්ත්‍ර මන්ත්‍ර විය හැක. නැතහොත් ඖෂධ, ආහාර පාන විය හැකිය. කවර ක්‍රමයෙන් වුවද මෙහිදී සිදුවනුයේ දුබලව ඇති භූත කොටස ප්‍රබල කිරීමට අදාල ක්‍රියාවලියක් මිස ග්‍රහයාගේ සර්වබලධාරී බලයකට යටවීමක් නොවේ. බතල ගන්නට ගිය තැනත්තාහට භේනේ දිග පළල අවශ්‍ය නැතුවාක් මෙන් අපලයට ශාන්ති කර්මය ලබා ගන්නා තැනත්තාට භූත ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමක් නොව ග්‍රහයා නිසා සිදුවන අපලයට කළ යුතු ප්‍රතිකර්මය පමණක් ජ්‍යොතිර්වේදියා විසින් ප්‍රකාශ කිරීම තුලින් ග්‍රහයා සතු සර්වබලධාරී බලයක් ඇති බවක් සාමාන්‍ය ජනතාව තුල අතීතයේ සිටම පුරුද්දක් ලෙස පිළිගැනෙමින් ඇත. මේ පිළිබඳව වඩාත් විස්තර මෙහි දක්වන්නට යෑමෙන් වෙනත් මාතෘකාවකට යොමුවන බැවින් එය වෙනත් අවස්ථාවකදී සාකච්ඡාවට ලක් කළ හැක.

මතුපිටින් පමණක් බලා ජ්‍යොතිෂය හැදෑරීම කළ නොහැකිය. ඒ සඳහා විමසුම් බුද්ධිය අවශ්‍ය වේ. ඔබ නිතර දැක ඇති නමුදු බුද්ධියට හසු නොවූ කිසිවක් දක්වනු කැමැත්තෙමි. එය ඔබගේ බුද්ධියට කොපමණ ගෝචර වේදැයි සිතන්න.

රාශි 12 කි. ඒවා




මෙහිදී මේෂයේ සිට වෘශ්චිකය දක්වා එක් භාගයක් ලෙසත් ධනුවේ සිට මීනය තවත් භාගයක් ලෙසත් ඇති බවක් දැකිය හැකිය. මෙය තුළ ගැබ්ව ඇති දර්ශණය පැහැදිලි කරගත හැකිද?

(1) රාශි දොළස රාශ්‍යාධි වශයෙන් විසිහතර කට බෙදා ඇත.

මෙම අර්ධයන් රවි - හා සඳු අතර පමණක් බෙදා දී තිබේ. අන් අයට කිසිවක් දක්වා නැත.

(11) ත්‍රිශාංශකවලදී

| ඔජ | යුග්ම |
|---|---|
| කුජට අංශක 5 | කිවිට අංශක 5 |
| ශනිට අංශක 5 | බුධට අංශක 7 |
| ගුරුට අංශක 8 | ගුරුට අංශක 8 |
| බුධට අංශක 7 | ශනිට අංශක 5 |
| කිවිට අංශක 5 | කුජට අංශක 5 |

වශයෙන් දක්වා ඇති අතර, මෙහි රවි - සඳු දෙදෙනාට කිසිවක් දක්වා නැත. මේ අනුව රාශ්‍යාර්ධ හා ත්‍රිංශාංශක ඇසුරු කොට ගනිමින් එකී සංඥා තුලින් දැක්වෙන දර්ශනයන් කවරේද?

මේවා ඔබගේ සිතෙහි ධාරණය සඳහා නොව, ඔබගේ බුද්ධිය තුලින් මනැසට යොමුකොට මතු පිටින් නොපෙනෙන ගැඹුරු ජ්‍යොතිෂ දර්ශණය දැක ගන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනිම පිණිසය: උපයෝගි කොට ගෙන ජ්‍යොතිෂ ඥානය දියුණුකර ගැනිමට පෙළැඹෙන්නේ නම් වැඩි යමක් දැකිය හැකිවෙනු ඇත.

## 15

# සෙනසුරු මාරුව.... විකුණා කෑම

සෙනසුරු ග්‍රහයාගේ මාරුවක් පිළිබඳව විවිධාකාරයේ කථිකාවන් පසුගිය සති කිහිපයක සිට අපට බොහෝ සෙයින් අසන්නට - දකින්නට ලැබුණේය. එවන් කථිකාවන් තුලින් මෙරට ජනතාවට නිරන්තරයෙන්ම ග්‍රාහ්‍ය වූයේ සෙනසුරු නම් වූ ග්‍රහයා අති භයානක එකෙකු හැටියට ය. සියල්ලෙහිම විනාශදායකයා හැටියට ය. සෙනසුරුගේ මාරුව ජනතාව විපතට හෙලන්නක් හැටියටය. මෙයින් සිදුවූයේ ජනතාව තුළ අනියත බිය හා සංකාවන් ඇතිවීම පමණකි. ජ්‍යොතිෂ සිද්ධාන්තයන් අනුව සෙනසුරු පිළිබඳව නිවැරදි විග්‍රහයක් සිදුවූයේ නම් සෙනසුරුගේ මාරුව සිදුවූ 2007 ජූලි මස 16 වැනි දින රැකියාවන් සඳහා පිටත්ව නොගිය පිරිස එවන් වූ ව්‍යාකූල මානසික තත්ත්වයකට පත් නොවනු ඇත. අවාසනාවකට, එදා බොහෝ දෙනෙකු තුළ සෙනසුරු මහා විපත්ති දායකයෙකු ලෙසින් බිය සාංකාවන් ඇතිකර තිබුණි.

අප දැන උගත් පාරම්පරික ජ්‍යොතිෂ සිද්ධාන්තයන් අනුව ග්‍රහයින් සත් දෙනෙකි. රාහු-කේතු නම් ජායා ග්‍රහයින්

දෙදෙනෙකි. එකතුව නවයකි. ඔවුන් ස්වකීය චාරයන් අනුව නිරතුරුවම රාශියෙන් රාශියට ගමන් කරනු ලබන්නේය. මෙවන් ග්‍රහයින් උපයෝගී කර ගනිමින් පූර්වාචාරීන් වහන්සේලා විසින් විග්‍රහ කරනුයේ ආකාශ කුහරය තුළ සිදුවන පංච මහා භූතයින්ගේ ක්‍රියාවලියන් හඳුනාගත යුතු ආකාරයයි. එහි නානත්ත්වයක් මිස ඒකත්ත්වයක් නොමැති බව පළමු කොටම අවබෝධ කරගත යුතුව ඇත්තේය. මහා භූතයින්ගේ මූලික තත්ත්වයන් පිළිබඳව අපට පියවි ඇසින් දැකිය නොහැකිය. එය එසේ වුවද අද දවසේද අප විසින් මහාභූතයින් හඳුනා ගනු ලබනුයේ ගින්න - සුළඟ - ජලය යනාදී වශයෙන් සම්මත වූ සංඥා නාමයන් ගෙනි.

ගින්නෙහි ස්වභාවය දැවීමයි. එය පහළ සිට ඉහළට ගමන් කරන්නේ වෙයි. දැවීමක් යැයි ඇසෙන විට අපගේ මනැසට ලැබෙන සංඥාව දැල්වෙන ගින්නකි. එය එසේම නොවී දැවෙන අවස්ථාවල්ද ඇත. අම්ල වර්ගවලින් සිදුවිය හැකි දැවීමද එවැන්නකි. එතැන ගිනිදැල් නැත. දැවීම සිදුවන්නේය. ඒ වනාහි තේජෝ භූතයාගේ ස්වභාවයකි.

මෙවන් මහාභූත අතුරින් සෙනසුරු හරහා නිවේදනය වන සංඥාව "සුළඟ හෙවත් වාතය" වන්නේය. ඒ වනාහි සෙනසුරුට ආරෝපනය කර ඇති නෛසර්ගික ක්‍රියාවලියයි.

සුළඟක් වුවත් නිරතුරුවම එක ලෙසින් පවතින්නේ නොවෙයි. හමායන සුළං තත්ත්වයක් නොමැතිව තිබූ තැනෙක, - තවත් මොහොතකදී දැඩි සුළඟක්, ප්‍රචණ්ඩ කුණාටුවක් ඇතිවිය හැකිය. එසේත් නැතහොත් එක් ප්‍රදේශයක මද සුළඟක් හෝ නොමැතිව තිබියදී තවත් ප්‍රදේශයක චණ්ඩ ඝුළි සුළඟක් හමා ගොස් මහා විනාශයක් සිදුවී ඇති බවක්

අසන්නට ලැබිය හැකිය. ඒ වනාහි වායෝ භූතයාගෙ විවිධත්වයයි..

මෙවන් තත්ත්වයන් පිළිබඳ සංඥාකරුවෙකු වන සෙනසුරුද - ගෝචර ගමනින් රාශියෙන් රාශියට ගමන් කරයි. එක රාශියක වර්ෂ දෙකහමාරක් පසුවන්නෙකි. අනු වක්‍රයකින් තමා පසුකළ රාශියට ආපසු නොගියෙහි නම් සෙනසුරු තමන් පසුකල රාශියට යලි පිවිසෙන්නේ වසර තිහකට පසුවය. මෙය නිරන්තරයෙන් ම සිදුවන ක්‍රියාදාමයක් මිස අහඹු සිදුවීමක් නොවන්නේ ය.

එලෙසින් පසුගිය වසර දෙකහමාරක කාලයක් කටක රාශියෙහි ගතකළ සෙනසුරු 2007. 07. 16 වැනිදා අළුයම 04. 41 ට සිංහ රාශියට ප්‍රවේශ විය. ඒ වනාහි වසර තිහකට පසුව සිදුවූ සෙනසුරුගේ ප්‍රවේශයකි.

සෙනසුරු පමණක්ම නොවේ - කවර ග්‍රහයෙකු හෝ වේවා - රාශියකින් රාශියකට පිවිසි පමණින් හෝ වේවා - සිටි පමණින් හෝ වේවා නිටු - අනිටු බව දක්වන්නට ඉක්මන් වීම සුදුසු නොවෙයි. ඒවා දැක බලා විග්‍රහ කරගත යුත්තේ පුද්ගලයින් සඳහා නම් ඒ ඒ පුද්ගලයින්ගේ ජන්ම පත්‍ර තුලිනි.

ග්‍රහයින් පිළිබඳව තත්ත්වය විග්‍රහකර ගැනීමේදී ග්‍රහයාගේ හිමි තැන - සිටි තැන දුටු තැන යනාදි වශයෙන් ගනිමින් අනුගමනය කළ යුතු ක්‍රම පිළිබඳව පැරණි ශාස්ත්‍රිය ක්‍රමවේදයන් තුළ දක්වා ඇත්තේ ය.

භාවයක් තුළ ග්‍රහයින් දෙදෙනෙකු සිටි පමණින් - යෝග හෝ සංයෝජනයන් නොවන්නේය. ඒවා විග්‍රහාත්මකව හඳුනාගත යුත්තේය.

යෝග - සංයෝග - දෘෂ්ඨි හඳුනා ගැනීම සඳහා නවාංශක කුණ්ඩලිය කෙසේ යොදාගත යුත්තේද යන්න පාරම්පරික ශාස්ත්‍ර ඥානයෙන් හෙබි ප්‍රාඥයා දන්නේය. එවන් විග්‍රහයකින් පසුව මිස - රාශියකින් රාශියකට පිවිසීම හෝ සිටීම පිළිබඳව ගුණ දොස් දැක්වීමට යෑම ප්‍රඥාවන්තයින්ගේ සිරිත නොවන්නේය.

සම්මතයන් අනුව සෙනසුරු - සිංහ රාශි ගතවීම - සිංහ ලග්න හිමියනට අපල උදා කරවන ලග්න ඒරාෂ්ඨක තත්ත්වයකැයි කියති. එහෙත් එහි ක්‍රියාත්මක භාවය හා ප්‍රතිඵලය සියළුම සිංහ ලග්න කාරයින්ට ඒකාකාරී අයුරින් විපාක ලබා නොදෙන බව වටහා ගත යුතුයි.

ඒ ඒ පුද්ගලයාගේ ජන්ම පත්‍රය අනුව අනෙකුත් ග්‍රහයින් ද - සෙනසුරු ග්‍රහයාද හිමි තැන - සිටි තැන - දුටු තැන යනාදි වශයෙන් ද - ශුභ දෘෂ්ඨි - අශුභ දෘෂ්ඨි වශයෙන් ද යන ආකාරයෙන් විවිධ කරුණු කාරණාවන් හේතුකොට ගෙන ඵලයන්ගේ වෙනස්වීම් සිදුවන්නේය ජ්‍යොතිෂයේ ඉගැන්වීම ද එයයි.

මකර ලග්නාධිපතියා සෙනසුරුය. සෙනසුරු සිංහ රාශි ගත වන්නේ නම් ඒ වනාහි ජන්ම කේන්ද්‍රයෙන් අට වැන්නට සෙනසුරු ප්‍රවේශ වීමකි. ලග්නාධිපතියා අටවැන්නට යෑම සම්මතය අනුව විපත්ති දායක එකකි.

මකර ලග්නයෙන් ඉපිද - ජන්ම අවස්ථාවෙහි දී සෙනසුරු අටවැන්නේ සිටිය තැනැත්තෙකුගේ ජන්ම පත්‍රයෙහි අට වැන්නට යළි සෙනසුරු පැමිණ ඇත. ලග්නාධිපති වශයෙන්

අට වැන්නට යළි සෙනසුරු පැමිණ ඇත. ලග්නාධිපති වශයෙන් අටවැන්නට යෑම අගුණදායකය. ඒ සෙනසුරු වීම වඩාත් නරකය. සම්මතය අනුව මෙම තත්ත්වය සෙනසුරු නම් වූ තනි ග්‍රහයා මත පිහිටා ප්‍රකාශ කරන්නෙහි නම් - සෙනසුරුගේ මෙම පිහිටීම ආයුෂ ක්ෂය කරවන පිහිටීමකි.

එහෙත් මේ වනවිට දෙවන වරටත් සෙනසුරු එම ජන්ම කේන්ද්‍රයේ අට වැන්න වන සිංහ රාශියට පිවිස ඇත. එම ජන්ම පත්‍රය හිමියාගේ දැන් වයස අවුරුදු තිහකි.

ඔහු තවමත් ජිවතුන් අතරයි. එය සිදුවී ඇත්තේ අනෙකුත් ග්‍රහයින්ගේ පිහිටීම් වලින් ලැබුණ පිටුවහලින් බව එම ජන්ම පත්‍රය පරීක්ෂා කිරීමේදී මැනවින් පැහැදිලි වන්නේය.

තත්ත්වය එහෙම නම් තනි ග්‍රහයෙකු වන සෙනසුරු මාරුව පිළිබඳව උඩඃත කර ගනිමින් අනාවැකි කියන්නට යෑම උචිතදැයි -අමුතුවෙන් ඇසිය යුතු නැහැ නේද?

එකම ගෙදර ජිවත් වන සහෝදර සහෝදරියන් කිහිප දෙනෙකු සිටින පවුලක - ඔවුන් ගෙන් වැඩි දෙනෙකු සාර්ථක ජිවිත ගත කරනු ලබද්දී එක් අයෙකු පමණක් දුබල වී අසාර්ථක වී සිටී. ඔහුට සෙනසුරුගේ අපලය උදාවෙලා යැයි කියති. එකම ගෙදරක වෙසෙන අය අතුරින් එක අයෙකු හට පමණක් සෙනසුරුගේ අයහපත් බලපෑම ලැබීමටත් - අන් අය හොඳින් සිටීමටත් හේතුවූයේ කුමක්දැයි යන්න සොයා ගත යුතුව ඇත්තේය.

සෙනසුරු ග්‍රහයා අන් අයගේ ජන්ම පත්‍ර යන්හිද සඳහන් වී ඇත්තේය. එලය නරක් වන්නට හේතු වූයේ

ඔහුගේ ජන්මයට හේතු වූ කරුණු අතර දුර්වල වූ ජනක කර්ම ස්වභාවයයි. සෙනසුරු හරහා දකිනුයේ එම සංඥාවය.

එසේ නොමැතිව ලොව සිටින තාක් සියළුම දෙනා හට සෙනසුරු බාධකයෙක් නොවන්නේය. සෙනසුරුගේ යහපත් දශානු දශාවලදී බලවත්වූ අය නැත්තේ ද නොවේ. ඒවා සිදුවනුයේ ඒ ඒ ජන්ම පත්‍රවල යෙදී තිබුණ ආකාරයන් අනුව මිස - සෙනසුරු රාශියකින් - රාශියකට ඇතුළුවීම මතම නොවේ. සෙනසුරුගේ මාරුව අනුව එතෙක් විඳිමින් සිටි දුකින් මිදෙන අයද ඇත්තේය. එසේ නම් එවන් අයහට සෙනසුරුගේ මාරුවෙන් සිදුවන්නේ යහපතක් නොවේද?

වෛද්‍යවරයා ය යනු බෙහෙත් නියම කරන්නෙකු නොව - උපදේශකයෙකි. ඔහු එකම කසාය සිට්ටුවක් තබාගෙන සෑම රෝගියෙකු හටම එය නියම කරන්නෙකු හෝ එකම කෂාය හැලියක් තබාගෙන සියළුම රෝගීන් උදෙසා එය බෙදා දෙන්නෙකු නොව, වෙන් වෙන් වශයෙන් එක් එක් රෝගියා බැගින් පරීක්ෂා කර, රෝග නිර්ණයන් අනුව ප්‍රතිකාර වශයෙන් ඖෂධ හා පැවතිය යුතු ආකාරයන් පිළිබඳව උපදෙස් දෙනු ලබන්නෙකි. එම උපදෙස් පිළිපදින්නා රෝගී තත්ත්වයෙන් අත් මිදෙන්නේය.

ප්‍රවීන ජ්‍යොතිර්වේදියාද එවැනිම උපදේශකයෙකු මිස ඵලාඵල කථනය කරන්නෙකු නොවන්නේ ය. ඒ ඒ ජන්මියාගේ ජන්ම පත්‍රයන් ගෙන, වෙන් වෙන් වශයෙන් පරීක්ෂාකර එළැඹෙන විග්‍රහයට අනුව සිදුවන හෝ සිදුවීමට ඇති යහපත් හා අයහපත් තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කොට - අයහපත් තත්ත්වයෙන් ගැලවී ගත හැකි ආකාරයන් පිළිබඳව

උපදේශයක් ද, සිදුවන්නාවූ යහපත් තත්ත්වයන් ආරක්ෂා කර ගනිමින් පවත්වා ගැනීම උපකාර වන උපදෙස් දෙනු ලබන මාර්ගෝපදේශකයෙක් ම වන්නේ ය.

ශාස්ත්‍රීය අවබෝධයෙන් යුතුව සිද්ධාන්තානුකූලව ජනතාවට සත්‍ය කරුණු අවබෝධ කරදී, ඔවුනගේ මනැස සංසුං කරවීම මිස - අන්ධානුකරණයෙන් වල් පල් දෙසමින් - ජනතාව වල්මත් කරවන ආකාරයේ කථිකාවන් - සංවාද වැනිදේ ඉදිරිපත් කරමින් ජනතාවගේ මානසික තත්ත්වයන් පහතට ඇද හෙළම සැබෑ ජ්‍යොතිර්වේදියාගේ කාර්‍ය නොවන්නේ ය.

මෙවැනි ව්‍යාකූලතාවයන් ඇතිවන ආකාරයේ වැඩසටහන් ජනතාව වෙත යොමු නොකිරීමට මාධ්‍ය ආයතනයන් ද ක්‍රියා කරනු ලබන්නේ නම් එය ශාස්ත්‍රීය ගෞරවයට හා ආරක්ෂාවටත් - ජනතාවගේ යහපතටත් හේතුවන බව නම් නොඅනුමානය.

සෙනසුරු අතීතයේදී මාරු වී ඇත. පසුගිය දිනවලද මාරු විය. අනාගතයේදී ද එවැනි මාරුවීම් සිදුවෙනු ඇත. එහෙත් ඒවා පිළිබඳව අනියත බිය හුදී ජනතාව තුළ ඇති නොකළ යුතුය.

මේවන විට සෙනසුරු මාරු වී හමාරය. තවත් වසර දෙකහමාරක් සෙනසුරු සිංහ රාශියෙහි ගත කරනු ඇත.

මෙසේ සිංහයේ ගත කරන කාලය තුලදී ද - ඒ ඒ ජන්මියාගේ ජන්ම පත්‍රවල යෙදී ඇති ග්‍රහ පිහිටීම් වලට අනුකූල වන අයුරින් ශුභා - ශුභ ඵල ලබාදෙනු ඇත.

සෙනසුරා හොඳට හොඳය. නරකටත් ඒ වගේම නරකය.

ඒවා සිදුවනුයේ තම තමාගේ ජනක කර්මයන් අනුව මිස එල කථිකයින් ගේ අභිමතය පරිදි නොවේ.

ශාස්ත්‍රීය ක්‍රියා පිළිවෙතින් බැහැරව සෙනසුරුගේ මාරුව පිළිබඳව අහිතකර තත්ත්වයක් හුවා දක්වමින් - තමන්ගේ දැනුම ලොවට පෙන්වන්නේ යැයි කවරෙකු හෝ සිතා සිටිය ද, විධිමත් ශාස්ත්‍රීය දැනුමැත්තන් විසින් එවන් ක්‍රියාවන් හෙළා දකිනු ඇත්තේ අවඥාවෙන් හා පිළිකුලින් යුතුව බැව් අමතක නොකළ යුත්තේ ය.

# 16

# මෙහෙමත් පොරොන්දම් බැලීමක්...

ජන්ම පත්‍රයක භාව දොළසින් විග්‍රහ වන කාරකවල ඇත්තේය. එවන් විග්‍රහයන් අනුව කවර අයෙකුගේ වුවද විවාහය පිළිබඳව විමසීමේදී ජන්ම පත්‍රයෙහි සත්වන භාවයට හිමිවනුයේ ප්‍රධාන ස්ථානයකි.

සත්වැනි භාවය, එහි භාවාධිපතියා, නවාංශකය, නවාංශකාධිපතියා, නැකත්, භාවයේ සිටි ග්‍රහයා හෝ ග්‍රහයින් - භාවය දුටු ග්‍රහයා හෝ ග්‍රහයින් යනාදි වශයෙන් බොහෝ කරුණු සමාලෝචනය කර ගනිමින් විවාහය පිළිබඳව තත්ව විග්‍රහයක යෙදීම බුද්ධිමත් දෛවඥයින් විසින් සිදුකරනු ලබයි.

මෙම කටයුත්තෙහිදී, වත්මන් ජ්‍යොතිර්වේදීන් විසින්, ජන්ම නැකතෙහි සිට - ගැනීමේ ක්‍රම වේදයක් අනුගමනය කරනු ලැබෙයි. එහෙත් එය අවුල් සහගත ක්‍රමයක් බව පැහැදිලි ලෙසින්ම පෙනෙන නමුදු - වත්මන් ලිත්වල, විවාහ

පරීක්ෂාවෙහිදී ද, එම ක්‍රමයම දක්වා ඇති බැවින්, විචාර බුද්ධියෙන් තොරව කටයුතු කරන්නන්ද, එහිම එල්බ ගෙන සිටිති. ඒ අනුවම කටයුතු කරති. ඉන් අනර්ථයක්ම මිස අර්ථයක් සිදු නොවන බැවින්, එම අවුලෙහි වැටුනවුන් කරදරයට පත් වෙති. දුක් විඳිති.

පෙර දවස සිටි සෘෂි උතුමන් වහන්සේලා විසින් රචනා කරන ලද මුල් පත පොත, නොමැති වත්මන් සමාජයෙහි භාවිතා වනුයේ එම පොත්වල සඳහන් කරුණු ලිහිල්, කර දැක්වීම පිණිස සෙසු කාලීන ශාස්ත්‍රවේදීන් විසින් ලියන ලද අටුවා ටීකා - හෝ ව්‍යාඛ්‍යාවන්ය.

අර්ථය සරළ කර ලිවීමට යෑමේදී මුල් පොතෙහි සඳහන් මූලික හරයට හානි සිදුවිය නොහැක්කේ නොවේ. එසේම එවන් අයුරින් කරුණු දැක්වීමට යෑමේදී එම අටුවාව හෝ ටීකාව හෝ ව්‍යාඛ්‍යාව ලියනු ලබන්නාගේ අදහස් එහි ඇතුළු නොවන්නේ යැයි කිසිවෙකු කියන්නේ නම් එය සාවද්‍යයකි.

වර්තමානයේ අපගේ භාවිතය සඳහා මුද්‍රණය වී ඇති "නාරද සංහිතා" වෙහිද ජන්ම, සම්පත්, විපත්, ක්ෂෙම, ප්‍රත්‍යරි, සාධක, වධ, මෛත්‍රී, පරම මෛත්‍රී වශයෙන් .... ලෙස ගෙන සිදුකරනු ලබන "ගැනීමේ" ක්‍රමයක් තිබෙනු දැකිය හැකිය. එවන් ආකාරයක ගැනීමේ රටාවක් "නාරද සංහිතා" වෙහි දැක්වෙන්නේ වුවද එය තුළ අර්බුධකාරී ස්වරූපයක් ඇති බව නම් අමුතුවෙන් කිවයුතු නොවේය.

එවන් අර්බුධකාරී තත්වයක් පැන නගින්නේ කෙසේදැයි සුළු නිදර්ශනයක් ගෙන අපි බලමු.

මේෂ ලග්නයෙන්, අස්විද නැකතින් උපන් අයෙකු වේයැයි සිතමු. මෙහිදී ලග්නය මේෂ රාශිය වන අතර - අස්විද නැකත එය තුළ තිබෙන නැකත් බැවින් චන්ද්‍රයා ලග්නයෙහි සිටින බව පැහැදිලිය.

සඳු සිටි නැකත - ජන්ම වශයෙන් ගෙන පෙර සඳහන් කළ "ගැනීමේ" ක්‍රමය ආරම්භ වන්නේය.

මෙසේ ජන්ම - සම්පත් - විපත් - ක්ෂෙම - ප්‍රත්‍යරි - සාධක - වධ -මෛත්‍රී පරම මෛත්‍රී වශයෙන් ගැන ගෙන යෑමේදී කටක රාශිය තුළ අස්ලිස නැකතින් එක කොනක් අවසන් වෙයි.

එතැනින් පසුව ගැනීම ආරම්භ වනුයේ සිංහ රාශිය තුළ ඇති මා නැකතෙහි සිටය. එය මේෂ රාශිය ලග්නය වූ අයගේ පස්වන රාශියයි.

සිංහ රාශිය තුළ - මා නැකත, පුවපල් නැකත හා උත්‍රපල් නැකත එක් පාදයක් තිබෙයි.

උත්‍රපල් නැකතෙහි පාද තුනක් - හත නැකත හා සිත නැකතෙහි පාද දෙකකින් කන්‍යාව සමන්විතය.

සිත නැකතෙහි පාද දෙකක් - සා නැකත හා විසා නැකතෙහි පාද තුනක් තුලා රාශියෙහි වෙයි. තුලා රාශිය යනු මේෂ රාශියෙන් සත්වැන්නය.

විසා නැකතෙහි - එක් පාදයක් හා අනුර දෙට යන නැකත්වලින් වෘශ්චිකය සමන්විතය. වෘශ්චික රාශිය යනු මේෂ රාශියෙන් අටවැන්නය.

"මා" නැකතෙහි සිට, ජන්ම, සම්පත්, විපත්, යානදී වශයෙන් ගනින කල සිත නැකත, ප්‍රත්‍යරිය, සා නැකත, සාධකයි. විසා නැකත "වධ" යටතට ගැනෙයි.

මේවා සත්වැන්නෙහි කාරක තාවය හෙවත් විවාහය පිළිබඳව උපයෝගි කරගත යුතු සාධකයක්, වන නමුදු "ගැනීමේ" ක්‍රමය මත පිහිටා වත්මන් ඇතැම් ජ්‍යොතිර්වේදීන් විසින් මෙම නැකත් ප්‍රතික්ෂේප කරනු ලබති.

ලග්න රාශිය වූ මේෂයේ සිට අටවැන්න වූ වෘශ්චික රාශිය තුළ ඇති - අනුර හා දෙට නැකත්, මෛත්‍රී හා පරම මෛත්‍රී ලෙසින් ගනිති.

මේ අනුව විවාහය පිළිබඳව තිරණවලට එළැඹිය යුතු, සත්වැන්නේ යෙදුන නැකත් - ප්‍රත්‍යරි, සාධක, වධ ලෙසින් යෙදී ඇති බවත් - ලග්න කුණ්ඩලයෙහි රිපඃ ස්ථානයක් වන අටවැන්නෙහි යෙදී ඇති නැකත් දෙකක් මෛත්‍රී හා පරම මෛත්‍රී ලෙසින් ගැනෙන බවත් පැහැදිළි ය.

මෙහි තිබෙන වඩාත් අභාග්‍ය සම්පන්න තත්ත්වය නම්, චන්ද්‍රයාගෙන් අටවැන්නෙහි යෙදෙන නැකත් දෙකක් - මෛත්‍රී හා පරමමෛත්‍රී ලෙසින් ගැනිමය. මෙය කවර නම් වූ ජ්‍යොතිෂ සිද්ධාන්තයකට එකඟද, යන්න විමසිය යුතු වන්නේය.

සඳු සිටි තැනින් අට වැන්න, කවර හෝ ශුභ කටයුත්තකට නොගත යුතු බව සිද්ධාන්තයකි. මෙම සිද්ධාන්තයට ප්‍රවීන දෛවඥයින් එදා මෙන්ම අද දවසේ ද ගරු කරති.

සඳුගෙන් අටවැන්නේ පවතින අශුභකාරිතාවයන් එසේ

පැහැදිළිවම තිබියදීත්, සඳු ගෙන් අටවැන්නට යෙදෙන නැකත් දෙකක් මෛත්‍රීහා පරම මෛත්‍රී ලෙසින් ගණනය කර, ගැනීම කොතරම් දුරට ප්‍රඥා ගෝචර වන්නේ දැයි විමසිය යුතුය. නුසුදුසු දෙය සුදුසු ලෙසින් ගැනීම මුග්ධ ක්‍රියාවකි. මෙම තත්ත්වය පිළිබඳව බුද්ධිමතුන්ගේ අවධානය යොමු විය යුත්තේ ද එහෙයිනි.

"අපි පොරොන්දම් බලල ඒවා හොඳයි කී නිසා විවාහ වුණා." ... එහෙත් විවාහය අසාර්ථක වුණායැයි කියන අය සමාජයෙහි කොතෙකුත් ඇත.

"අපේ පොරොන්දම් ගැලපෙන්නේ නැති නිසා විවාහ වෙන්න එපා කිව. ඒත් අපි විවාහ වුණා. අද අපි සතුටින් ඉන්නවා යැයි පවසන්නවුන්ද සමාජයෙහි නැත්තේම නොවේ.

මෙවන් ප්‍රකාශයන් සුළුවෙන් ගෙන සැහැල්ලුවෙන් බැහැර කළ යුතු ඒවා නොවේ. එම කරුණු විචාර බුද්ධියෙන් යුතු බුද්ධිමතුන්ගේ අවධානයට යොමුවිය යුතු දේවල්ය.

ඔවුන්ගේ විවාහයන් සාර්ථක වූයේ හෝ නොවූයේ පොරොන්දම්වල දෝෂයෙන් නොව - ඒවා හරියට බැලීමට නොදන්නාකම නිසා බව අමුතුවෙන් කිව යුතු නොවේ.

විධිමත් අයුරින් ගුරු ඇසුරින් ලැබූ ශිල්ප ශාස්ත්‍රීය ඥාණයකින් තොරව, අන්ධානුකරණයෙන් ශාස්ත්‍රීය කටයුතුවල නිරතවන මුග්ධයින්ගේ මුග්ධ ක්‍රියාවන් නිසා එවැනි පසුබිම් සකස් වන බවක්, කල්පසු වීමෙන් හෝ එවැන්නන් විසින් අවබෝධ කරගනු ලබන්නෙහි නම් - අනාගතයෙහිදී යුග

දිවියට පිවිසෙන, එමෙන්ම එසේ පිවිසීමට පෙරුම් පුරන ආදරවන්තයින් ගේ ද - ඔවුනගේ දෙමව්පියන්ගේද - සකල ලෝකවාසී හුදී ජනතාවගේද හිත සුව පිණිස එයම හේතුවනු නොඅනුමානය.



# 17

## "මරුවා" කොහේද?

වත්මන් නැකත් කටයුතුවලදී, සතියේ දින හත තුල - "මරුවා" සිටින දිශාවන් හැඳින එම දිශාවට පිටුපා, ශුභ කටයුතු වල නිරත විය යුතු බවට ජ්‍යොතිර්වේදීන් ලෙස කටයුතු කරන අය විසින් ප්‍රකාශ කරනු ලැබෙයි.

පංචාංග ලිත්වලද විවිධාකාරයෙන් සටහන් මගින් සතියේ දින හත තුළ මරුගේ වාසයන් පෙන්වා දී ඇත. එම සටහන් අනුව සතියකට ඇත්තේ දින හතක් පමණක් බැවින් අටවන දිසාවේ එනම් ඊසාණයෙහි මරු නොමැති බවක් දැක්වෙයි. මෙය කොපමණ දුරට තර්කානුකූල වන්නේදැයි නොසිතිම අවාසනාවකි.

අද දවසේ ද මෙරට ජනතාව සියළු ශුභ කටයුතු අරඹනුයේ පෙරකී අයුරින් දැක්වෙන මරුට පිටුපාමින් බව නොරහසකි.

කවර හෝ කටයුත්තක් අරඹන මොහොතෙහි හෝ

ජන්මයක් (උපතක්) සිදුවූ මොහොතෙහි අදාල ස්ථානයට ලම්භකව නැගෙනහිර ක්ෂිතිජයෙන් මතු වී ඇති රාශිය එම මොහොතට අදාළ තත්කාල රාශිය හෙවත් ජන්මරාශිය (ලග්නය) ලෙස ජ්‍යොතිෂය හදාරා ඇති සැවොම දනිති. එය සම්මතයකි.

සූර්යයා උදාව වන විට "මකර" රාශිය උදාවී තිබුණේ නම් දහවල් දොළහ පමණ වන විට එම ස්ථානයට ලම්භකව නැගෙනහිර ක්ෂිතිජයෙහි වනුයේ මේෂ රාශියයි.

එසේනම් උදේ හිරු උදාවන විට තිබූ නැගෙනහිර ක්ෂිතිජය, දහවල් දොළහ වනවිට වෙනත් ස්ථානයකට යොමුවී ඇති බව පැහැදිලිය.

හිරු උදාවක සිට ලිත් පැය හැටක (ඔරලෝසු පැය විසිහතරක) කාලයක් තුලදී, පෘථිවිය මෙසේ රාශියෙන්, රාශිය පසුකරමින් පැමිණ, යළි සූර්යෝදාවත් සමඟ අළුත් දවසක් අරඹන්නේ ය. ඒ පෘථිවියෙහි භ්‍රමණ රිද්මයයි.

ඉරිදා මරු උතුරෙහි, යනුවෙන් ලිත්වල ද, ඇතැම් පොත්පත්, සඟරා ආදියෙහි ද තිබෙනු දැකිය හැකිය.

එය, එසේ වේ නම් ඉරිදා හිරු උදාවෙන විට යම් පෙදෙසකට එය නැගෙනහිර වූ බවත්, මධ්‍යාහ්නය වනවිට එම ස්ථානය වෙනස් වී - හිරු උදාවන මොහොතෙහිදී උතුර ලෙසින් ගැනුන ස්ථානය - දැන් නැගෙනහිර වශයෙන් ගැනෙන බවත් පෙනෙනු ඇත.

වත්මන් පත පොතට හා ලිත්වලට අනුව ඉරිදා හිරු උදාවේදී මරු උතුරෙහි නම්, එදින දහවල් දොළහ වන

විටත් මරු සිටිනු ලබන්නේ උතුරෙහිමද? - එසේ නැතහොත් වෙනත් තැනකද?

මරු සිටින තැන ගනිනු ලබනුයේ පෘථිවියෙහි ගමනට සාපේක්ෂවද නැතහොත් හිරු - පෘථිවිය හා සඳුට සාපේක්ෂවද?

මෙහිදී "මරු" වශයෙන් හඳුන්වනු ලබනුයේ කවර නම් වූ තත්ත්වයක්ද?

මේවා වත්මන් ජ්‍යොතිර්වේදීන් ගේ විමසුමට ලක්විය යුතුය එසේ නොමැතිව කණවැල අල්වාගත් තවත් අන්දැයින් පිරිසක් ලෙසින් අඳුරෙහි ගමන් නොකළ යුතුය. ශාස්ත්‍රීය හා අශාස්ත්‍රීය ක්‍රම අතර මෙවැනි වෙනස්කම් බොහොමයක් වත්මන් පොත්පත් වල දැකිය හැකි බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවෙයි.

"මරු" සිටින හෙවත් අහිතකර බලය පවතින දිශාව - ගැන ගන්නා ආකරය පිළිබඳව පාරම්පරික ශාස්ත්‍රය තුළ ගැබ්ව පවතී. එහිදී උපයෝගී වනුයේ හිරු, හා සඳු අතරත් - පෘථිවිය අතරත් පවතින හා සිදුවන ක්‍රියාවලින් හා ඒවායින් මතුවන අදිසි ක්‍රියාදාමයන්ගේ ක්‍රියාකාරීත්වයයි.

නැකත සඳුගෙන් ගනිද්දී, මරුවා යනු ඉබේ කඩා පාත්වන තත්ත්වයක් හෝ යම් යම් අයගේ ඇවැසිතාවයන් අනුව හිතු මතයට තැනින් තැන තැබිය හැකි අයෙකු හෝ බලයක් ද නොවන්නේය.

පාරම්පරික ගුරුවරුන් තම සිසුන් හට මෙවන් මාහැඟි ශාස්ත්‍රීය ක්‍රම ඉගැන්වීමෙහිදී - මෙම ශාස්ත්‍රීය ක්‍රමවේදයන්

ලෝකයෙහි නොවැපිරිය යුතු බවට උපදෙස් දෙනු ලැබෙනුයේ - එම ශාස්ත්‍රීය ක්‍රම තුළින් අයහපත් දෙයද සිදුකළ හැකි බැවිනි. එසේම නිදහසේ එම ශාස්ත්‍රීය ක්‍රම වේදයන් ඉගැන්වීම් සිදු නොකළ බැවින්, අද දවසේ වුවද - ඒවා බහුල වශයෙන් දැකිය හැකි නොවන්නේය.

ශාස්ත්‍රය පසෙක තිබියදී, අශාස්ත්‍රීය දේ ශාස්ත්‍රීය ලෙස ගෙන - ඒවායින් ඵල නොවන විට ශාස්ත්‍රයට ගැරහීම වැරදිය. ඊසාණයෙහි මරු නොවීම සැබෑවක් නම් - සියළු දේ ඊසාණයට සාපේක්ෂව තබා ගැනීමට හැම දෙනම වෙර දරනු ඇත. එහෙත් එවැන්නක් සිදුකළ නොහැකි බව නම් සත්‍යයකි.

මෙවන් පසුබිමක් යටතේ - "මරු" නමින් හැඳින්වෙන අනර්ථකාරී බලය පවතින දිශාවන් හා වේලාවන් ද, ඒවායේ නැවතීම් හා වෙනස් වීමාදිය ද - නිවැරදි අයුරින් ශාස්ත්‍රෝද්ග්‍රහණය කරනු ලැබූ, ශාස්ත්‍රවේදීන්ගේ මඟ පෙන්වීම අනුවම පමණක් ගෙන, ඒවා තුළින් පාරම්පරික ශාස්ත්‍රීය ක්‍රම වේදයන් ගෙන් නිවැරදි ප්‍රතිඵල ලැබිය හැක්කේය. මිනිසුන් ද උත්සුක විය යුත්තේ ඒ සඳහා මිස වල්මත් වන්නට නොවේ.

18

# අනුමෝදනාව

අද බක්පුර පෝය දවසෙහි ද බණ්ඩාර මැණිකේ උපාසක අම්මා සිල් සමාදන් වූවාය.

පන්සලෙහි දී - බණ ඇසීමෙන් ද, මල් පහන්, බුද්ධ පූජා හා දානමය කටයුතු වලටද සහභාගි වූවාය. එම සියළු කටයුතු අවසානයෙහි දී පුණ්‍යානුමෝදනා වූයේ හද පිරි සතුටින් සාදුකාර නංවමිනි. සාදුකාරය තුලින් දැන වූයේ තමන් තුල ඒ පිළිබඳව පවතින ප්‍රසන්න බවය.

අද දවසේ එදා මෙන් නොව සවස හය වන විට සිල් පවාරණය කොට නිවසට යෑමේ පුරුද්දක් ඇතිවී තිබෙයි. ඒ අනුව බණ්ඩාර මැණිකේ උපාසිකාවද, උදෑසන පටන් සමාදන් වී සිටි ශීලය පවාරණය කොට නිවසට පැමිණියා ය.

රාත්‍රී ප්‍රවෘත්ති විකාශය ඇරඹී තිබුණි. පවුලේ සෙසු අයත් සමග බණ්ඩාර මැණිකේ උපාසිකාවද ප්‍රවෘත්ති ඇසීම පිණිස වාඩි වූවාය.

ප්‍රවෘත්ති විකාශය අතරතුර... අද උදෑසන නැගෙනහිර ප්‍රදේශයේදී, යුද්ධ හමුදාව හා එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් අතර පැවති සටනකදී ත්‍රස්තවාදී සාමාජිකයින්. විසිදෙනෙකු මරා දමා ඇත. ... යනුවෙන් වාර්තා කළේය.

හොඳ වැඩේ... ඕකුංට, ඔහොම තමයි කරන්න ඕනෙ යි ... බණ්ඩාර මැණිකේ උපාසිකාව හද පිරි සතුටින් එය අනුමෝදන් වූවාය.

යුද්ධ හමුදාවේ අරමුණ කුමක් හෝ විය හැකිය. එය වෙනත් කරුණකි. සත්ත්ව ඝාතනය අකුසලයකි. අකුසලයෙන් බැහැර විය යුතුය. එසේ නොවී අකුසලය, නිවැරදි සේ දකින්නෙහි නම් එය අකුසලයට අනුගාමී වීමකි. අකුසලය වැළඳ ගැනීමක් හෙවත් අනුමෝදනාවකි. බණ්ඩාර මැණිකේ උපාසිකාවද - එදින උදෑසන පටන් ම නොයෙකුත් පිංකම්වලට සහභාගි වෙමින් සවස සිල් පවාරණය කොට නිවසට පැමිණ ඉතාමත් සුළු මොහොතකින් මිනිස් ඝාතන විස්සක් සම්බන්ධයෙන් මහා අකුසලයක්ද, සතුටින්ම අනුමෝදන් වූවාය.

අනේ අනිච්චං .... අනවබෝධය නිසා අකුසලයන් අනුමෝදන් වුන හැටි.

# 19

## ධර්මානුශාසනාව - හා බණ

ධර්මානුශාසනාව වූ කලී මිනිස් සිත නිවී සැනසීම පිණිස උපකාර වන්නකි. පරමාර්ථ හා සම්මුති සත්‍යයන් දෙකෙහි වෙනස පිළිබඳව මිනිසුන් දැනුවත් කිරීම තුළින් - සම්මුතිය හඹා යෑමෙන් දුකට පත්වන මිනිසා හට - ඉන් ගැලවී ගැනීමට මඟ පෙන්වීමත් - එවන් යථාවබෝධයක් සිතෙහි තැන්පත් වීමත් සිදුවන්නේ ය.

එහෙයින් ම ධර්ම දේශනාවලට සවන් දීමට අපි කැමැත්තෙමු. මමද කැමැත්තෙමි. එහෙත් අද දවසේ අපට අසන්නට ලැබෙන්නේ ධර්ම දේශනාවන් නොව හැඟීම් කුප්පවන ආවේගය ඇතිකරනු ලබන ආවේගශීලි භාෂණයන්ය. බණ යන්නෙහි යථාර්ථය කුමක් වුවත් - මෙවැනි දේශණයන්ටද "බණ" යැයි කීමට මිනිසුන් පුරුදු වී සිටිති.

පෝය දිනක ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් ඔස්සේ - ධර්මය දෙසීම පිළිබඳව ප්‍රසිද්ධ යැයි සම්මත ධර්ම කථිකයන්

වහන්සේ නමක් විසින් පවත්වනු ලබන ධර්ම දේශනයක් සවන් දීම සඳහා මම ද කල් ඇතිව සූදානම් වී සිටියෙමි.

නියමිත වේලාවට ධර්ම දේශනය ආරම්භ විය. මා මෙසේ ධර්ම දේශණයැයි හඳුන්වන්නේ එය ආරම්භක අවස්ථාවෙහිදී ධර්ම කාරණා තිබූ බැවින් පමණක්මය යන්න සඳහන් කළ යුතුව ඇත.

ධර්ම දේශණය ඇරඹී විනාඩි කිහිපයක් ගතවත්ම - දේශකයාණන් වහන්සේ විසින් තමන් මාතෘකා කොටගත් "කාලීන ප්‍රශ්ණයක් පිළිබඳව කරුණු දක්වන්නට වූයේය.

කාලීන ගැටළුව නිමිති කොට ගනිමින් හරවත් යමක් දෙසාවියැයි මම ද අපේක්‍ෂාවෙන් පසුවීමි.

උන්වහන්සේ කාලීන ප්‍රශ්ණය පිළිබඳව තියුණු විවේචනයක් ඉදිරිපත් කරන්නට විය. අදාල ගැටළුව එම දේශණය සවන් දෙන්න වුනට ද මුහුණ පෑමට සිදුවී ඇති එකක් බැවින් - පොදුවේ පමණක් නොව එක් එක් පුද්ගලයා වශයෙන්ද දේශණයට ආකර්ෂණය වන බවක් පළ වුනේය.

ක්‍රම ක්‍රමයෙන් දේශක ස්වාමීන් වහන්සේගේ ද ආවේගශීලීත්වය වැඩිවන බවක් පනුණි. උන්වහන්සේගේ ස්වරය උච්ච විය. අභියොගාත්මක විය. ආවේගශීලීත්ව යෙන් පිඩාවට පත් මනසින් යුතු උන්වහන්සේගේ අත දරදඬු විය. දබරැ හිල්ල එසවුණි. අභියෝග පිට අභියෝග උන්වහන්සේ ගේ මුවින් පිට වන්නට විය. වරෙක ස්වර උස් විය. තවත් විටෙක ස්වර පහත් විය. කෙටියෙන් කිවහොත් දේශකයාණන් වහන්සේ ගින්නට අසු වී - දැවෙමින් සිටින්නෙකු බවට පත්වී සිටියේය.

ඔහු තුළ දැල්වෙන කෝපාග්නිය දෙනෙතින් පිටවිය. - වචන ලෙසින් අභියෝගාත්මකව මුවින් පිට විය. දරදඬු කරගත් අත් පා වැනරැමාදියෙන් උන්වහන්සේ තුල පැවති දැවීමේ තරම ප්‍රදර්ශනය කළේ ය.

දේශණාව අසා සිටින්නන් උද්දාමයෙන් යුතුව ඇස් දල්වා බලා සිටියහ. ඉරියව් වෙනස් කරමින් අසා සිටියහ. දැන් දැන් ඔවුන් තුළද - අදාළ ගැටළුව හා එයට හේතු කාරක වූවන් පිළිබඳව කෝපාග්නිය දැල්වෙන්නට පටන් ගෙන ඇත. හාමුදුරුවෝ හොඳ බණක් කියනවා යැයි ඔවුන්ගේ සිතුවිල්ල වී හමාරය.

එහෙත් උන්වහන්සේ පිළිබඳව මා තුළ පහළ වූයේ හිස් බවක් මුසු හැඟිමකි. කාලීන ගැටළු හා ඒවාට අභියෝග කිරීම පෘථග්ජන පුද්ගලයාගේ ද ස්වභාවයය. එවන් තත්ත්වයට පත්වන පෘථග්ජන පුද්ගලයා මානසික වශයෙන් විඳිනුයේ අප්‍රමාණ වූ වේදනාවකි. පීඩාවකි. එසේ වේදනාවෙන් පීඩාවෙන් දුකට පත්ව් සිටින තැනැත්තාහට එවන් ගැටළු පිළිබඳ හේතු කාරණාවන් දක්වමින් ඒවාට ධර්මානුකූලව හේතුන් දක්වමින් - යථා තත්ත්වය පිළිබඳ අවබෝධ කොට දැවෙන මිනිස් සිත නිවා සනසාලීමටත් ඉන් ගැලවී යාමටත් මඟ කියාදීමට උන්වහන්සේට හැකිවූයේ නම් එය කෙතරම් උසස් පුණ්‍ය කර්මයක් වන්නේද?

ධර්මදේශණයකට සවන් දී සිත සනසා ගන්නවා වෙනුවට මෙතැනදී සිදුවූයේ "බණ" වශයෙන් හඳුන්වා ගත් ආවේගශීලි අභියෝගාත්මක දේශණයකට සවන් දෙමින් ද්වේශය ඇතිකර ගැනීමටය. කෝපාග්නිය දල්වා ගැනීමටය.

දුකින් දුකට පත්වීමට ය.

මෙවැනි දේශනාවන් දෙසීමට බුද්ධ පුත්‍රයන් වහන්සේලා අවශ්‍යය වන්නේ නැත. දේශපාලකයින් ගේ දේශනායන් තුලින් ඒවා ඇසීමේ හැකියාව ඕනෑ තරම් ඇත. ඒවා වැදි බණ ය. දුකින් පෙළෙන මිනිසාට ඕනෑ කරන්නේ දුකින් මිදීමේ මගය. සිත පවතින දුක් ගිණි නිවාලන මගය. එවන් මග කියා දෙන ධර්ම දේශනාවන්ය. මිනිස් සිතට ආවේගය ලඟ කරන දෙසුමට වඩා මිනිස් සිත නිවා සනසා ලන ධර්ම දේශනාවන් සඳහා තමන් සතු වාග් චාතුර්යය කථිකත්වය - යොදාගනු ලබන්නේ නම් ප්‍රඥා - ශීල ගුණාංගයන් ගෙන් සමන්විත බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් වෙතින් ධර්මානුශාසනාවක් ඇසූ බවට සතුටු වීමේ අවස්ථාව ලැබුණ බවට සෑම දෙනා තුළම පහන් සිත් පහළ වනු නොඅනුමානය.

# 20

## ධනවතා හා දුප්පතා

ඔහු මහා පරිමානයේ ව්‍යාපාරිකයෙකි. ව්‍යාපාරයන් ජාලාවක් ඔහු සතු ය. ඒවායින් ඔහු ලබන ධනස්කන්ධයද අසීමිත ය.

විශාල නිවෙස් - යාන වාහන දැසි දැස්සන් - පිරිවර බලයෙන් අනූන ඔහු දෙස බලන ජනතාව ඔහු ධන කුවේරයෙක් ලෙසත් සියළු සම්පතින් යුක්ත වූවෙකු ලෙසත් හඳුන්වති.

ඔහුගේ නිවස පිහිටා ඇත්තේ ජනාකීර්ණ ප්‍රදේශයක වුවත් නිසල පරිසරයක ප්‍රධාන මාර්ගයක් ආසන්නයෙහිය. ඔහුගේ නිවසට මඳක් එපිටින් පාරෙන් අනෙක් පසෙහි අම්බලමක්ද ඇත. ඒ අම්බලම අසල නගර සභාවෙන් සවිකොට ඇති විදුලි පහන් කණුවක්ද - ජල කරාමයක්ද තිබුණි.

සිරිත් පරිදි සවස් වන විට ව්‍යාපාරිකයා තම කටයුතු නිමා කොට, සුඛෝපභෝගී රථයෙන් නිවස වෙත පැමිණියේය.

දැඩි වෙහෙස කර බවකින් යුතුව තම ලිපිගොනු හා ලිය කියැවිලි සහිත බෑගයද අතටගත් ඔහු පියවර කිහිපයකින් ගෙය තුළට වැදුණේය.

සුඛෝපභෝගී නිවසෙහි පහන් දැල්වී ඇත. අවට පරිසරය අඳුරුය. අම්බලම ආලෝකවත්වී තිබුනේ පාරෙහි තිබූ විදුලි ලාම්පු කණුවෙන් විහිදුවන ආලෝකයෙනි.

උදේ පටන්ම හිඟාමනේ යෙදුන මහළු යාචක යුවළත් තම කටයුතු නිමවා සිරිත් පරිදි රාත්‍රිය ගත කිරීම පිණිස අම්බලම වෙත පැමිණියෝය. මෙය අද දවසේ ද ඔවුනගේ වාසස්ථානය වී ඇත.

තමන් සතු ලෝගුව පසෙක තැබූ මහළු යුවළ එය තුළින් එළියට ගත් බත්මුල් දෙක බිම තබා ගත්තෝය. ඇය පාරේ ඇති පයිප්පය වෙත ගොස් ඔවුන් සතුවූ බෝතලයකට වතුර එකක්ද රැගෙන විත් සිය සැමියා අසලින් වාඩිවී තම රාත්‍රී භෝජනය සප්පායම් වන්නට විය.

මේ වනවිට ව්‍යාපාරිකයාගේ නිවසෙහිද රාත්‍රී භෝජනය සූදානම් වී ඇත. අලංකාර අයුරින් සකස් කර රසමසවුලෙන් පිරුණු කෑම මේසයක් එහි විය. එම මේසය වටා වරකට එක් අයෙකු දෙදෙනෙකු නොව දොළොස් දෙනෙකු පමණ වාඩි විය හැකි, අහර ගැනීමේ හැකියාව ඇති එකකි.

ව්‍යාපාරිකයාද ඔහුගේ බිරිඳ දරුවන් හා තවත් කිහිප දෙනෙකු සමඟ රාත්‍රී ආහාරය සඳහා මේසය වටා වාඩි ගත්හ. ව්‍යාපාරිකයා තම පිඟාන ගෙන ආහාර බෙදාගැනීමට සූදානම් විය. ඒ සමගම ඔහුට වෛද්‍යවරයා විසින් ලබා දී තිබූ උපදේශයන් සිහිපත් විය.

කොලෙස්ට්‍රෝල් වැඩිකර ගන්න එපා, ලේ වල සීනි ප්‍රමාණය වැඩි වුනොත් ඔබගේ ජිවිතයට හානිවන්න පුළුවනි. ඒ නිසා තම්බාපු එළවලු ටිකක් එක්ක පාන් පෙත්තකට වැඩිය කන්න එපා.

තම වෙහෙසින් උපයාගත් ධනයෙන් සූදානම් කළ රස මසවුලෙන් පිරුණු ආහාර, අන් අය විසින් සතුටින් භුක්ති විඳින කළ ඉතාමත් ලඝු ආහාරයකින් තෘප්තිමත් වීමට ධනවත් ව්‍යාපාරිකයා හට සිදු විය.

රාත්‍රී භෝජනයෙන් පසුව ටික වේලාවක් අල්ලාප සල්ලාපයේ යෙදුන ඔහු වායු සමීකරණය කළ කාමරයක සුඛෝපභෝගී ඇඳමත වැතුරුණේ නිදා ගැනීම පිණිසය.

මේ මොහොත වන විට තමන් රැගෙන පැමිණි රාත්‍රී ආහාරය අනුභව කළ මහළු යුවල අම්බලම තුළ අතුරාගත් පත්තර කැබලි කිහිපයක් මත සැතපී සුව නින්දට පත්ව සිටියහ.

ව්‍යාපාරිකයා වෙත නින්ද පැමිණියේ නැත. පසුදින නැවගත කරන්නට තිබෙන බඩු පිළිබඳව සිතුනි. සේවකයන්ගේ වැටුප් ගෙවීමට ඇති බවත් සිතුනි. බැංකුවේ අයිරාවට මුදල් දැමිය යුතු බවත් සිතුනි. අළුතින් ලාභ ලැබිය හැකි මුදල් යෙදවුම් ගණු දෙණු ගනනාවක් ගැන සිතුණි. මෙවන් සිතුවිලිත් සමග ඔහු වෙත නින්ද ළඟා වූයේ නොවේ. නින්ද තව තවත් ඈතින් ඈතට ගියේය. රාත්‍රිය ඉක්ම යමින් ඇත. කෙසේ හෝ අවසානයේ ව්‍යාපාරිකයා නිදි වැළඳ ගත් බවක් පෙනෙන්නට තිබුණි.

කිසිවක් මහ හඬින් පෙරළුණි. එම හඬින් තිගැස්සී

අවදිවුන ව්‍යාපාරිකයා තමන් අසල තිබූ ගිනි අවියද රැගෙන විදුලි පහන් දල්වා කාමරයෙන් බැහැර විය.

සඳළුතලයේ සිට බලන ඔහුට නිදි වර්ජිතව ආරක්ෂාවෙහි යෙදෙන මුරකරුවන් දෙදෙනාම පෙනින. ඔවුන් අවදියෙනි. පෙරළුන කිසිවක් දැක ගන්නටද නැත. ඇතැම් විට එය මහ පාරේ ගමන් ගත් බර වාහනයක් වලක වැටීමෙන් ඇතිවූ හඬක්ද විය හැකිය.

යළි කාමරය තුළට වැදුන ව්‍යාපාරිකයා වතුර විදුරුවක්ද බී විදුලි පහන නිවා යළි නින්දට සැරසුණි. පළාගිය නින්ද එකවරම ඔහු වෙත පැමිණියේ නැත. කෙසේ වෙතත් ඔහුට නින්ද ගියාද නොගියාද කිව නොහැකිය. ඔරලෝසුව නාද වන්නට විය. ව්‍යාපාරික ධනවතා ඇඳ මත වාඩිවිය. සිරුරට දැනෙනුයේ දැඩි කෙඩෙත්තු ගතියකි. නිදාගන්න ඕනෑය. එසේ වුවත් එය කළ නොහැකිය. ඔහු අමාරුවෙන් නැගිට ගොස් දවසේ කටයුතු අරඹන්නට සූදානම් විය.

හැඳ පැළඳගත් ඔහු උදේ ආහාරය සඳහා මේසයට වාඩි විය. උදේ කෑම මේසයද රස මසවුලෙන් පිරී පැවති නමුදු ඔහුට සිදුවූයේ වෛද්‍ය උපදේශයට අවනත වී ලුණු ආහාර වේලකින් තෘප්තිමත් වීමටය.

රාත්‍රියේ හරිහැටි නින්දක් නොමැති වුයෙන් විඩා බර ගතියෙන් යුතුව ගොස් ඔහු වාහනයට ගොඩ වූයේ ස්වකීය ව්‍යාපාරික කටයුතු වල නිරතවීම පිණිස කාර්යාලය වෙත යෑමටය.

තම වාහනය මිදුලෙන් මහපාරට ගනිත්ම ඔහුගේ

නෙත යොමු වූයේ අසල අම්බලමෙහි රාත්‍රිය ගතකොට දෛනික කටයුතු සඳහා පිටත්ව යන මහළු යුවළ වෙතය.

කුස පුරා අහර ගෙන රාත්‍රිය මුළුල්ලෙහි හොඳින් නිදාගත් මහළු යුවළ පාර අයිනේ වූ පයිප්පයෙන් මුව කට දොවා ගෙන නැවුම් බවකින් යුතුව උදාවූ දවස සඳහා සිනහවෙන් පිරි කතා බහකින්, හදපිරි සතුටින් යුතු වූ එම යුවල පා ගමනින් ඉදිරියට ඇදුනෝය.

ධනවත් ව්‍යාපාරිකයා වාහනයේම සිට මහළු යාචක යුවළ දෙස බලා සිටියේය.

ඔහු තුළ පහළ වූයේ කවර නම් හැඟීමක්දැයි කියන්නට කවරෙකුහට හැකිවේද?

සතුට ඇත්තේ කොතැනකද?

# 21

# ශ්‍රද්ධාව - දානය හා පින

දන්දීමෙන් තෘෂ්ණාව නැති කළ නොහැකිය. එහෙත් ලෝභය නම් දුරුවිය හැකිය. වත්මන් බොහෝ දෙනෙකු දන් දීම කරනු ලබනුයේ ලෝභය දුරු වීම පිණිස නොවේ. මතු සම්පත් අපේක්ෂාවෙනි. එයින් සසර ගමන දිගුවීම මිස, සසර කෙටිකර ගැනීමක් නම් අපේක්ෂා කළ නොහැකිය.

භෝජන පිරිනැමීමෙන් මතු කලෙක දිව්‍ය භෝජන ලැබෙනු ඇතැයි ඇතැමෙකු විශ්වාස කරයි. රෙදි පිළි සිවුරු දන් දීමෙන් මතු භවයෙහි දී දිව්‍ය සළු භාවිතයට ලැබේ යැයි සිතති. වාහන දන් දීමෙන්, මාතලී වැනි රථාචාර්යයන් සමග දිව්‍ය වාහන ලැබේ යැයි සිතති. ඒවා ලැබීමට අපේක්ෂාවෙන් පසුවෙති. ගොඩනැගිලි තනා දීමෙන් අනාගත ජන්ම වලදී දිව්‍ය මාළිගා හෝ එවැනි ප්‍රාසාදයන් ලැබේ යැයි සිතති. ලැබීමට අපේක්ෂා කරති. මේවා තෘෂ්ණා සහගත සිතුවිලිය. ලෝභය ඉහ වහා ගිය අවස්ථාවන්ය. මෙවැනි අරමුණු සහිතව දන් දීමට ඉදිරිපත් වන්නන්ගේ ක්‍රියාවන්, අධික ලාභයන්

සහිතව හෝ පොළියටත් පොළියක් ලැබීමේ අපේක්ෂාවෙන් ගෙන් යුතුව කරනු ලබන ලෝභ සහගත ආයෝජනයන් වැනිය.

දානයක් දීමේදී මහා වස්තු සම්පත් අවශ්‍ය වන්නේ නැත. අවශ්‍යය වන්නේ ඒ සඳහා අවස්ථාව හා ශ්‍රද්ධාවය. අවස්ථාව එළැඹි කළ නිස්සරනාධ්‍යාශයෙන් දෙනු ලබන දානය මහත් ඵල මහානිශංශ දායකය. එහි ඵලය හෝ අනිශංශය පිළිබඳව දායකයා විසින් කවර ආකාරයක හෝ ලෝභයක් හෝ හැඟීමක් ඇතිකර ගත යුතු නොවේ. තිබිය යුත්තේ ශ්‍රද්ධාව හා පිරිනැම්මේ ඕනෑ කම පමණි.

එවැන්නක් මෙසේ විය හැකියැයි අපි මඳකට හෝ සිතමු. දිළිඳු මිනිසුන් වෙසෙන පෙදෙසක එක්තරා රැයකදී, එහි පැල්පතක වෙසෙන අයෙකු බඩෙහි හටගත් වේදනාවකින් පෙළෙන්නට විය. ඔහුගේ වේදනාව දුරු කර ගැනීමට අවශ්‍යය ඖෂධය ඔහු ළඟ තිබෙන නමුදු, එය දියකර ගැනීම සඳහා දෙහි යුෂ නොමැති කමින් වේදනාවෙන් පෙළෙන ඔහුගේ කෙඳිරිලි හඬ හිස් වායු තලය සිසාරා පැතිර යමින් තිබුණි. එම කෙඳිරිලි හඬ අසල් වැසි නිවැසියන්ගේ සවන්වලද පතිත නොවූයේ නොවෙයි. එහෙත් එහි නිවැසියන් බොහොම දෙනෙකු එකෙකු හට, එකෙකු නොදෙවෙනි ආකාරයේ දිළින්දන්ය. අසරණයින්ය. හැකියාවක් ඇත්තෙකු හට වුවද මේ මැදියම් රැයෙහි දෙහි ගෙඩියක් මිලදී ගැනීමට නම් තැනක් නැතිවිය.

දිළිඳු බවින් මිරිකෙමින් සිටි අසළ නිවසක කාන්තාවක්ද, මම වේදනාත්මක කෙඳිරිලි හඬින් කම්පිතවී සිටියාය. ඇගේ

නිවසෙහි දෙහි ගෙඩියක් නොව, දෙහි බෑයක් විය. එම දෙහි බෑය ඇය විසින් ප්‍රවේශම් ලෙස තබා තිබුනේ පසු දින උදයේ පාසැල් යන තම දරු දෙදෙනාහට ආහාර වේලක් සකස් කර දීමේදී ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් යුතුවය.

තමන් සතුව දෙහි බෑයක් ඇති බව ඇයට සිහිපත් විය. නොපමාව එය රැගත් කාන්තාව රෝගියා සිටි අසල් වැසි නිවස වෙත ගොස් තමන් සතුව තිබූ දෙහි බෑය එම නිවැසි කාන්තාව හට දුන්නාය.

ළමයින්ට උදේට මොනව හරි දෙන්න බැරියැ.... යි ඇ සිතුවා ය.

නිවැසි කාන්තාව වහ වහා දෙහි බෑයෙන් යුෂ මිරිකාගෙන බෙහෙත් ගුලිය දිය කොට රෝගියා හට දුන්නා ය. එය පානය කළ රෝගියා අසල්වැසි නිවැසි කාන්තාව වෙත හෙළුයේ කෘතවේදී බව පළ කරන බැල්මකි. ඔහු පිං සිදු වේවා කියා වචනයෙන් නොකිවද, වේදනාව දුරුවන විට ඔහු තුළ පහළ වෙමින් තිබුනේ පිනායන සිතකි. එය ඔහු කෙරෙන් බැහැර වූයේ ඔහු විසින් හෙලූ කෘතවේදී බැල්ම තුළිණි. ඇය ආපසු ගෙදර ගියාය. ඒ වන විට කෙඳිරිලි හඬ මුළුමනින්ම නැවති තිබුණි. කෙඳිරිලි හඬ නැතිවීම ඇයට සතුටකි. වේදනාවෙන් පෙළුන අයෙකු තමන් විඳි වේදනාවෙන් මිදී ඇත. සුවපත් වී ඇත. වේදනාවෙන් පෙළුන කෙනෙකුව ඉන් ගලවා ගැනීමට උපකාර කිරීමට හැකිවීම පිළිබඳව ඇය තුළ වූයේ සතුටකි. ප්‍රීතියකි. සැබැවින්ම එය නිරාමිස ප්‍රීතියකි. එහි සුවය ඇය නිහඬවම අත් වින්දාය.

විශාල මුදලක් වැයකොට, අතිමහත් ප්‍රචාරයක් ලබා

දෙමින්, තම නමින් පිංකම් කරන්නවුන් වශයෙන් ලෝක මානය හමුවෙහි බෙහෙත් කන්ටේනරයක් බෙදා දුන්නේ වුවද ඔවුනට ලැබිය නොහැකි වූ චිත්ත ප්‍රීතියක්, සහිත විශාල පිංකමක් දිළිඳු පැලක සිටියේ වුවද ඇය විසින් සිදු කොට තිබුණි. දානමය පුණ්‍ය කර්මය පිළිබඳව අවබෝධයෙන් යුතුව ඒවා සිදු කරනු ලබනුයේ නම්, එය මහත් ඵල දායක වන්නේමය.

මහා ධන සිටුවරුන් බුදුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහනසේලා හට දානය පිරිනමද්දී, ඒවා සූදානම් කිරීමට ශ්‍රමය කැප කළ සේවකයින්, දානමය පූජා අවස්ථාවේ ඇති කරගත් පුණ්‍ය චේතනානු භාවයෙන්, දෙව්ලොව දෙව් සභාවෙහි නායකයාව ජන්මය ලබද්දී දානය පූජා කළ දායක සිටුවරයා, එහි දෙවියෙක් ව උපන් බවක් බෞද්ධ සාහිත්‍ය පොත්වල තිබෙනු ද දැකගත හැකිය.

# 22

# පිස්සෙක්... තවත් පිස්සෙක්

ධනවත් ව්‍යාපාරිකයෙකු වූ ඔලිවර් ජයතිලක මානසික රෝගීන් සඳහා වූ රෝහලක් වෙත ගියේ, එහි නේවාසිකව ප්‍රතිකාර ගන්නා වූ තම හිතවතෙකු වූ ප්‍රැන්සිස්ව බැලීම සඳහාය. ඔහු තම මිතුරා නේවාසිකව සිටි ගොඩනැගිල්ලට පිවිසෙත්ම ඉන් පිටවන අර්ඩ්ලිව දුටුවේය. අර්ඩ්ලි යනු ඔලිවර් ජයතිලකගේ හිතවතෙකි. ගොඩනැගිල්ලෙන් බැහැරවන අර්ඩ්ලිද - ඔලිවර්ව දුටුවේය.

හලෝ ඕ. ජේ..... කොහොමද?

.... ආ... අර්ඩ්ලි.... බොහොම කාලෙකින්... කොහොමද දැන්....

වරදක් නැහැ. ඕ. ජේ.... ඒක නෙවෙයි මොකද මේ පැත්තෙ... ප්‍රශ්ණයක් නැගුවේ අර්ඩ්ලිය.

සැම්ව බලල යන්න කියල ආවා... මිනිහව මෙහෙ නවත්වල ඉන්නෙ....

හරි... හරි... ඕ.ජේ. මමත් ආවෙ සැම්ව බලන්න තමයි.... මිනිහව ඊයේ ... එයාගෙ පුතා ඇවිත් එක්කර ගෙන ගිහිං.... මිනිහට දැන් හොඳයිලු...

ආ... එහෙම නම් කමක් නැහැ... මොනව වුනත් අපි දෙන්න අද හමුවුන එකත් හොඳයිනෙ... එහෙම නේද අර්ඩිලි.. අපි යමුකො අර ගහ යටට... දෙදෙනාම කථා බහෙන්ම ගස දෙසට පියමං කරන්නට විය.

ඔව්... ඔව්... මටත් විවේකයක් තිබුනෙම නැහැ... අදත්... මම හදිසියෙන්මයි ආවෙ.... දැනුත් මොනව කරගෙනද දන්නෙ නැහැ.... ඕ. ජේ. ..... ඔයාට පහුගිය කාලෙ ප්‍රශ්ණ ගණනාවක් ඇතිවුනාලු නේද?...

ඒක නොවෙන්නම්... බලන්න අර රෙපිය, කොහේ හිටපු එකෙක්ද?.... මම ඒකව සමාජයට ගෙනල්ල... අළු ගහල දාල නගගල ගත්තා. අර්ඩිලි දන්නවනෙ... මිනිහ දැන් මාව හෙලා දකිනවා... මිනිහට මුල මතක නැතිවෙලා. දැන් ඒකා මට අභියෝගයක් වෙලා. .... ඌව ඔතැනට ගේන්න මම කරපු දේවල් කොච්චරද?... ඔලිවර් ජයතිලක කීවේය.

අයියෝ සර් ගනන් ගන්න එපා...

.... මිතුරන් දෙදෙනාම ඒ හඬ පැමිණි දෙසට නෙත් යොමු කළෝය.

ඔවුන් සිටි ගස යට බංකුවක් මත වාඩිවී සිටි මානසික රෝගියෙකුව ඔවුනගේ නෙත් ගැටුණි. ඔහු මානසික රෝගියෙකු ලෙස ඔවුන් නිගමනය කළේ එම පුද්ගලයා මානසික රෝහලෙහ

නේවාසික රෝගීන්හට නිකුත් කරනු ලබන ඇඳුමෙන් සැරසී සිටි බැවිනි.

සර්... ඕව ගණන් ගන්න එපා. ... මානසික රෝගියා යළිත් කථා කළේය. දැන් බලන්න අහස දිහා. හිරු බොහොම තේජසින් බැබලෙනවා. ... ඒක එයාගෙ බලය. හිරු අහසෙ බැබලෙන කොට වතුර තියෙන්නෙ පොළොවේ... හිරුගේ තේජස නිසා රත්වෙන වතුර වාෂ්ප වෙලා ඉහළ නගිනවා. .... හිරුගේ තේජස නොලැබෙන්න වතුරට කවදාවත් ඉහළ යන්න ලැබෙන්නෙ නැහැ... ඉහළ නැඟුන ජල වාෂ්ප එකතුවෙලා වළාකුළු හැදෙනවා. ... හැබැයි ඒ කිසිම වළාකුලකට හිරුගේ මායිමකට වත් යන්න බැහැ. ... ඒත් එයිට පහලින් හරි ඒකරාශි වන වළාකුළු හිරුව වසා ගන්නවා. ... පොලොවෙහි අපිට හිරුව පේන්නෙ නැහැ. ... හිරුගෙ තේජස නැහැ. හැබැයි හිරුගෙ තේජස අඩුවෙලා නැහැ. වළාකුළු නිසා ආවරණය වුණා පමණයි. වළාකුලට මුවාවුනයි කියල හිරුගේ තේජස අඩු වෙන්නෙත් නැහැ. ... හිරු කම්පා වෙන්නෙත් නැහැ. හිරුගේ කටයුතු එයා පවත්වා ගෙන යනවා. ... හැබැයි වළාකුළුවලට එහෙම බැහැ. ... එක්කෝ සුළඟට ගහගෙන යනවා. එහෙම නැත්නම් යළිත් වතුර බවට පත්වෙලා ආපසු පොළවට පතිත වෙනවා. ... ඔය කොයි ආකාරයෙන් වුනත් හිරුගේ පිහිටෙන් ඉහළ ගිය එකා ආපසු පහලට වැටෙනවා. එතකොට හිරු පුරුදු විදිහටම බැබලෙනවා ආපහු දකින්න පුළුවන්. ..... ඒකයි ස්වභාවය. මහත්තයත් ..... ඉහළ නග්ගපු එකා ගැන හිත හිතා දුර්වල වෙන්න එපා. ... මහත්තයාගේ තේජස වැඩිකර ගන්න. ... නැත්නම් තියෙන තේජස එහෙමම පවත්වා ගන්න. ඔය

මොකා ඉහළ ගියත් ආපහු පහළට එනවා. .... ඔහු කීවේ සිනහසෙමිනි.

මිතුරන් දෙදෙනා තුෂ්නිම්භූතව - එකිනෙකා දෙස බලා ගත්වනම සුළු මොහොතක් සිටියෝය. යන්තම් හෝ කථා කරගන්නට දිරිය ලැබුණු මොහොතෙහිම අර්ඩිලි කථා කළේය.

මහත්තයෝ .... ඔය මහත්තයට ඇත්තටම පිස්සුද.....?

ඔහු සිනහසුනේය. ..... පිස්සුද මහත්තයෝ.

.... හැම පිස්සම හිතන්නෙ අනෙක් එකාට පිස්සුයි ..... කියල නෙ... ඔහු පැවසුයේ කිසිඳු පැකිලීමකින් තොරවය.

# 23

## බෞද්ධයා යනු

"සත්‍යය" යනු එකක්ම පමණි. එය කිසිදාක වෙනස් නොවන්නේම ය. වෙනස් නොවන එකම ධර්මතාවය "වෙනස්වීම" ම පමණකි. එහෙයින් එය වනාහි පරමාර්ථ සත්‍යයයි. එම සත්‍යය බුදුන් වහන්සේ විසින් අවබෝධ කොට, ලෝකයා හට දේශණා කළ බැවින් එය ආර්‍ය සත්‍යය යනුවෙන් ද හඳුන්වනු ලැබෙයි. එය පිළිබඳව තත්ත්වාබෝධය ඇතිවන විට පහළ වනුයේ විද්‍යාවේ සත්‍යාලෝකයයි. එම ආලෝකයෙන් සසර පිළිබඳව සියළු තතු විද්‍යාමාන වන්නේය. ආර්‍ය සත්‍යය හැරුණු කොට සෙසු සියළු දේ සම්මුතින්ය. සම්මුතින් නිරන්තරයෙන් ම වෙනස්වීම් වලට බඳුන් වන බැවින් ඒවා කිසි දිනෙක සත්‍යය නොවෙන්නේමය.

වෙනස්වන ධර්මතාවයන් හි ගැටෙමින්, ඒවා වෙනස් නොවන, සදාකාලික දේ හැටියට ගැනීම මිථ්‍යාදෘෂ්ඨිය හෙවත් වැරදි දැකීමයි. එය තුළ ඇතිවන්නේ මෝහයයි. ඒ ඔස්සේ

ඇතිවන සම්මුතින් හි ගැලෙමින් සත්ත්ව, පුද්ගල, සංසාර ගමන පවත්නේ වෙයි.

සියල්ල වෙනස් වන ධර්මතාවය යනු අනිත්‍ය ස්වභාවයයි. අනිත්‍යය යනු පැවැත්මක් නොමැති බවය. නොපවතින දේ, පවතින දේ ලෙස ගනිමින් මුළාවට පත් වී, ඒවා නිත්‍ය වශයෙන් පවත්වා ගැනීමට යොමු වීමට- වෙරදැරීම ම දුකට හේතුවයි. නිත්‍ය ලෙසින් උපාදානය කරගෙන සිටින දෙය, නැතිවන විට දුක්වන්නේ සත්‍යාවබෝධයෙන් තොරව අවිද්‍යාවෙහි ගැලී සිටීම නිසාය. පරමාර්ථ සත්‍යය අවබෝධ කොට නොමැති නිසාය.

පරමාර්ථ සත්‍ය පිළිබඳව යොමු නොවූ හෝ අවබෝධ නොකළ තැනැත්තා කිසි දාක බුදුන් වදාළ මඟ ගමන් කරන්නෙක් නොවෙයි. එබැවින් බුදු මඟෙහි ගමන් නොකරන්නා, බෞද්ධයෙක්ද නොවෙයි. බෞද්ධයා යනු ආර්‍ය මාර්ගයෙහි ගමන් කරන්නාමය. ලෝක ධර්මතාවයන් හමුවෙහි දී නොසැලී සිටින්නාය. සත්‍ය දකින්නාය. හේතුඵල ධර්මාවබෝධ කරන්නාය. හෙතෙම කිසි කලෙක ජයග්‍රහණය හමුවෙහි උද්දාමයට පත්වන්නේ හෝ පරාජය හමුවෙහි දී හඬා වැටෙන්නෙකු නොවේ.... එවැන්නා සැබැවින්ම බෞද්ධයෙකි.

# 24

## උපේක්ෂාව හා අපේක්ෂාව

**අපේක්ෂාව** ඇති තැන '**උපේක්ෂාව**' පළා යයි. එවිට එහි ශේෂ වන්නේ ලෝභය, ද්වේශය, මෝහ, ක්‍රෝධ, වේදනා වැනි ක්ලේශයෝය. ඒවා මිනිසාව සසරට බැඳ තබයි.

**අපේක්ෂාව** නැති තැන '**උපේක්ෂාව**' රජ කරයි. එවිට එහි පවතිනුයේ මෛත්‍රී, කරුණා, මුදිතාව පිරි කුසල් සිත්ය.

එවන් සිත් මිනිසාව සසරින් ගලවා නිවනට ළංකරවයි.

# 25

## දිගු ගමනක අතර මගදී

නායක හාමුදුරුවන් බණ මඩුවෙහි අසුනක වාඩි වී සිටියේය. එය බණ මඩුවෙහි ඇති ධර්මාසනය නොවීය. උන්වහන්සේ අසලින් පන්සලට නිතර යන එන කිහිප දෙනෙකු මිටි අසුන් කිහිපයක වාඩි වී සිටියෝය.

පන්සල් වත්තට පිටින් නවතන ලද වාහන කිහිපයකින් බැසගත් නිල ඇඳුමින් සැරසුන සන්නාහ සන්නද්ධ භටයින් කිහිප දෙනෙකුගේ දැඩි පරීක්ෂාව, වට පිටාව වෙත යොමුවෙද්දී වෙනත් වාහනයකින් එළියට පැමිණි සකලසූරිය මහතා පන්සල් වත්තට පිවිසෙන විටම බණ මඩුවෙහි අසුන්ගෙන සිටින නායක හාමුදුරුවන්ව දුටු හෙයින් හෙතෙම ඒ දෙසට පියමං කළේය.

සකලසූරිය මහතා ගමේ සිටි කැපී පෙනෙන අයෙකි. මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වූ හෙතෙම දැන් ප්‍රබල ඇමතිවරයෙකි. තනතුරු ලබන්නට පෙරදී නිරතුරුවම පන්සල ඇසුරුකළ නමුදු - ඔහු දැන් දැන් පන්සලට එන්නේ

කලාතුරකිනි. එයද සිදුකරනු ලබනුයේ මතු අපේක්ෂාවකින්ම විය යුතුය. ගමේ සහ ගම අවට ප්‍රදේශවල ජනතාව ගෙන් බොහොමයක් පන්සලේ නායක හාමුදුරුවන්ගේ අවවාද අනුශාසනාවලට පිටින් නොයන බැවි හෙතෙම තේරුම් ගෙන සිටීම ද මෙයට මූලික හේතුවක් විය හැකිය.

නායක හාමුදුරුවන් අසලට ගිය සකලසූරිය ඇමතිවරයා දෙකට නැවී නායක හාමුදුරුවන්හට නමස්කාර කළේය.

.... සුවපත් වේවා ... මහත්තය වාඩි වුනානම් .... යි කියා නායක හාමුදුරුවෝ පැවසිය.

නායක හාමුදුරුවන් අසලම තිබූ මිටි අසුනෙහි වාඩිවී සිටි තැනැත්තා ඉන් ඉවත් වී පසෙක තිබූ වෙනත් අසුනක වාඩිවූ හෙයින් සකලසූරිය ඇමතිවරයා නායක හාමුදුරුවන් අසලවූ මිටි පුටුවෙහි අසුන් ගත්තේය.

සකලසූරිය මහත්තය කාලෙකින්නෙ මේ පැත්තෙ ආවේ...'යි නායක හාමුදුරුවන් හඬ අවදි කළේය.

එහෙමයි අපෙ හාමුදුරුවනේ. මාස හතරකට විතර ඉස්සර පන්සලෙහිදී ආරක්ෂක අංශවලට හා රටට සෙත්පතා පවත්වපු පිංකමෙන් පස්සෙ එන්න බැරිවුනා. රාජකාරි කටයුතු නිසා හරිම අවිවේකයි. නැතිව පන්සල අමතක කරලා එහෙම නොවෙයි.

මම නොදන්නවයැ සකලසූරිය මහත්තය ගැන. මට අමුතුවෙන් දැනගන්න යමක් තියෙන එකක් යැ.

හාමුදුරුවනේ.... මම ඔබ වහන්සේට පූජා කරන්න අඩි

පහක පිත්තල පහනක් ගෙනාවා. ඔබ වහන්සේ ඒක පිළි අරගෙන තියන්න හොඳ තැනක් කියන්න. මොකද ඒ වගේ දෙයක් පන්සලකට ඕනෙම කරන දෙයක් නේ....

සකලසූරිය මහතාගේ හඬ ගැඹුරුය. ඒ මොහොතෙහිද මුහුනෙන් දිස් වූයේද මහේශාක්‍ය බවකි.

අනේ මහත්තයෝ.... ඕවා කොහේ තියන්නද? බලන්න පහන් වැට දිහා, පන්සල් වත්තම එළියයි. ලයිට් තියෙන නිසා ආවාස ගෙයත් බණ මඩුවත්, බුදු මැදුරත් ආලෝකමත්. හදිසියෙන් වත් ලයිට් නැතුව ගියොත් ආවාස ගෙයි තියෙන පුංචි පහන පත්තුකර ගත්තහම සෑහෙනවා.... මේ වගේ අනිවාර්ත දේවල් කොහේ තියාගන්නද? අනික ඕවා රකින්න පුළුවන් කාටද? හාමුදුරුවන්ගේ හඬ සිහින් නමුත් පැහැදිලිය.

නැහැ... හාමුදුරුවනේ, මම අදහස් කළේ මේ වගේ දෙයක් තියෙන එක පන්සලට වැදගත් වෙයි කියල...යි. සකලසූරිය මහතාගේ හඬ නතර වන්නට පෙර හාමුදුරුවන්ගේ හඬ යළි අවදි විය.

පන්සලට වැදගත් වෙන්නේ දහම, ශීලය, විනය, අනුශාසනාව, මඟ දැක්වීම්, ශික්ෂාව, වගේ දේවල් මහත්තයෝ... ඒවා නැතිව නිකම් භෞතික දේවල් තිබුනාට පන්සල පන්සලක් වෙන්නේ නැහැ. කොහොම වුනත් මහත්තය දානමය චේතනාවෙන් ගෙනා දේ නොවැ.... හොඳයි මම ඒ දානය පිළිගත්තා කියලා හිතාගන්න කෝ....

සකලසූරිය මහතාගේ මුවගට සිනාවක් නැගුණි. එහෙමයි අපෙ හාමුදුරුවනේ....

එහෙනම් දැන් මහත්තයට සතුටුයි නේද?

හැබැවටම අපෙ හාමුදුරුවනේ... සතුටුයි.

එහෙනම් දැන් මම මහත්තය ගෙන් යමක් ඉල්ලන්න මහත්තය ඒක ඉටුකරනවනෙ.... හාමුදුරුවන්ගේ එම ප්‍රකාශය ඇසෙත්ම සකලසූරිය මහතා තුළ ඇති වූයේ ව්‍යාකූලතාවයකි. මොනවා ඉල්ලන්න යනවාදැ'යි කුකුසක්ද ඔහුට වද දුන්නේය. මොනවා වුවත් ප්‍රතික්ෂේප කළ නොහැකි තැනකට ඔහු ඇද වැටුනෙන් ව්‍යාකූලතාවය මැඩගෙන කථා කරන්නට විය.

එහෙමයි.... එහෙමයි... ඔබ වහන්සේ නිරර්ථක දේවල් ගැන කථාකරන්නේ නැහැ නෙ. ඒ නිසා ඔබ වහන්සේ ඉල්ලන දෙය කරන්නම්. ඔබ වහන්සේගේ ඕනෑකම කියන්න.

බොහොම හොඳයි මහත්තයෝ..... යමක් වේනම් නිශ්චල තැනක එය තිබෙනවාට වඩා ප්‍රයෝජනයක් ගත හැක්කෙකු ට එය දෙනවා නම් ඒක වඩාත් සුදුසුයි නේද මහත්තයෝ.....

... එහෙමයි, අපෙ හාමුදුරුවනේ..... වෙනත් කිසිවක් සිතාගන්නටද පෙර සකලසූරියගේ මුවින් පිටවිය.

බොහොම හොඳයි.... අන්න ඒ නිසා දැන් මොහොතකට කලින් අපිට පිළිගන්වන්න තිරණය කළ පිත්තල පහන... ඒකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් කෙනෙකුව හොයල.... ඒ අයට දෙන්න. එතකොට පිංකම් දෙකක්ම සිද්ධ වෙනවා. පහන අපිට පූජා කරන්න මහත්තයගෙ හිතේ තිබුණ අරමුණ අපි පහන පිළිගැනීම නිසා ඉටුවෙනවා ඒ පුණ්‍ය කර්මය සම්පූර්ණයි.... දැන් ඒකෙන් ප්‍රයෝජනයක් ගත හැකි අයෙකුහට

ඒක භාර දෙනවා.... ඒක ලබන අයත් සතුටට පත්වේවි! ඒකත් පිනක්....

සකලසූරිය පත්වූයේ දැඩි අසිරුතාවයකටය. එහෙත් විරුද්ධ වීමේ හැකියාවක් ඔහු තුල නැත.

එහෙමයි හාමුදුරුවනේ... ඔබ වහන්සේගේ කැමැත්ත ඒක නම් ... මම එහෙම කරන්නම් ....යි ....තමා තුළ පවතින ව්‍යාකූලතාවය යටපත් කරගන්නට වෙර දරමින් සකලසූරිය පැවසිය.

නායක හාමුදුරුවන් සිනාහසුනේය. .....

හාමුදුරුවනේ ... සෙත් පැතිමේ පිංකම නම් එදා හරි ජයට කෙරුණා නේද?.... මෙවර නිහඬතාවය බිඳලනු ලැබූයේ .... එතැන වාඩි වී සිටි අයෙකු විසිනි.

නැතිව .... නැතිව .... බොහොම ඉක්මනටම ඒකෙ ප්‍රතිඵලත් පිංකමේ සිටි අයට ලැබුණනෙ.

හැබැටම .... එහෙමත් වුනාද අපෙ හාමුදුරුවනේ ... සකලසූරිය ඇසුවේ ය.

මහත්තය දන්නෙ නැද්ද.... ඒක එහෙම තමයි. .... ඒ පිංකම. මහත්තයගෙ යෝජනාවක් වුනාට ඒකට මහන්සි වෙලා .... ඒකට මූලිකත්වය ගන්නෙ කවුද?....

අපේ ගමේ උදවිය... විශේෂයෙන් තරුණ පිරිස... අවට පන්සල්වල තරුණ හාමුදුරුවරු. ඒ වගේම ජනමාධ්‍ය වලින් හොඳ ප්‍රසිද්ධියක් ලැබුණා.

ඔව්... හැබැව.... ඒ පිංකමෙන් සති දෙක තුනකට පස්සෙ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් ඒකරාශි වෙලා ඔවුන්ට සිදුවෙලා තියෙන අඩුපාඩු පිළිබඳව පාලකයින්හට දැන්වන්නට විරෝධතාවයක් ක්‍රියාත්මක කළා. ඒ විරෝධතාවය ක්‍රියාත්මක කළ සිසු සිසුවියන් අතර එදා ආරක්ෂක හමුදාවන්ට සෙත් පැතිමේ පිංකමට බොහොම කැපවීමෙන් ක්‍රියාකළ තරුණ උදවියත් - ආරක්ෂකයින් අත පිරිත් නූල් ගැටගැසූ අපේ තරුණ හාමුදුරුවරුත් හිටියා. ආරක්ෂකයින් මොකද කළේ. තමන්ගේ හිමිකම් ලබාගැනීම පිණිස පාලකයින්ගේ අවධානය යොමුකරවා ගන්නට කටයුතු කළ පිරිසට එළව එළවා පහර දුන්නා, ජල ප්‍රහාර එල්ල කළා. කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළා... අනේ ආරක්ෂකයින්හට සෙත් පතල පිරිත් නූල් ගැට ගහපු හාමුදුරුවරුන් ආරක්ෂකයින්ගේ ප්‍රහාරයන් හමුවේ පණ බේරාගන්න දුවපු හැටි....විවරයක් ඇඳගත් තරුණ භික්ෂුවක් පණ බේරගන්න දුවනව දකින එක මොනතරම් වේදනාකාරී දර්ශණයක්ද?.. ඒ ... මොනතරම් කණගාටුදායක ..... අප්‍රසන්න දර්ශණයක් වුණාද කියන්න .... මහත්තය දන්නවාද?

හාමුදුරුවනේ.. ඒ අය කටයුතු කරපු විදිහ වැරදියිනෙ.... අපි.... ඒ අය ගැන නොසළකනවා නොවෙයි නෙ.... හැඟීම් වලට වහල් වෙලා තරුණ කොටස් ඒකරාශි වෙලා... විරෝධතාවයක් දක්වන්න ගියහම මොන විදිහෙ.... අනර්ථකාරී ප්‍රතිඵල උදාවෙයිද දන්නෙ නැහැනෙ.... මේ වගෙ කටයුතු වලින් සාමාන්‍ය ජනතාවට මොනතරම් අවහිර වෙනවද?.... ඒකේ නරක නාමය ඇති වන්නට නොදී.... රටත් ජනතාවත් රැක ගැනීම ආරක්ෂක අංශවල යුතුකම නේ....

සකලසූරිය මහත්තයෝ.... කවුරු.... කවුරුත්.... තම තමන්ගේ යුතුකම් ඉටුකරන එක හොඳයි. .... ඒත්.... පාලකයින් යැයි කියාගන්න උදවිය .... ගන්නා රට විනාශ වන තීරණවලට .... ජනතාව පීඩාවට පත්කරන තීරණවලට, කටයුතු වලට එරෙහිව ඔය එක ආරක්ෂකයෙකු හෝ විරෝධය පළකරල තියෙනවද?... නැහැ.... පාලකයින්ගේ තීරණවලට එරෙහි වන්නට ඔවුන්ට හැකියාවක් නැහැ... ආරක්ෂකයින්ට ක්‍රියාත්මක විය හැක්කේ පාලකයින් දෙන නියෝග අනුව පමණයි. පාලකයින්ගේ නියෝගයන්ට අනුව ඔවුන් ක්‍රියාත්මක වෙනවා... රටේ ජනතාව, ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගිටින කොට ... ඒක පාලකයාගේ පැවැත්මට බාධාවක් වෙනවා... අනතුරක් වෙනවා... ඒ බාධාවන් මැඩගෙන තම පැවැත්ම ආරක්ෂා කරගන්නට ආරක්ෂකයින්ව පරිහරණය කරනවා... පාලකයින්ගේ නියෝගය ලැබුණාම... ආරක්ෂකයින් ක්‍රියාත්මක වෙනවා... ඔවුන් විසින් පහර දෙනු ලබන්නේ තමන් වෙසෙන රටේ ජනතාවට බව ඔවුන්ට අමතක වෙනවා... පහර කන්නන් අතර තම ඤාතීන් අසල් වැසියන් සිටිය හැකි බවත් තේරෙන්නේ නැහැ...සමහරවිට ඒ බව හිතෙනවත් ඇති. ඒත් මොනවා කරන්නද?... ආරක්ෂකයිනුත් ඔවුන්ගේ පැවැත්ම රැකගන්න ඕනෙ නෙ - එනිසාම "පාලකයන්ගේ නියෝගය සාර්ථකව ඉටුකර දීම වැදගත් වන බවයි ඔවුන්ගේ අරමුණ වන්නේ.... ඉතින් මේ වගේ තත්ත්වයක් යටතේ ආරක්ෂකයින් විසින් පාලකයින්ගේ ආරක්ෂාව තහවුරු කරනවා මිස .... රටේ ජනතාවගේ ආරක්ෂාව පිණිස කටයුතු කරනවා කියලා පිළිගන්නේ කොහොමද? පාලකයින් ඔවුන්ගේ පැවැත්ම ආරක්ෂා කරගන්න කටයුතු කරමින් - ඒවා ජනතාවගේ

ආරක්‍ෂාව සඳහා කියමින් එහි බර ජනතාව මත ආරෝපනය කරනවා. කොපමණ කලක් කියල මේ රැවටීම් කරන්නද මහත්තයෝ..... නායක හාමුදුරුවන් විමසුවේ... උන්වහන්සේට ආවේනික වූ ස්වරයෙන් විනා කළබලවූ උද්වේග ස්වරයකින් නොවේ.

පාලකයෙක් නැතුව, මොන දෙයක් වුනත් පාලනය කරන්නේ කොහොමද? ... එහෙම පාලනයක් කරද්දී..... මුලින්ම පාලකයා ආරක්‍ෂා සහිතව සිටිය යුතුයි නේද?... අනෙක් අතට, කොහොම වුනත් ඔබ වහන්සේ එදා සෙත් පැතිමේ පිංකමට වැඩියේ නැහැ නේද?

ඔව්.... අපි... අකැප දෙයට සහභාගි වන්නේ නැහැ. .... මිනිසාය කියන්නේ, ජීවත්වන තවත් ජීවීන් කොටසක්. ඇස්, කන්, නාස, අත පය, මස් ලේ ආදියෙන් සමන්විත මේ සියළු දෙනාම ගතින් එක හා සමානයි. බල තන්හාව නිසා මේ මිනිස් වර්ගයා හට, සිංහල මිනිසාය, දෙමළ මිනිසාය, මරක්කල මිනිසා ය ආදී වශයෙන් නාම පුවරු ගහල වෙන්කරලා... ඒ විතරක් නොවෙයි බෞද්ධයා ය, හින්දු භක්තිකයා ය, ඉස්ලාම් භක්තිකයාය, කතෝලිකයා ය.... කියන නාම පුවරුත් තියෙනවා... තවත් ආකාරයෙන් නොයෙකුත් කුල - ගෝත්‍රවලට බෙදාගෙනත්... නායකයින් ඇති වෙන්න පොර කනවා.... මේ නාම පුවරු වලට මුවාවී, බලතණ්හාව නිසා - මිනිසා විසින් ම ... මිනිසුන්ව මරනවා... එකිනෙකා මරා ගන්නවා... මේවා හරි වැඩද?...

නැහැ හාමුදුරුවනේ... කිසිවෙකු පැවසිය.

බුද්ධිමත් කිසිම කෙනෙක් බල තණ්හාව නිසා එකිනෙකා මරා ගන්නා එක හරියි කියන්නේ නැහැ....

සබ්බ සත්තා - භවන්තු සුඛිතත්තා කියා කියන අපි... එකිනෙකා මරා ගන්නා යුද්ධවලට අනුබල දෙන්නේ කොහොමද?... සියළු සත්ත්වයන් සැපවත් වේවා කියලා පතන අපි පහරදීම් වලට ... හිංසාවට සහය දෙන්නේ කොහොමද? .... නහි වේරේන වේරානි කියා කියන අපි... එකිනෙකා අතර වෛරය වපුරන්නේ කොහොමද?... ඒවා වැරදි ක්‍රියාවල්... අපි අපිට අකැප දේවලට සහභාගි වන්නේ නැහැ.... සිදුවන දේවල් දිහා උපේක්ෂාවෙන් බලා සිටිනවා හැර අපි වෙන මොනවා කරන්නද?... නායක හාමුදුරුවන්ගේ හඬ ස්ථිරය. එහෙත් සන්සුන්ය.

අපෙ හාමුදුරුවො ඔහොම කිව්වට.... අතීතයේ සිටිය අපේ හාමුදුරුවරු ජාතික ආපදා අවස්ථාවලදී... සටන්වලදී සතුරන් ඉදිරියට ගිහින්... උන්වහන්සේලාගේ ජීවිත පවා පුද කරලා තියෙනවා... සකලසූරිය මහතාගේ හඬ ගැඹුරුය... ඔහු වෙතින් දැඩි ආවේගශීලි බවක්ද දිස්විය.

ඔව්... එහෙම වෙලා තියෙනවා... එපමණක් නොවෙයි.... ඇතැම් යුද්ධ අවස්ථාවලදී... හාමුදුරුවරු ... තමන්ගේ චීවරය ගලවා පන්සලේ තබා... යුද්ධයට ගිය බවත් ඉතිහාසයේ තියෙනවා... යුද්ධය නිමාවෙන් පසුව ඔවුන් නැවත සසුන්ගතවූ බවත් ඉතිහාසයේ තියෙනවා.... මහත්තයෝ මේ ටික හොඳින් තේරුම් ගන්න... රට රකිනවා කියන්නේ එකක්.... සසුන්ගත වෙනවා කියන්නේ වෙනත් එකක්... මේ දෙකේ අරමුණු අහසට පොළව වගෙයි... කොහෙත්ම එකිනෙකට සමාන නැහැ... අපි සසුන්ගත වුණේ... සම්මා සම්බුදු පියාණන් විසින් අවබෝධකොට ලෝකයාගේ හිත සුව පිණිස දේශනා කොට වදාළ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගෙන සංසාර දුකින් මිදීමේ

අපේක්ෂාවෙනුයි. අපි අවබෝධ කරගන්නා ධර්මය ... අන් අයහටද අවබෝධකර දීමෙන් ඔවුනටද සසර දුකින් ගැලවී යෑමට උපකාර කිරීමේ පරමාර්ථයෙනුයි... අපි අද කරන්නෙත් ඒ ටිකම තමයි. .... ඔබ කියන ආකාරයේ සම්මුතියේ ගැලෙන්නට අපට වුවමනාවක් නැහැ. ඒ වගේ රට රකින - ජාතිය රකින වුවමනාවක් අපිට ඇතිවුණානම් - අපි කරන්නේ .... ඒ සඳහා උචිතම තැන වන ආරක්ෂක සේවාවට බැඳී ..... නිල ඇඳුමක් ඇඳ ගැනීමයි. එහෙම නැතිව මහාකාරුණික ශාන්ති නායකයානන් අවබෝධකොට දක්වා වදාළ මාර්ගයේ ගමන් කිරීමට බුද්ධ ශ්‍රාවකයෙක් වී - චීවරයක් දරා ගැනීම නොවෙයි... සසර දුකින් මිදීම අරමුණු කරගත් අයෙකු ආරක්ෂක නිල ඇඳුමක් .... ඇඳීම හරියට මඟුල් ගෙදරක යන්න අමුඩයකින් පමණක් සැරසුනා වගේ වැඩක්... එකකට එකක් කොහෙත්ම ගැලපෙන්නේ නැහැ... සැප සම්පත් පෙනි පෙනි ... එවන් සැප සම්පත් පරිහරණය කරණ සමාජයක වසමින්ම ... ලෞකික සම්පත්වල නිරර්ථක භාවය අවබෝධ කරමින්... බුද්ධ ශ්‍රාවකයෙක් ලෙස කටයුතු කිරීම අති දුෂ්කර කටයුත්තක්... ඒ වුනත් සංසාර ගමනේ... ජාතියෙන් ... ජාතිය .... උපදිමින්... මැරෙමින්... යලි යලිත් උපදිමින්... මැරෙමින්... දුක් විඳින්නට සිදු වෙනවාට වඩා ... මේ සංසාර දුකට හේතුව අවබෝධ කරගෙන ඉන් මිදී යෑමට හැකිනම්... ඒ සඳහා විඳින්නට වන දුෂ්කරතාවයන් ඒ තරම් ලොකුවට සළකන්න හොඳ නැහැ... සකලසූරිය මහත්තයෝ...සසුන් ගතවූ බුද්ධ ශ්‍රාවකයෙකු හට ධර්මාවබෝධය සඳහා කාලය ගතකරන්නට සිදුවන නිසා... ඒ අයගේ ජීවන පැවැත්මට අදාල පැත්ත අතපසු වෙනවා. මෙන්න මේ අවස්ථාවේදී උන්වහන්සේලාගේ පිළිසරණට ඉදිරිපත් වන්නේ - පිං කැමති, පරිත්‍යාගශීලි පෙර පින් ඇති

ගිහි ජනතාවයි. ... ඔවුන් භික්ෂූන් වහන්සේලා හට සිවුපසයෙන් සංග්‍රහ කරමින් උන්වහන්සේලාට විමුක්ති සුවය අවබෝධ කරගන්නට උපකාර කරනවා.... ගිහි පිංවතුන්ගේ උපකාරයෙන් තම දිවි පවත්වා ගනිමින් ධර්මාවබෝධය ලැබීම: මාර්ග ඵලවලට පත්වීම බුද්ධ ශ්‍රාවකයාගේ වගකීමයි... එම වගකීම ඉටුකරමින් තමන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරගන්නා ධර්මය - තමන් වහන්සේහට විමුක්තිය උදාකර ගැනීම පිණිස ඇප උපකාර කළා වූ ගිහි පිංවතුන්හටද අවබෝධ කොට දී - ඔවුන්ගේද සසර ගමන කෙටි කර ගැනීමටත් - වත්මන් ජීවිතය සාර්ථකව පවත්වා ගැනීමටත් ..... මහ දැක්වීම් භික්ෂුවකගේ යුතුකමයි... භික්ෂුව හා ගිහියා අතර සම්බන්ධය .... තියෙන්නේ එතැනයි. .... අද දවසේ තත්ත්වය බොහොම දුරට වෙනස් වෙලා... සසුන්ගතව සිටිනා අයෙකු විසින් තම වගකීම ඉටුනොකර ... ගිහි පිංවතුන් විසින් දෙනු ලබන සිවුපසයෙන් සංතර්පනය වෙමින් වෙනත් ක්‍රියාවල නිරතවන්නේ නම්.... ඒක වැරදි ක්‍රියාවක්.... ඒකෙන් ගිහි පිංවතාට වන අහිතකර ඵලයක් නැහැ. ... ඒ පිංවතාගේ දානමය කුසලය එතැන තියෙනවා.... නරක සිදුවන්නේ .... ලැබිය යුතු තත්ත්වයට පත්නොවී ඒවා භුක්ති විඳි අයටයි... ඒවායේ විපාකයන් ඒ අයහටම විඳින්න සිදුවේවි. .... මහත්තයෝ හැමදාම අපිට දුක් දෙන්නේ අපි සොයාගත්ත දේවල්. අපි අල්ල ගත්ත දේවල්, අපි ළංකර ගත්ත දේවල්... එහෙම නැතුව ලෝකයේ තියෙනතාක් දේවල් අපට දුක් ඇති කරන්නේ නැහැ. අපිට දුක් ඇති කරන්නේ අපි ළංකර ගන්නා - දේවලින් පමණයි....

සකලසූරිය මහතා ... කිසිවක් නොදෙඩූ නමුත් .... නායක හාමුදුරුවන් වහන්සේ දෙස ඇසි පිය නොහෙලා බල

සිටියේය. නායක හාමුදුරුවන් ඉදිරියේ වාඩි වී සිටි අන් අයගේ ද මුහුණුවලින් දිස් වූයේ ගැඹුරු අවධානයකට යොමු වූ මනසින් යුතුව ඔවුන් පසුවන බවකි.

අපෙ හාමුදුරුවනේ... ඔබ වහන්සේගේ පැහැදිලි කිරීම හරි අගෙයි... සසුන් ගතවූ භික්ෂුවක තුළ තිබිය යුතු .... සසර විමුක්තිය ලැබීම සඳහා වූ කැපවීමත්... ගිහියන් විසින් උන්වහන්සේලා හට සිවුපසයෙන් සංග්‍රහ කළ යුත්තේ කුමක් නිසාදැයි යන්නත් පැහැදිලියි. ..... වර්තමාන සමාජ ක්‍රමය තුළ .... භෞතික සම්පත් හඹාගෙන යෑමේ ප්‍රවනතාවය වැඩියි. එවන් තත්ත්වයක් තුල ... ගිහියන් වශයෙන් අපි... මේ තත්ත්වයෙන් ගැලවෙන්නට යථාවබෝධයක් ලබන්නේ කොහොමද කියල... තේරුම් කරදෙනවා නම්... යි අසමින් එතෙක් පැවති නිහඬතාවය බිඳලූයේ... නායක හාමුදුරුවන් ඉදිරියේ අසුන්ගෙන සිටි අයෙකි.

වර්තමාන මිනිසාගේ පූර්ණ ආයුෂ ... අවුරුදු එකසිය විස්සක් ලෙස සම්මතයක් තියෙනවා.... නායක හාමුදුරුවෝ නැවත හඬ අවදි කළේය. ... ඒ අවුරුදු එකසිය විස්සක් කොහොම වුනත් අවුරුදු සියයක්වත් ජීවත්වන උදවිය බොහොම දුර්ලභයි. කොහොම වුනත් අවුරුදු සියයක් ජීවත්වන මිනිසෙකු සිටිනවා යැයි සිතමු.... අවුරුද්දකට දවස් තුන්සිය හැට පහක් නම්... අවුරුදු සියයක් ජීවත්වන මිනිහාට ජීවත්වීමට ඇත්තේ දවස් තිස් හය දහස් පන්සියයක් පමණයි. ... දවසකට පැය විසි හතරයි ... ඒ මිනිහා දවසට පැය අටක් නින්දට වැය කළහොත්... ඔහුට නින්ද සඳහා ඔහුගේ ජීවිත කාලයෙන් දවස් දොලොස් දහස් එකසිය හැට හයක් පමණ

වැය වෙනවා... ජීවිතයෙන් ඉතිරි වන්නේ දවස් විසිහතර දහස් තුන්සිය තිස් හතරක් පමණයි. මේ ප්‍රමාණය ලැබෙන්නේ අවුරුදු සියයක් ජීවත් වන්නේ නම් පමණයි... දැන් මෙතන සිටින අපි හැමෝම වයසින් අවුරුදු පනහ ඉක්මවාපු උදවිය... එහෙනම්... අපට තව ජීවත්වන්න ඉතිරි වෙලා තියෙන්නේ දවස් දොළොස් දහස් එකසිය හැට හතක් වැනි ප්‍රමාණයක් පමණයි.... ඔය දින ගණන ලැබෙන්නේත් අපි... අවුරුදු සියයක් ජීවත් වෙනවා නම් පමණයි. කොහොම වුනත් මේ ඉතිරි කෙටි කාල සීමාව අතර කුමණ හෝ අවස්ථාවකදී අපි නියත වශයෙන්ම සම්මුති මරණයට පත් වෙනවා. ඒක වලක්වන්න පුළුවන් ජගතෙක් කොහේවත් නැහැ... තමන් මිය යන බව නොසිතන උදවිය අතින්, බොහොම අසාධාරණයන් සිදු වෙනවා... අකුසල් සිදු වෙනවා.... තමන් කවදා හෝ මියයන බව වටහා ගත් තැනැත්තා... සාධාරණ වෙනවා. මෙලොව හොඳින් ධාර්මිකව ජීවත් වෙනවා.... එලොව ජීවිතය සැපවත් වීම සඳහා කුසල් රැස් කරනව... ඔවුන් සුවපත් වෙනවා.

තමන් මිය යන බව නොසිතන මිනිහා භෞතික සම්පත්වලට තදින්ම ඇලෙනවා. ධනය උපයනවා... දේපළ උපදවනවා. බලයට කෑදර වෙනවා... තමා වෙනුවෙන් ම, තමන් හා බැඳුන අය වෙනුවෙන් ම ... සියළු දේ ඒකරාශි කරගන්නට තරම් කුහක වෙනවා. ඔවුන් තුළ ද්වේශය නිරන්තරයෙන් ම පවතිනවා. ලෝභය පවතිනවා... මුළාව පවතිනවා... අනෙකෙකු හට හිමි දෙය පවා... හිමි තැනැත්තා හට ලබාගන්න ඉඩ දෙන්නේ නැහැ... ඒවාට අවහිරකම් කරනවා... ඒවා තමා සතු කරගන්නට උපාමාරු යොදනවා....

මේ වගේ දේවල් වලට තදින්ම හිත යෙදුනහම ... ඔවුන්ට පිනක් දහමක් කරන්න සිතක් පහළවෙන්නේ නැහැ. පිනට ... දහමට වැය කරන්න කාලයක් ඔවුන්ට නැහැ... එහෙම පිනට දහමට කාලයක් ඇති කරගෙන... ඒ සඳහා යොමු වුනත්... එවැනි දේ සිදුකරන්නේ පිං උපදවා ගැනීමේ හැකියාව ඇති කරන ආකාරයෙන් නොවෙයි... ලෝභය තවත් වැඩි වන ආකාරයෙනුයි... සමහරු සාංඝික දානයක් පිරිනමන්නේ... මතු දිව්‍ය භෝජන ලැබීමේ අපේක්ෂාවෙනුයි.... පන්සලක ආවාස ගෙයක්... බුදු මැදුරක් හදා දෙන්නේ මතු දිව්‍ය මාලිගා ලැබේය යන අපේක්ෂාවෙනුයි. ... මෙවැනි අපේක්ෂාවන් ගෙන් පිරුන සිත් ඇතිව සිදු කරනු ලබන දානයෙහි දී ..... ලෝභය දුරු වීමේ කුසළ චේතනාවන් නොව... ලෝභය වැඩීමේ අකුසල් සිත් ඇතිවීම ... කවර හෝ ආකාරයක සෙතක් යහපතක් ඇති වීමට හේතුවන කරුණක් නොවෙයි... දානය වුවද දිය යුත්තේ.... ලෝභ සිතින් බැහැරව .... නිරාමිස ප්‍රීතියෙන් යුතු සිත්වලින් යුතුවයි. දානමය කුසලය ඇතිවන්නේ එවිටයි. ... කරනු ලබන කවර ක්‍රියාවක් හෝ වේවා.... සිදුකළ යුත්තේ .... තමන් විසින් සිදු කරනු ලබන ක්‍රියාව පිළිබඳව පූර්ව අවබෝධයකින් යුක්තවයි... එවිට ඒවා නිවැරදිව කරගන්න පුළුවන්...

තුන්ලෝකාග්‍රවූ සම්මා සම්බුදු පියාණන් විසින් උත්වහන්සේ අවබෝධ කරගත් ආර්‍ය්‍ය සත්‍ය ධර්මය මුලින් ම දේශණා කර වදාළේ බෞද්ධයින්ට නොවෙයි. ඒ වන විට බෞද්ධයින් සිටියේ නැහැ. ... ප්‍රථමයෙන්ම පස්වග මහනුන් හට ධර්මය දේශනා කළා. ... ඔවුන් බ්‍රාහ්මණයින්... බුදුන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය ශ්‍රවණය කිරීමෙන් අනතුරුව ඔවුන්

බුදුන් වහන්සේ අනුව යෑමට තීරණය කළා. ..... මේ ආකාරයෙන් බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිසක් ඇතිකර ගත්තා. එහෙම ඇතිකරගත් බුද්ධ ශ්‍රාවකයින් හැට නමක් වහන්සේලා ධර්ම ප්‍රචාරය පිණිස විවිධ දිශාවලට පිටත්කර හැරිය වග අපි බෞද්ධ කථා පොත්වලින් දැකලා තියෙනවා. ..... යම් .... යම් අවස්ථාවලදී අසා තිබෙනවා. එහෙමයි... මේ ලෝකෙ බෞද්ධයන් ඇති වුණේ.

බුදුන් වහන්සේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය කැටිකර ගනිමින් ප්‍රථම වරට දේශනා කළ ධර්මය ධම්මචක්කපවත්න සූත්‍රයයි. එහි අන්තර්ගතය වන්නේ චතුරාර්‍ය්‍ය සත්‍යයයි. සියළු සංස්කාරයන් වෙනස් වන බවත්.... වෙනස් නොවන එකම දෙය ද ... වෙනස්වීමම .... බවත් එය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සත්‍යයක් වන බැවින් පරමාර්ථ සත්‍ය වශයෙන් ගැනෙන බවත්... එය ආර්‍ය්‍ය සත්‍යය වශයෙන් ගැනෙන බවත් පැහැදිළියි. ... වෙනස්වන දෙයක ස්ථිර භාවයක් නොමැති බැවින්... එවන් වූ කවර දෙයක් පිළිබඳව හෝ වටිනාකමක් තක්සේරු කළ නොහැකියි. වටිනාකමක් තක්සේරු නොවන තැන අගයක් ඇත්තේ නැහැ. අගය නොමැති දෙය ... රඳවා ගැනීමට හෝ පවත්වා ගැනීමට කිසිවෙකුත් උත්සුක වෙන්නේ නැහැ. එවිට බැඳීම - ඇලීම නැති වෙනවා. ඒ නිසාම එතැන දුක පවතින්නේ නැහැ. ... වෙනස්වීමේ ස්වභාවය අවබෝධ කරගත් බෞද්ධයා... ජයග්‍රහණයෙන් උද්දාමයට පත්වන්නේ නැහැ... ඒ ... එය වෙනස්වන බව දන්නා නිසා... ඒ අය පරාජයේදී කම්පා වෙන්නෙත් නැහැ. ... ඒ එකත් වෙනස්වන බව දන්නා නිසා... බෞද්ධයා යනු ... උපේක්ෂා සහගතව දරා ගැනීමේ ශක්තියක් ඇති කරගත් තැනැත්තා... එවන් හැකියාවක්

වැඩි දියුණු කරගත් ඇත්තා කියන එක අමුතුවෙන් කිව යුතු යැයි .... මම හිතන්නේ නැහැ. ... සංසාර දුකින් මිදෙන්නට නම්... ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරන ලෙසයි බුදු හාමුදුරුවන් අනු දැන වදාළේ. ඉන් බැහැර වෙනත් මාර්ගවල යමින් ... සංසාර දුක කෙළවර කරන්න බැහැ... ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමට පැවිදි වෙන්නම ඕනෙ නැහැ. .....ගිහි ඇත්තන්ටත් ඒ මඟෙහි යා හැකියි. .... එහෙම කළ හැකිනම් සංසාර දුකින් ගැලවී යෑමේ හැකියාව ලැබෙන්න පුළුවන්. යම් දෙයක් සිදුවන ආකාරයට අපි කියනවා ධර්මතාවය කියලා. .... ආයර්‍ය අෂ්ඨාංගික මාර්ගයෙන් පෙන්වා දෙන්නේ සංසාර ගමන ඇතිවීමට හේතු වූ ධර්මතාවයන් හඳුනාගෙන .... දුකට හේතුව වූ සංසාර ගමනින් මිදීම සඳහා උපකාර වන මාර්ගය හෙවත් ධර්මයයි. ... දැන් බලන්න ඔය ඇත්තෝ ඇසි පිය ගහනවා නේද?....

එහෙමයි හාමුදුරුවනේ... කිහිප දෙනෙකුම එකවර පිළිතුරු දුන්නෝය.

ඇසිපිය ගහන්නේ ඔය ඇත්තන් හිතල ද?... එහෙම නැතිනම්... ඒක ඉබේ සිදු වෙනවද?....

මද නිහැඬියාවක් පැවතුණි. යළිත් පෙර ලෙසින්ම කිහිප දෙනෙකුගේ හඬවල් එකවර ඇසුණි. .... අපි හිතුවේ නැතත් ඇසිපිය වදිනවා. ... ඒක ඉබේ සිදුවෙනවා හාමුදුරුවනේ...

දැන් ටිකක් සිහියෙන් හිතන්න. .... ඔය ඇත්තන්... සිතන්නේ නැතිව ඇසිපිය ... වදිනවා නම් .... මම ඇසිපිය ගහනව.... කියලා.... ඔය ඇත්තන් එකිනෙකා කියන එක නිවැරදි කථාවක් ද?

වැරදියි හාමුදුරුවනේ... එහෙම කියන එකත් .... හිතන එකත් වැරදියි.

ඔය ඇත්තන් දැන් එහෙම කිව්වට ... මෙතෙක් දවස් ... ඒ බව තේරුම් ගත්තේ නැහැ නේද?

එහෙමයි හාමුදුරුවනේ...

නොකරන දෙයක් ... කරන දේ හැටියට ඇදහීම මිථ්‍යා දෘෂ්ඨියයි.... වැරදි දැකීමයි. ...... ඉන් මිදුනහම පහළ වන්නෙ මොන දෘෂ්ඨිය ද?....

හාමුදුරුවනේ ... සම්මා දෘෂ්ඨිය .... නිවැරදි දැකීම. ......

බොහොම හරි. .... ඔය ඇත්තෝ ... යමක් දකින්නේ මොකකින්ද? ...

ඇස් දෙකින් අපෙ හාමුදුරුවනේ....

හැබෑද?

එහෙමයි හාමුදුරුවනේ....

එහෙම නම්... ඔය ඇත්තන්ගේ ඇසිපිය ගැහෙන බව දැක ගත්තෙත් ඇස්වලින්මද?

එහි සිටි සියළු දෙනාම එකිනෙකා දෙස බලන්නට විය. ... සකලසූරිය මහතා සිටියේ තුෂ්නිම්භූත වූවෙකු සේය. ... මද නිහැඬියාවකට පසුව කිසිවෙකු කථා කළේය.

හාමුදුරුවනේ .... ඇසිපිය වදින බව දැනුණේ හිතට. .... ඒක ඇස්වලින් දැක්කේ නැහැ.

ඔය ඇත්තන්ටත් එහෙම දැනෙනවද?.... හාමුදුරුවෝ සෙසු අය වෙතින් ද විමසුවේ ය....

එහෙමයි අපෙ හාමුදුරුවනේ... ඔවුන්ගේ පිළිතුර විය.

දැන් ඔය ඇත්තන්ට පැහැදිළියි නේද? ... තමන් දිහා විමසිල්ලේ බැළුවොත්.... තමන් වෙලි සිටින්නේ වැරදි පිළිගැනීම් ගොන්නක බවත්... සිහියෙන් විමසා බලන්නේ නම් ... ඒ වැරදි ... පිළිගැනීම් වලින් මිදී නිවැරදි වන්නට පුළුවන් බවත් .....

එහෙමයි ... අපෙ හාමුදුරුවනේ....

බුදුන් වහන්සේගේ මංගල දේශණය වූ ධම්මචක්කපවත්න සූත්‍රයේ සතර වන ආර්‍ය සත්‍ය වන මාර්ග සත්‍යයට ගැනෙන ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ පළමුවන එක සම්මා දිට්ඨිය ඇති කර ගැනීමයි. අපි පළමු කොට ගෙනම සම්මා දිට්ඨිය ඇතිකර ගැනීමට වෙහෙසිය යුතුයි. කිසිම කෙනෙකු වෙනුවෙන් ..... වෙනත් කිසිම කෙනෙකුට .... ඒ අවබෝධය ලබා දෙන්නට බැහැ. ....ඒ අවබෝධය තමන් විසින්මයි ලබාගත යුත්තේ.... ඒ බව බුදුන් වහන්සේ විසින් දේශනා කළ ....

තුම්මෙහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා
පටිපන්නෝ පමොක්ඛන්ති - ඣායිනො මාර බන්ධනා

කියන එකෙන්ම පැහැදිළි වෙනවා. ... තථාගතයන් වහන්සේ හට වුවත් කළ හැක්කේ මාර්ගය දේශනා කිරීම පමණයි. ... ඔබ .... ඔබ විසින්ම ඒ මාර්ගයේ ගමන් කළ යුතුයි. ... පමාවකින් තොරව ඒ මාර්ගයට පිවිසෙන අයෙක්

වේ නම් හෙතෙම මාරයාගේ බන්ධනයෙන් මිදෙනු ඇත යන එහි තේරුමයි.

ඒ නිසා ඔය ඇත්තො... බාහිර ලෝකය දෙස නොවෙයි... තමන් විසින් තමන් දෙසම සිහියෙන් යුක්තව බලන්න පුරුදු වෙන්න ඕන... එතකොට ... ඔබට වැටහේවි. .... හුස්ම ගන්නවා... දැනේවි... හුස්ම හරිනවා දැනේවි..... ඒ හුස්ම ගන්නේ මමද? ... හුස්ම හරින්නේ මමද ... නැහැ ඒවා ඉබේටම සිද්ධ වෙනවා... හුස්ම ගැනීම කවුරුන් හරි වේවා... තමන්ගේ ඕනෑකමින් සිතා මතා කරන්නක් නම් ... මේ වනවිට ඒ තැනැත්තා මියගිහිං වන්නට පුළුවන්... මොකද .... කායජී බහුලත්වය නිසා හුස්ම ගැනීමට ... අමතක වීමෙන්. ... හුස්ම ගැනීම .... ඉබේම සිද්ධ වෙනවා නම් .... හුස්ම පිටකිරීම .... ඉබේම සිද්ධ වෙනවා නම් .... මම හුස්ම ගන්නවා කීමත් ... මම හුස්ම පිටකරනවා කීමත් වැරදි පිළිගැනීම් ... මිථ්‍යා දෘෂ්ඨීන් බව .... දැන් ඔය ඇත්තන්ට තේරෙනවා ඇති. මෙයාකාරයෙන් තමන් තුළින් තමන් කවුදැයි දකින්න උත්සාහ කරන්න ඕනෙ... මේ ක්‍රියාවලි ... මේ ධර්මතාවයන් හඳුනාගන්න උත්සාහ කරන්න ඕනෙ. ඒකෙ ප්‍රතිඵලය වෙන්නෙ තමන් කවුදැයි යන්න තමන්හට අවබෝධ වීමයි. ... සත්ත්වයෙක් ... පුද්ගලයෙක් හැටියට තමන් මෙතෙක් දැක්කේ වැරදි දෙයක් බව වැටහේවි... එහෙම වෙනකොට භෞතික සම්පත් පිළිබඳ තෘෂ්ණාව, ලෝභ, ද්වේෂ, මෝහ, මද, මාන ... වගේ දේවල් ඔබගෙන් බැහැර වේවි.... ඔබ සුවපත් වේවි.... නායක හාමුදුරුවෝ නිහඬ විය. ..... උන්වහන්සේ වෙතින් දිස්වන්නේ ශාන්ත පෙනුමකි. ... වෙහෙසට පත්වූ බවක් උන්වහන්සේ වෙතින් පිළිඹිබු නොවුණි....

එතැන සිටි සියළු දෙනාම නිහඬ ය. ... එකිනෙකා තම තමන්ගේ සිත්වලට වන් අරමුණුවල ගැලෙමින් සිටින බවක් පෙනුණි.

සකලසූරිය මහතා .... නායක හාමුදුරුවන් වහන්සේ දෙස බැලිය. ... උන්වහන්සේ සිටියේ බිම බලාගෙනය. .... එහි සිටි පිරිස ... දෙස තම ඇස් යොමු කළේය. ඔවුන් කිසිවෙකුගේ අවධානයක් තමාවෙත යොමු වී තිබේදැයි දැන ගැනීම ඔහුගේ අරමුණ විය. .. එහෙත් කිසිවෙකුගේ අවධානයක් තමන් වෙත යොමු වී නොමැති බව ඔහුට වැටහුණි.

ඔහු හිස ඔසවා පන්සල් වත්ත දෙසට නෙත් යොමු කළේය. පන්සල් වත්තෙහි විශාල පිරිසෙකි. මෙවන් පිරිසක් අන් තැනකදී රැස් වී සිටියේ නම් පැවතිය හැකි ඝෝෂාකාරී තත්ත්වය මෙහි නැත. මෙම පිරිස අතර උස් ඇත්තෝද වෙති. මිටි ඇත්තෝ ද වෙති. කළු අයත් වෙති, සුදු අයත් වෙති. තළෙළු අයත් වෙති. පිරිමින්ද වෙති. ගැහැණුන්ද වෙති. තරුණයන් හා තරුනියන් ද වෙති. මහල්ලන් හා මැහැලියන්ද වෙති. ... බිළිඳුන් හා බිළිඳියන් ද වෙති. තැනෙක තෙලින් පිරී ගිය, මනා ලෙස දැල්වෙන තිරයෙන් යුත් පහනකි. තැනක තිරය ඇති මුත් තෙල් සිඳී නිවී ගිය පහනකි. එතැනම තෙල් තිබියදී තිරය දැවී යෑම නිසා නිවී ගිය පහනකි. තෙල් සිඳී යමින් තිබියදී වැඩි ආලෝකයක් නිකුත් කරමින් නිවී යන්නට ආසන්න පහනකි. තෙල් ඇති තිර නැති පහන් ද එහි විය. තිර ඇති තෙල් නැති පහන් මෙන්ම තෙල් හෝ තිර හෝ නොමැති පහන් පමණක් ම එහි නොවූයේද නොවේ. දැල්වෙන හඳුන්කූරුය. නිවී ගිය හඳුන්කූරුය, දැවී

අළුවී ගිය හඳුන්කූරුවල අළුය... එක මිටියට ගෙන එකවර දැල්වූයේ වුවද .... එම මිටියේම මදක් දැල්වී ගිය හඳුන්කූරුද විය. ... නිවී ගිය හඳුන්කූරුද විය.

බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව, වැඳුම් පිදුම් කරන්නවුන්ද එහි වෙති. තම අපේක්‍ෂාවන් ඉටුකර දෙන ලෙස පතන්නවුන්ද එතැන නොවූයේ නොවේ.

සුළඟ හමා යයි. ඉන් සෙලැවෙන දේ බොහෝ ය. ඒවා අතර බෝපත් ද වෙති. ඉදී වියැලී ගොස් නටුවෙන් ගිලිහුණු බෝපත් පන්සල් බිමෙහි පතිත නොවුනේ ද නොවේ. මේ ක්‍ෂණයෙහි ද පන්සල් වත්තේ අසීමිත සිදුවීම් ජාලයකි. බණ මඩුවෙහි සිට පන්සල් වත්ත දෙස බලන සකලසූරිය මහතා හට ද ඒ සිදුවීම් නොපෙනුනාද නොවේ. එහෙත්, කොතැනින් පටන් ගෙන කොතැනක නවතින්නදැයි නිනවුවක් ඔහුට නැත. චිත්ත ඒකාග්‍රතාවයකින් තොරව ඔහු ඒවා දෙස බලා සිටියේ ය. ඒ හැම දෙයම ඔහු දුටුවේය. එහෙත් එහි සිදුවන හේතුඵල ධර්මතාවයන් කිසිවක් ඔහු නොදුටුවේය.

# 26

## මඟියා සහ ගමන

මඟියා යනු ගමනෙහි යෙදෙන්නෙකි. එසේ ගමනක් අරමුණු කරගත් මඟියෙකු බස් නැවතුම් පොළෙහි විය. කොපමණවත් බස් රථ එතැන පසු කරමින් - යලි පිටත්ව ගියේ වුවද, මෙම මඟියා ඒ කිසිදු බස් රියකට ගොඩවූයේ නැත. ඔහු සිදු කළේ බස් රථවල දැක්වෙන ගමනාන්තයන් පිළිබඳව වූ නාම පුවරු බැලීම පමණි.

අවසානයේදී ඔහු බස් රියකට ගොඩ විය. ඒ වනාහි ඔහුගේ අපේක්ෂාව වූ ගමනාන්තයට ළඟා විය හැකි බස් රියක් වූ බැවිනි.

එම බස් රථය සුඛෝපභෝගී එකක් විය. හේ සුව පහසු අයුරින් එහි අසුන් ගත්තේය.

රියැදුරා හා කොන්දොස්තර වරයා ද බස් රියට මඟියෙකු එක්වීම පිළිබඳව සතුටු වූවෝය. මඟියා තමන්ගේ බස් රියට ගොඩවීම පිළිබඳව ඔවුන් දුටුවේ ... මඟියා විසින් ඔවුනට කළ අනුග්‍රහයක් ලෙසය.

බස් රිය සෙමෙන් ඉදිරියට ඇදෙයි. එය තමා අරමුණු කළ ගමනාන්තය වෙත ළඟා වෙනු දුටු මහියා බස් රථයෙන් බැස ගැනිමට සූදානම් විය.

ඔහුගේ දැන්වීම අනුව බස් රථය නැවතුනි. එදින දැඩි සූර්ය තාපයෙන් යුතු උෂ්ණාධික දවසක් විය. බස් රිය තුල තිබෙන සුඛෝපභෝගී භාවය පිළිබඳව හැඟීමක් ඇති නොකළ මහියා බස් රථයෙන් බැස පා ගමනින් තමාගේ අරමුණ කරා යන්නට විය.

බස් නැවතුම් පොළෙහි සිටි වෙනත් මහින් කිහිප දෙනෙකු බස් රථයට ගොඩ විය. බසය ද යළි පිටත් විය.

මහියා තම අරමුණ කරා යද්දි, බස් රථයෙහි රියැදුරා, තමාගේ අරමුණ කරා යමින් සිටියේය. එකම බස් රථයෙහි එකට ගමනේ යෙදුණේ වුවද, ඔවුන් එකිනෙකා සිටියේ එකි නෙකට වෙනස් වූ විවිධ අරමුණු තුලය. හැමදෙනම විසින් සිදුකරනු ලැබුයේ, තමාගේ අරමුණ ඉටුවීමේ අවස්ථාව එළැඹිකළ, අනෙකා අතහැර දැමීම පමණි.

# 27

# සතුට

මිනිසුන් ලෙසින් අරමුණු කාගෙත් එකය
සැම වෙහෙසෙන්නෙ ලැබුමට සැප නැත සැකය
හදවත මඬින්නේ දුක සැප යන දෙකය
සතුටක් ලදොත් එය හා එන්නේ දුකය

පියමන් කරන විට ජීවන ගමන් මගේ
දුක සැප පිළිබඳව සිතුවිලි සිතට නැගේ
කිව හැක මටද ලෝකය මේ විලස අගේ
දුක මල් ගසකි ප්‍රීතිය එහි මලක් වගේ

දුක් මල් ගසෙහි හට ගන්නා මලෙහි පෙති
හැලුනා පරව පෙන්වා දී නිසරු ගති
පස්කම් සුව සොයන මිනිසුන් අතර නිති
මල පර වුනත් දුක් ගස ඒ ලෙසම ඇති

පසුදින උදයෙ තව කැකුලක් පිපෙනු ඇත
ඒ මල වුවද වැඩි කලකට රැඳෙනු නැත
කලඹා තඹන, කුළු ගන්වන සැලෙන ගත
සතුටද මිරිඟුවකි රවටන මිනිස් සිත

සතුටක් විඳි කෙනා යළි එහි - දුක දැරුවා
මේ දෙක එකිනෙකා වෙන් කෙරුමට බැරුවා
කණකොක් කෑ ගසයි එන්නට පෙර මරුවා
දුක පෙරහැරකි සතුටයි එහි කසකරුවා

දුක මල් ගසකි ප්‍රීතිය එහි පෙති විදහල මල වගේය
නිසරු ලොවෙහි අනියත බව වැටහුනි නම් හරි අගේය
සතුට සොයන මිනිසුන්හට කිව යුතු උවමක් නැඟේය
දුක සැප දෙක එක මවකගෙ නිවුන්නු දරුවන් වගේය

# 28

## සතුට.... ඔබ... කොහේද?


වසර ගණනක් පෙරුම් පුරලා ජය ලදිමි ආදරය හමුවේ
කෙදිනවත් නැහැ එහෙම සතුටක් මගේ හදවත පෙරදි ලැබුවේ
දිනෙන් දින එම සතුට වැඩිවෙයි කියාලයි මම මුලදි හිතුවේ
මටත් නොකියා සතුට පැනගොස් දුක පමණි අද අවට දුටුවේ

ගෙයක් හැදුවා සැබෑ සතුටකි, කෙටි කලෙකි එය පැවත තිබුනේ
බිරිඳ කැඳවා පැමිණී පසුවයි, හදවතට සුව සතුට ලැබුනේ
එයින් නොනැවති තවත් ආශා මගේ හදවත තුලට එබුනේ
සතුට සෙව්වෙමි, සතුට ලැබුවෙමි එය නොමැත එක තැනක තිබුනේ

මිනිස් ආශා නැගේ හද තුල මගෙත් ලොව අන් හැමගෙ වාගේ
එවන් ආශා ජය ලබන්නට ගියෙමි මට හැකි තරම් වේගේ
නිමක් නොදුටිමි නිතිපතා එයි සිතෙහි ආශා නමැති ඕගේ
කොතෙක් ජය ගත් නමුදු දැනුනේ අමුතු සතුටක් නැතුව වාගේ

මිරිඟුවක් පසු පසින් දිව යන මුවැත්තෙකු මෙන් සිටි වනේ
දිව ගොසින් හති වැටී වෙහෙසී රැවටිලා ඇති බව පෙනේ
දිවූ තරමට හති වැටී ඇත - අන් අයට සිනහව ගෙනේ
එතැන නැහැ මම පැතුව සතුටක් - තවත් ඈතක ඇත අනේ

ගෙයි කැඩී ගිය තැන් හැදිමයි අන්තිමට මට ලැබුන උරුමේ
බිරිඳ ලෙඩ වී කෙඳිරි ගාමින් සිටි පලදුන්නාද කරුමේ
සැනසුමක් නැත වේදනාවයි සතුට පසුපස පැමිණි උරුමේ
වැටහුනා අනියත බවක් මට බුදුන් වදාහල පරිදි දරුමේ



# 29

## සතුට හමුවිය

සටන් කෙරුවෙමි ජය ලබන්නට, ලැබුනෙ ජයකැයි සිතිමි මුලදී
පසුව වැටහුණි ඇති බවක් මට, එදා කිසියම් තැනක වැරදී
ලැබූ ජයක් රැක ගන්න සිතුවද, වෙහෙස ගෙන තව තවත් උරදී
ජය ලබා නැත මුල්ම සටනින්, එදා සිට මම ඇත්තෙ පැරදී

නැති දෙයක් ගැන සිතට දුක ගෙන එය ලබන්නට දරපු විරිය
ලබාගත් පසු එතැන නැත සැප - වෙන දෙයක් තුල තිබේ මිරිය
මිරිඟු දිය දැක එදෙස දිවෙමින් දුටු දුටුව කිසි දෙයක් නැරිය
ලබා ගැනුමයි - අත්හැරීමයි මිසක එහි නැත වෙනත් කාරිය

අහිමි වන විට තමන් සතු දෑ - හද පෙළයි පැන නගින ද්වේගය
ඇතිකරයි රුදු බවක් සමගින් - රුදුරු වූ මරුවගේ වේගය
නිසරු බව දැක සසර පවතින - ලෝභයන් හා මෝහ ක්ලේශය
බැඳීමෙන් තොර තැනක් වේනම් එවන් තැනකදී සතුට ශේෂය

පසිඳුරන් ගෙන් ලැබෙන සිතුවිලි නිමාවක් නැත නැගේ එකපිට
එසේ වීමට කරුණු කිමදැ'යි සිතා බලලා නොමැති කිසිවිට
සිහිය එළවා බලන මා හට - පෙනේ මා ගොස් ඇත්තෙ කණපිට
සතුට ලබනට අරමුණක් ලෙස 'දුක්' සිතක පිහිටන්නෙ කුමකට

'සතුට' කියමින් වැළඳ ගත්දෙය - තව දුකක් මිස 'සතුට' නොමවිය
නිමක් නොපෙනෙන සිතෙහි ආශා හඹා යැමෙන් 'දුකම' හිමිවිය
'සතුට' ලබනට වෙර දැරිමද - 'දුකට' මුළ බව මට පසක් විය
'දුකට' හේතුව අතැර දැමුවෙමි - එතැනදී මට 'සතුට' හමුවිය

# 30

# ප්‍රඥාව සහ විඳීම

ප්‍රඥාව ආලෝකයකි. ඒ වනාහි තත්ත්වාවබෝධය පිළිබඳව වූ ඥාණයයි. එය ලැබීමේ රිසියෙන්, සිහියෙන් යුතුව මම එතැන සිටියෙමි.

දිනක් මා ඉදිරියෙහි "සතුට" දිස්විය. මගේ සිහිය - මා කෙරෙන් මඳකට බැහැර විය. මම සතුට විඳින්නට යොමු වුනෙමි. එය ආනන්ද ජනක විය. එහෙත් ඒ සුලු මොහොතකට පමණි. ක්‍ෂණයකින් එය නැති විය. නැවත නැවතත් එය ලබන්නට මට සිත් විය. මම සතුට පිටුපසින් හැල්මේ දුවන්නට වූයෙමි.

ප්‍රඥාව නමැති ආලෝකය කෙරෙන් මා බැහැර වත් වත් ම "සතුට" නම් වූ සෙවනැල්ල මා කෙරෙන් තව තවත් ඈතට යන බවක් මට පෙනුනි. එහෙත් මම අත් නොහැරියෙමි. සතුට පිටුපසින් හඹා ගියෙමි.

කෙසේවත් එය අල්වා රඳවා තබා ගැනීමට මම

අපොහොසත් වූයෙමි. මට වේදනාවක් දැනුනි. මම වෙහෙසට පත් වූයෙමි.

මෙවන් වෙහෙසකාරී එක්තරා මොහොතක දී මගේ සිහිය යළිත් මා වෙත එළැඹුණි. "සතුට" මුළාවක් බව මට අවබෝධ විය. මම "සතුට" නම් වූ මුළාව හඹා යෑම අත් හැරියෙමි.

මම ප්‍රඥාවේ ආලෝකය දෙසට හැරුණෙමි. ... එදෙසට යන්නට විමි. එවිට සතුට නම් වූ මුළාවෙහි සෙවනැල්ල මා පසුපසින් හඹා එන බවක් මට දැනුණි.

මම යළිත් ප්‍රඥාවේ ආලෝකය තුළට පැමිණියෙමි. එළැඹි සිහියෙන් යුතුව මම එතැන රැඳුනෙමි. ඒ මොහොතෙහි "සතුට" නම් වූ සෙවනැල්ල මා දෙපා මුල තිබෙනු දුටුවෙමි. ප්‍රඥාව නම් වූ ආලෝකය තුල මා සිටිනතාක් "සතුට" මා දෙපා මූල රැඳී සිටිනු ඇත. එහෙත් එය මට අදාල නොවේ. !'

# 31

# චිත්ත විකාර


ගසෙහි මල් පොහොට්ටුව - මතුවෙලා තිබෙනු දැක
මගේ සිත සතුටකින් - පිරී යයි, පිරී යයි
දිගු කලෙක සිට පැවති - නෙක හැඟුම් සපුරමින්
තව නොබෝ දිනකින්ම - 'මල' පිපෙනු දැකිය හැක

සුවඳ විදහාලමින් - පෙර දිනයෙ පිපුන මල
එක දිනකි පැවතුනේ - පෙති ගිලිහි මැලවිලා
අද දවසෙ පරවෙලා - නටුවෙනුත් ගිලිහිලා
මලක් පිපි බවක් හෝ - එහි නොමැත දැකගන්න

පොහොට්ටුව දුටු දවසෙ - පහළ වුන සතුටු සිත
මා වෙතින් ගිලිහිලා - මැලවිලා යා යුතුද
කුහුල මතුවෙයි සිතෙහි - පෙනෙන විට මේ ලෙසින්
පරවුනේ මල මිසක - පොහොට්ටුව හෙම නොවේ

පොහොට්ටුව නොම වන්න - මලක් බිහිවනු නොවේ
මල පිපෙනු දකින විට - පොහොට්ටුව එහි නොවේ
සැබෑ ලෙස දිස්වුවත් - එය මුළාවක් පමණි
පහළ වුන සිත් පෙලක් - හැර නොමැත අන්කිසිත්

සිදුවීම තුල තිබෙන - සැබෑ තතු පසෙකලා
සම්මුතිය තුලට වී - මුළාවට පත්වෙලා
මුළාවම කරට ගෙන - විමුක්තිය සොයන මුත්
විමුක්තිය පෙනි පෙනී - නොමදකිති බාලයෝ



# 32

## සිතක් හා අඹ ගසක්

දිනක් කොහේදෝ සිට අරමුණකින් තොරව ගමන් ගත් සිතකට කිසිවෙකුගේ අඳෝනාවක් ඇසුනෙන්, මඳකට නැවති වටපිට බැලිය. ඒ අඳෝනාව එන්නේ අඹ ගසකින් බව දුටු සිත, අඹ ගසට සමීප විය. සිතක් පැමිණි බව අඹ ගසට නොපෙනුණි. මන්ද යත්, සිතට රූපකායක් නොමැති බැවිනි. අඹ ගසේ අඳෝනාව සිතට අරමුණ විය.

අනේ දැන් මා කොපමණ තනිවෙලාද? මගේ තරුණ කාලය මට හොඳට මතකයි. මේ වගේ වසන්ත කාලයේ මගේ අතු- පතු පිරිලා මල් -ගෙඩි ආදිය වැහි වැහැලා. කුරුල්ලන් ඇවිත් මගේ අතු ඉති මත වහලා කිචි බිචි ගගා කොච්චර විනෝද වුණාද? මගේ හෙවනේ විවේක ගත්ත අය කොච්චර නම් ඇත්ද? මීමැස්සෝ අඹ මල්වලට පැණි ගන්න ආවේ හරිම සතුටින්, බලාපොරොත්තුවෙන්. මගේ ගෙඩි කන අය මට කොච්චර නම් ප්‍රශංසා කළාද - හොඳ අඹ ගසක් - ගෙඩි හරිම රසයි. බලන්නකෝ හරි සාරෙට වැඩිලා. අතු

ඉති විහිදිලා. කොච්චර නම් ලස්සනද? අපට කොච්චර ප්‍රයෝජනවත්ද?

ඒ වගේ වර්ණනා තිබුණත් මට එච්චර තැකීමක් ඇති වුණේ නැහැ. මට දැනුණේ මොන වගේ දෙයක්ද කියන්න මට දැනෙන්නේ නැහැ. අද ඒ කිසිවක් මා ළඟ නැහැ. තනිකම පාලුව විතරයි තියෙන්නේ. ඇයි දෙයියනේ හැම කෙනෙක්ම ඈත්වෙලා මම තනිවුණේ.

සිතට යමක් කියන්නට සිතුනි.....එහෙත් එය ඇසේදැයි කිව නොහැක. සිත සිතන්නට විය.

ඔබ පසුතැවිලි වීමෙන් පලක් නැහැ. යළි සාරවත් වන්න. ..... අතු ඉති පුරා එල බර වන්න. ඔබගේ එල බර බව දකින විට සියල්ලන් නැවත ඔබ වෙත ඒවි...

අනේ මම කොහොමද එහෙම කරන්නේ.... මම දැන් වයසයි. තරුණ කාලේ ජවය දැන් නැහැ... යි ඇසුණ හඬ වෙත සිත යොමුවිය. ඒ හඬ ආවේ අඹ ගසිනි. සිතට පුදුම සිතුනි. තමන් සිතූ දෙය නොකිවද, එය අඹ ගස දැනගත්තේ කෙසේද යන්න විමතියට හේතුවක් විය. මා නොකිවාට සිතන දේ දැනීමේ හැකියාවක් අඹ ගසට තියෙනවාදැයි සිත විස්මිත විය.

අඹ ගස පිළිබඳව සිතට ඇතිවූයේ අනුකම්පාවකි. සිත කථා කළේ නැත. සිතුවේය.

බයවෙන්න එපා... එදා තිබූ එලය ඔබ ළඟ නැතත් ඔබගෙන් ප්‍රයෝජනයක් ඇති කවුරු හරි එන්න පුළුවන්. එතකොට ඔබ සතුටු වේවිදැයි කියන්න නම් බැහැ. මෙකද

ඔවුන් එන්නේ ඔබේ අතු පතු කඩාගෙන දරට දමන්නයි. ඒ දැනට කාට කාටත් ඔබෙන් ගත හැකි දේ එපමණක් නිසයි.

අනේ.... අනේ.... එපා... මේවා මගේ ආරක්ෂාවට ...... තියෙන ඒවා... මෙතෙක් කල් මා සමගම සිටි ඒවා.... මම අමාරුවෙන් ඇති කරගත් ඒවා..... මිනිසුන් මගේ ශේෂ වී තිබෙන සම්පත් කඩාගෙන ගිහින් ඔවුන්ගේ හුදු අවශ්‍යතාවයන් සපුරා ගන්න පුලුස්සා අලු කරාවි.... යි කියමින් අඹගස කලබල විය.

ඔබගේ සන්තකය ඔබට වටිනවා වුනාට - ඔවුන්ට වටින්නේ නැහැ. ඔවුන්ට අවශ්‍යය ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටුවනු දැකිමටයි. එනිසා ඔබ කොපමණ කලක් කොපමණ ආදරයෙන් රැක බලා ගෙන වැඩි දියුණු කරගෙන තිබුනත් - ඔවුන්ගේ අපේක්ෂාවන් අත්හැර දැමීමට තරම් ඔවුන් සාධාරණ වන්නේ නැහැ. .....ඔබගේ අපේක්ෂාවන් අන් අයගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අලුවී ගියාට කාටවත් ඇති පාඩුව මොකක්ද?

අනේ මං මෙච්චර කලක් මේ හැම දෙයක්ම සතුටයි කියල හිතාගෙන කළේ අන්තිම කාලයේ මෙහෙම දුක් විඳින්නද... යි අඹගස පශ්චාත්තාප විය.

නැහැ... නැහැ... කලබල වෙන්න එපා. ඔබගේ අරටුව ශක්තිමත් බව දැක්ක අය එහෙම... ඔබව තවදුරටත් දුක් විඳින්න තියන්නෙ නැහැ. .... හොඳ අරටුවක් නිසා එයින් වැඩි ප්‍රයෝජනයක් ගන්න පුළුවන් බව තේරුම් ගත් අයෙක් ඔබේ අරටුව ගැනීම සඳහා ඔබව කපා බිම හෙළාවි. කපන කොට නම් ඔබට ටිකක් රිදේවි. ඒත් ටික වේලාවකින් ඔබ

මේ සියල්ලෙන් මිදේවි. ... මොකද ඒ වන විට ඔබ මියගොස් ඇති නිසා. මේකත් මතක තියා ගන්න. ..... මේ හැම දෙයක්ම ඔබට සිදුවුණේ ඔබ ලඟ සිටි, ඔබ ලඟට පැමිණි අයගෙනුයි. ..... ඔබව නුදුටු කාගෙන්වත් ඔබට කරදර වුණේ නැහැයි සිත සිතුවේ සංවේගයකින් යුතුවය.

අනේ මෙපමණ ඵල ප්‍රයෝජන ලබාදුන් මට වතුර ටිකක් - පොහොර ටිකක් ලබාදීලා තව ටික කලක් හෝ යහතින් ඉන්න අවස්ථාව දෙන්න තරම් මගෙන් ඵල ප්‍රයෝජන ගත්ත අය නොඑන්නේ ඇයි? ඒ ආත්මාර්ථකාමීත්වයද? අඹ ගස ඇසීය.

සිත තුල සිනහවක් පැන නැංගේය. ආත්මාර්ථකාමී බව... ඕක තවත් අවස්ථාවාදියකු හට ප්‍රයෝජන ගන්න හැදුන තේරුමක් නැති වචනයක්.

මේවා ගැන සිතිමත් නිශ්ඵල දෙයක් යැයි සිතට සිතුනෙන් - සිත යළිත් තම අරමුණින් තොර ගමනෙහි නිරත වන්නට විය.

# 33

# මට එපා ... එවන් සුව

සත්ත්වයන් උපදින කාම ලෝකයන් අතර මිනිස් ලෝකයද එකකි. එය දුකින් පිරුණු තැනක් බව දැන් අපි දනිමු. එවන් දුකින් පිරුණු ලොවෙහි ජිවත් වන්නවුන් අතුරින් ඇතැමුන් මිය යනු මම දැක ඇත්තෙමි. මියයන මොහොතෙහිදී සමහරුන් හඬති - නන්දොඩවති - මල මූත්‍ර පහ කර ගනිති... නොයෙකුත් විකාරයන් කරති. ඒ තමන් මිය යන අවස්ථාවෙහිදී එතෙක් ගත කළ ජිවිතයෙන් අත් මිදෙන්නට ඇති නොකැමැත්ත නිසාය. ජිවිතය කොපමණ දුක් කම්කටොලු වලින් ගහන වූයේ වුවද - මිය යැමට කවරෙකු හෝ නොකැමැතිය. දුක වුවත් තව දුරටත් ජිවත්වීමට ඔවුන්ගේ කැමැත්තය.

දිව්‍ය ලෝකවල ඇත්තේ සියළු සතුටය. අනේක අප්‍රමාණ සැප සම්පත් එහි ඇති බව අපි අසා ඇත්තෙමු. කොතරම් සැප සම්පත් තිබුයේ වුවද - දිනෙක දිව්‍ය භාවයෙන් චුත වීමට සිදුවන බවක්ද අපි අසා ඇත්තෙමු. දෙවියෙක් ලෙසින්

පහල වූ තැනැත්තෝ දිව්‍ය ලෝකයේ සිට ඇත්තේ නොයෙකුත් සැප සම්පත් ඇසුරු කරමිනි. සුඛය විඳිමිනි. දුක් විඳිමින් සිටින මිනිසා හට තමන් ගේ මරණ අවස්ථාව මහත් දුකක් ම වන්නේ නම්, දිව්‍ය සම්පත් විඳිමින් සිටි දෙවියෙකු එයින් චුත විමට යනවිට කවර නම් ආකරයක දුකක් එතැන ඇති විය හැකිද?

මොන යම් දුකක් දිව්‍ය ලෝකයේ නොතිබුණේ වුවද, "මරණයේ" දුක නම් අත්විඳින්නට ඔවුනට සිදුවනු ඇත. එය මිනිස් ලොව මරණයේ දී අත්විඳින දුකට වඩා අතිමහත් එකක් ම වනු නො අනුමාන ය.

පිංකම් අවසානයේදී - පුණ්‍යානුමෝදනා කරන විට - දෙවි මිනිස් සැප කෙළවර අමා මහ නිවන් සුව අවබෝධ කරත්වා යනුවෙන් ප්‍රාර්ථනා කරනු මම අසා ඇත්තෙමි.

දෙවියෙක් වී මිය යැමට මා තුළ කැමැත්තක් නැත. එහෙයින් මම දිව්‍ය සම්පත් ප්‍රාර්ථනා නොකරමි. දෙවියෙක් වී උපත ලබා යලි මිනිසෙකු ලෙසින් ඉපදී මිනිසෙකු වීමේ අවැසිතාවයක් මට නැත. මම දැන් මිනිසෙකු ලෙස උපත ලබා ඇත්තෙමි. මෙය බුද්ධෝත්පාද සමයකි. බුදුන් දෙසූ දහම තිබෙන කාලයකි. එහෙයින් පිං ඇති හාමුදුරුවනේ, මට මේ ජාතියේදීම - නිවන් අවබෝධකර ගැනීමට මඟ පහදා දහම් දෙසන සේක්වා

අන් මඟක් මට එපා.... මට එපා....

## 34

## අහංකාරය

රන් රිදී ගෙන සැරසී ලා
දුහුල් සළුවෙන් ගත වසා
ලොවෙහි ඇති අති මිහිරි සුවඳින්
ඔබේ මුලු ගත සුවඳවත් කොට

නගන විට පිය අහංකාරෙන්
කවුද ළඳුනේ රැවටුනේ

සිතන්නෙ ද මෙය අලංකාරයි
කියා සුළු මොහොතකට හෝ ඔබ
එසේ සිතුවොත් ඔබේ අදහස
වැරදි බව සිහිපත් කරන්නෙමි

බැලුව විට ලොව සොබා දම දෙස
පෙනෙනු ඇත එය හොඳාකාරව

මුතු තිබේ බෙල්ලෙකුගෙ කුසයේ
රන් රුවන් මිහි තලෙන් මතුවේ
එවන් වස්තුව ලොවට ගෙන දෙන
ඔවුන් ඇත තැන්පත්ව නිසලව

අහංකාරය මෝඩයාගේ
හැඟිමක් බව වටහ ගත යුතු

පොලොව බිහි කළ රන් රුවන් ගෙන
අතේ කන කර පැළඳලා
ලොව මිනිස් කැළ අහංකාරව
උඩඟු ලෙස පා තබා යන විට

මිහිතලය හා සොබා දම් මව
බලනු ඇත උපහාස බැල්මෙන්

# 35


## ජීවිතය

රජෙකු ලෙස ජීවිතය - ගත කළෙමි මම එදා
දූදරුන් නැසියන් - හිතවතුන් පිරිවරා
මසවුලෙන් පිරුණ රස - ආහරයි, ගීතයයි
සිනහ හඬ පිරී ගිය - තැනක් විය මගෙ නිවස

කැප කළෙමි තුරුණු විය - සැම දෙයම රැකගන්න
ධනය, සම්පත, සතුට - තව තවත් රැස්කළෙමි
අද නොමැත ඒ කිසිත් - දරුවො දීගයෙ ගිහින්,
ගේ දිරා පත්වෙලා - මමත් ඇත මහළු වී

බලය නැතිවූ දිනේ - පටන් මා තනිවෙලා
ධනය නැත, මිතුරො නැත - හැම දෙයම හිස් වෙලා
මට සිතෙයි මේ ලෙසින් - තිබුණ සුවයක් නැතේ
මුදු පහසු බවක් නැත - රසය විඳිනට තවත්

දුටුව සිත - විඳපු සිත - ඒ සැනින් නිම වෙලා
මතකයන් ශේෂ වී භව ගමන දිගු වෙලා
එළැඹි සිහියෙන් යුතුව බලන මට පසක් වේ
මුළාවකි - අනියතයි - හරසුන්ය ජීවිතේ



# 36

## සසර ඉම

අත් හැරුණ කෙළෙස්මල - නිසා සිත සන්සුන්ය
හැඳිනගත නොහැක එය - කෙළෙස් බර මිනිසුන්ට
සසර ගති නොම හැඳින - තණ්හාව පොදි බැඳන්
බුද්ධිමත් විළසකින් - දුක් විඳිත් මෝඩයින්

සිහිය වැඩි දියුණු වී - සමාධිය මතුවෙලා
ප්‍රඥාව ඇතිවෙලා - සක්කාය දුරුවෙලා
කෙළෙස්මල සිඳී ගොස් - කාම ගිනි මතු නොවේ
සසර ගමනක් නිමයි - බුදු මඟෙහි අනුහසින්

මතක සිත - තවත් නැත වද දෙන්න පේවෙලා
කය නැතිය - නිදහස්ය - මෝහයෙන් ගැලවිලා
සසර බැම්මෙන් මිදී - සියළු දුක් දුරුවෙලා
සැම දෙයම නිරෝධයි! නිරෝධයි!! නිරෝධයි!!!

## 37

# අපි අසරණ වෙලා නැතේ !

පන්සල් වත්තට පිවිසෙන ගුණදාසගේ රුව - ලැගුම් ගෙය අසල මිදුලෙහි සක්මනෙහි යෙදෙමින් සිටි ලොකු හාමුදුරුවන්ගේ නෙත ගැටුණි. ගුණදාස සාමාන්‍යයෙන් මෙවැනි වේලාවක පන්සලට පැමිණෙන්නෙකු නොවන බැවින් ලොකු හාමුදුරුවන්, තමන් දෙසට පැමිණෙමින් සිටින ගුණදාස දෙස ඕනෑකමින් බලාසිටියේය.

නායක හාමුදුරුවන් අසලට පැමිණි ගුණදාස උන්වහන්සේ හට වැඳ එකත්පස්ව සිට ගත්තේය.

මොකද ගුණදාස මහත්තයට අද උදෑහැනක්කෙ.... පන්සල පැත්තෙ එන්න හිතුනෙ.... ලොකු හාමුදුරුවෝ සිනහවෙන් පිරි මුවින් යුතුව කාරුණික ස්වරයෙන් ඇසුවේය.

ගුණදාස මදක් පැකිළුනේය. .... අනේ අපේ නායක හාමුදුරුවනේ.... මගේ හිතට වද දෙන ගැටළුවක් තියෙනවා.... මට ඒක විසඳාගන්න ඕනෙ... ඒකයි මම මේ උදයේම ඔබ වහන්සේ හමුවන්න ආවෙ... ගුණදාසගේ හඬ බයාදුය.

ගැටළු ඇතිවුනාම හිතට වදයක් තමයි. ඉතින් ඒක වදයක් වෙන්නෙ, ඒකෙම නැවත නැවතත් ගැටෙන කොටනෙ... කමක් නැහැ ගුණදාස මහත්තය කියන්නකො.. මම අහගෙන ඉන්නෙ...

අනේ හාමුදුරුවනේ .... මාව වරදවා තේරුම් ගන්න එපා.... මම මේ අහන්න යන්නෙ මට හිතෙන දෙයයි. ..... ගුණදාස මදක් පැකිළෙමින් පැවසීය.

ගුණදාස මහත්තය මා ළඟට ආවෙ... ගැටළුවක් පිළිබඳව .... විසඳුමක් ලබාගන්න නෙ. ..... ඉතින් මම මොකටද මහත්තය ගැන වැරදි විදිහට හිතන්නෙ. ... මහත්තය බය නැතිව අහන්න. ..... නායක හාමුදුරුවන්ගේ හඬ තවත් කාරුණිකය.

හාමුදුරුවනේ ... අද සමාජය දිහා බැලුවහම .... මගේ හිතට හරිම අවුලක් දැනෙන්නේ. .... අපි බෞද්ධයෝ..... බෞද්ධයෝ කියන්නේ නාමිකවම නොවෙයි. බුදු දහම පිළිබඳව යමක් කමක් දන්නා අය. .... එදා බරණැස් නුවර - ඉසිපතනයේ - මිගදායේ දී බුදු හාමුදුරුවන් වහන්සේ පස්වග මහණුන් හට. දේශනා කළේ උන් වහන්සේ විසින් අවබෝධ කළ ධර්ම ඥානයේ සාරයයි. .... එහි දැක්වුනේ පරමාර්ථ සත්‍යය පිළිබඳ කථාවයි. කිසිදා වෙනස් නොවන එකම දෙය වෙනස්වීමම බව උන්වහන්සේගේ දේශනයේ අන්තර්ගතය වී තිබුණා. ඒක කිසිදා වෙනස් නොවන සත්‍යයක්. ඒ ගැන කිසිම වාදයක් නැහැ. .... වෙනස් වන කිසිම දෙයක ස්ථිරතාවයක් නැහැ. ... ස්ථිරතාවයක් නොමැති කිසිම දෙයක අගයක් .... වටිනාකමක් නැහැ. .... සැබෑ නොවන - නොපවතින .... වෙනස්වන භෞතික

දේවල් කෙරෙහි ඇතිවන ඕනෑකම .... බැඳීම .... ආශාව නිසා දුක ඇති වෙනවා. දුක පවතින්නට හේතු වෙනවා. ... එහෙම නේද අපේ ලොකු හාමුදුරුවනේ. ... ගුණදාස යටහත් පහත් ලෙසින් විමසුවේය.

ගුණදාස මහත්තයට එතැන ගැටළුවක් තියෙන බවක් මහත්තයගෙ කථාවෙන් තේරෙන්නෙ නැහැ'යි ... කීවේ ලොකු හාමුදුරුවන් වහන්සේය.

එහෙමයි අපෙ හාමුදුරුවනේ... එතැන ගැටළුවක් නැහැ. ..... එදා බුදුන් දවසෙ සිටි, බුද්ධ පුත්‍රයන් වහන්සේලා හට, බුද්ධ ධර්මය පිළිබඳව උපාධි තිබුණේ නැහැ. එදා බුදුන් දවස, සුනිත - සෝපාකලා, පටාචාරලා වගේ අය මාර්ග ඵල ලබාගෙන තියෙන්නේ සූත්‍ර පිඨක කට පාඩම් කරලා උපාධි අරගෙන නොවෙයි. ධර්මාවබෝධය තුලිනුයි, සත්‍ය පිළිබඳව යථාවබෝධය තුලිනුයි. බුදු දහම අවබෝධ කළ ඇත්තා - භෞතික සැප සම්පත්වල ඇලෙන්නේ නැහැ. භෞතික සම්පත් පසුපස හඹා යන්නේ නිවැරදිව බුදු දහම අවබෝධ නොකළ අයයි. ධර්මය දැනගත්තත්, ඒ පිළිබඳව අවබෝධයක් නැත්නම්, අන් අයෙකු හට අවබෝධකර දෙන්නේ කොහොමද? ... අනුමාන ඥාණය මදි හාමුදුරුවනේ. අවබෝධ ඥාණයයි ඕනෑ වෙන්නෙ.

සූත්‍ර කටපාඩම් කරල උපාධි නොගත්තත් එදා දවසේ, ධර්මාවබෝධය ලත් ශික්ෂාකාමී භික්ෂු පරපුරක් ඉඳල තියෙනවා. මාර්ගඵල ලාභින් ඉඳල තියෙනවා. බුදු පියාණන් වහන්සේ වෙතින් ධර්ම ඥාණය ලැබූ ශ්‍රාවක පිරිස් ඒ පිළිබඳව අනුමාන ඥාණයෙන් නොවෙයි. අවබෝධ ඥාණයෙන්ම යුක්ත

වූ අය නිසා, උන් වහන්සේලා විසින් අවබෝධ කරගත් ධර්මය සෙසු ලෝකයා හටත් අවබෝධකර දීමේ හැකියාව ලැබී තිබෙනවා. යථාවබෝධය නිසාම එදා ධර්මානුකූලව ජීවත් වූ මිනිසුන් සිටින්නට ඇති. .... ඒත් හාමුදුරුවනේ අද තත්ත්වය එහෙම නොවෙයි. ... බුදුන් වහන්සේ අනුදැන වදාළ දෙයට පිටින් බුද්ධ පුත්‍රයන් ක්‍රියා කරනවා. .... ධම්ම පදයේ ... බාල ... වග්ගයේ එන

අසද්ධාභි ලාභු පනිසා - අසද්ධා නිබ්බාන ගාමිනි
ඒව මේතං අභිඤ්ඤාය - භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභි නන්දෙය්‍ය - විවේකාමනු බ්‍රෑහයෙ

ගාථාවෙන් කියැවෙන අර්ථය තේරුම් ගන්න හරි ඒ අනුව හැඩ ගැහෙන්න හරි මහා සූත්‍ර කට පාඩම් කරන්න ඕන නැහැනෙ. .... ලාභ සත්කාර උපදවන පිළිවෙල එකකි. නිවන කරා ළංවන ක්‍රියා පිළිවෙත අනෙකකි. බුද්ධ ශ්‍රාවක භික්ෂුව මෙය විශේෂයෙන්ම දැන ලාභ සත්කාරවලට සතුටු නොවිය යුතුය. ත්‍රිවිධ විවේකයම වැඩිය යුතුය. ... මේ බුද්ධානුශාසනාවයි. ඒක එහෙම වුනත් මේ අනුශාසනාවට අනුව කී දෙනෙක් අද දවසේ දකින්න පුළුවන්ද? බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළ, තෘෂ්ණාවට හේතුවන ගෞරව තාන්න මාන්න නම්බුනාම හඹාගෙන යෑම බුදු දහම අවබෝධ කළ අයගේ කටයුත්තක් නොවෙයි. ... අද සමහර හාමුදුරුවරුන් තමන්ගේ නමට මුලින් හෝ අගට ඇති උපාධි ගෞරව නාම යොදා නොගෙන හැඳින්වීමක් කළහොත් මහත් උදහසකට පත්වෙනවා. .... අනිත්‍යතාවය මත පිහිටා තෘෂ්ණාවෙන් බැහැරවීමට මඟ පෙන්විය යුතු බුද්ධ පුත්‍රයන් යැයි කියන අය - නම්බුනාම තනතුරුවලට වහල්වෙමින්

තෘෂ්ණා හරිතව කටයුතු කරන්නේ නම් .... ඔවුන් විසින් සෙසු ජනයාහට සසර දුකින් මිදී සදාකාලික සුවය වූ නිවන පසක් කරගන්නට මඟ කියාදෙන්නේ කොහොමද? ... කියා මට හිතෙනවා නායක හාමුදුරුවනේ.... මේ ගැටළුව මට තවත් වද දෙන්නෙ.... මට ඇහුන ගීතයක් නිසා.... "අපි අසරණ වෙලා වගේ හිතට දැනෙනවා. .... බුදු හාමුදුරුවනේ....." එහි එක පදයක් ..... මේ තත්ත්වය හරිම කණගාටුදායකයි නේද?

බුදුන් වහන්සේගේ සසුන තුළ නායකයන් නැහැ. ඒත් අද දවසේ නිකායවලට බෙදිලා - නායකයෝ ඇතිවෙලා - විකාරවල පැටලිලා - ධර්මාවබෝධය ලබා ගෙන සසර විමුක්තිය ලබා ගැනීම වෙනුවට බුද්ධ විවරය දරමින්ම බුදුන් වහන්සේ අනුදැන වදාළ ධර්මයට පටහැනිව කටයුතු කරනවා.

අද දවසේ මිනිසාට බෞද්ධයෙකු වශයෙන් සසර බැඳීමෙන් ගැලවී විමුක්තිය හදාගන්නට මඟ කියා දෙන්නේ කවුද?.... අපට විමුක්තියක් තියෙනවාද? .... එය ලැබිය හැකිදැයි කියන ප්‍රශ්ණය මට වද දෙනවා හාමුදුරුවනේ... ගුණදාස හැඟුම් බරව කීවේය.

ලොකු හාමුදුරුවන් වහන්සේ ගුණදාස දෙස සිනහවෙන් පිරි මුහුණින් යුතුව මද වේලාවක් බලා සිටියේය. ..... මද නිහැඬියාවකට පසුව ලොකු හාමුදුරුවෝ කථා කළේය.

ගුණදාස මහත්තය ඕන කරන දේ ලබාගන්න ඔය හිතන්නෙ අදාල නොවන කොනක් ගැනයි. කලබල වෙන්න ඕන කමක් නැහැ. බුදු හාමුදුරුවන් ජීවත් වුනෙත් අද වගේම සමාජයකයි. ... එදාත් රජවරු හිටියා. ... පියවරුත් මරා බලය ලබන්නට සිතූ අජාසත්තලා හිටියා. ... දෙමව්පියන්ට

අකිකරුව ගෙදර සේවකයා සමග හොර රහසේ පැන ගිය පටාචාරලා සිටියා. ... අම්බපාලිලා වගේ නගර ශෝභනියො හිටියා. චුන්ද සූකරලා වගේ මස් වැද්දන් සිටියා. තමන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබ පසුව විරුද්ධකම් කරපු දේවදත්තලාත් හිටියා. එපමණක් නොවෙයි ශීලයෙහි නොසිටි ශ්‍රමණයින් පවා ඉඳල තියෙනවා. ඒ නිසා සමාජය - එදාය අදය කියල දකින්න උත්සාහ කරන්න ඕන කමක් නැහැ. ගුණදාස මහත්තයට ඕන කරන දේ ලබන්න ගුණදාස මහත්තය උත්සාහ ගන්නකො. එතකොට අවුලක් ඇතිවෙන්නෙ නැහැ. දැන් ටිකකට කලින් ගුණදාස මහත්තය කී දේවලින් මදක් සිතින් බැහැර වන්න.

ගුණදාස මහත්තයෝ.... මට ඇත්තටම කියන්න ගුණදාස කියන්නෙ කවුද කියලා. ගුණදාස මහත්තය, - මහත්තය, දිහාවම බලන්න. මට වෙන මොකුත්ම ඕන නැහැ. ... මට ඕනැ කරන්නෙ සැබැවින්ම ගුණදාස මහත්තය කවරෙක්ද කියල... ගුණදාස මහත්තයගෙන්ම දැනගන්නයි.

ගුණදාස තුෂ්ණීම්භූත විය. ඔහු තුල ඇති වූයේ දැඩි ව්‍යාකූලතාවයෙකි. නායක හාමුදුරුවන්ගේ පැනය ඉදිරියේදී ඔහු අසරණ වූ සේයාවක් දිස්විය. ගුණදාස නිහඬය. එහෙත් නායක හාමුදුරුවන් වහන්සේ කතා කළේය.

බලන්න... ගුණදාස මහත්තය.... දැන් ඉන්නේ පන්සලේ... මගේ ලඟ ... දැන් ගුණදාස මහත්තය කවුද? .... උවසුවෙක්... එහෙම නැත්නම් පන්සලේ දායකයෙක්, ගුණදාස මහත්තයගෙ දෙමව්පියන් ලඟට ගියහම ... ඔබ කවරෙක්ද? ... ඒ අයගේ පුතා ... එහෙම නේද... ගුණදාස කියන නම පමණයි. ... මුළු

ක්‍රියාවම පුතා විදියටයි. දැන් ගුණදාස මහත්තය ... ඔබගේ බිරිඳ ළඟයි කියා සිතන්න.... එවිට ඔබ මා ළඟදී සිටි දායකයා හෝ දෙමව්පියන් අභියස සිටි පුතා හෝ නොවන බව වැටහේවි..... දැන් ඔබ ඔබගේ බිරිඳගේ සැමියා... එහෙම නේද?.. ඔබගේ දරුවන් ඉදිරියේදී ඔබ කවරෙක්ද? .... දරුවන්ගේ පියා.... එතැන සැමියා නැහැ.... පුතා නැහැ. ... දායකයා නැහැ. .... මේ විදියට එකම දවසක් තුල ඔබ විසින් භූමිකාවන් කියක් රඟපානවාද? ඒ ගැන ඔබ හිතුවෙ නැහැනෙ. .... පංච ඉන්ද්‍රියයන්ගෙන් සමන්විත ස්කන්ධයක් ගුණදාස හැටියට පිළිගනිමින්, ඔබ සිතින් ඇතිකරගත් නාම කායයන් හා රූපයන් පරිහරණය කරමින් සිදුකරන රඟපෑම, ඒ ඒ භූමිකාවට අනුව සිදුවන්නක් බව ඔබ නොසිතුවේ ඇයි?

දැන් ඔබ මට කියන්න.... ගුණදාස කවුරුන්ද? .... පුතා කවුරුන්ද?... සැමියා කවුරුන්ද?... දායකා කවුරුන්ද? .... ඔබ ඔබ තුලට එබී බලන්න. එවිට යථාවබෝධය ලැබිය හැකියි. වරද ඔබ තුලට ඔබ එබී නොබැලීමයි. ... තමා කවරෙක්දැයි තේරුම් ගන්නා විට ... ඔබගේ ඔය සියළු ගැටළුවලට පිළිතුරු ලැබේවි. ඒ සඳහා උපදෙස් දීමේ හැකියාව තවමත් අපට තිබෙනවා.... ගුණදාස මහත්තයෝ පිපාසය තිබේ නම් බොන්නට හැකි දිය තිබෙන තැනකට යන්න ඕන. ... එතැනින් වතුර ගෙන පිපාසය නිවා ගන්න. සැනසෙන්න. වතුර බොහෝ සෙයින් තිබුණත් මුහුද දෙස බලාගෙන සුසුම් හෙලීමෙන් වැඩක් නැහැ. ගඟක හෝ පුංචි ලිඳක මිසක්, බොන්නට හැකි වතුර මහ මුහුදේ නැහැ.... නේද ගුණදාස මහත්තයෝ.... ලතැවෙන්න එපා... ඔබ උත්සාහ කරන්න. ..... ඔබට සත්‍ය පෙනේවි. ඔබ ගැටළුවලින් මිදී සුවපත් වේවි....

තමන් කවරෙක්දැයි.. තමන් විසින්ම හඳුනාගෙන නොතිබීම පිළිබඳව ගුණදාස තුළ ඇතිවූයේ කම්පනයකි. තමන් පිළිබඳව හෝ නොදන්න තමන් විසින් අනුන්ගේ අඩුලුහුඩුකම් දැක්වීමට ඉදිරිපත්වීම පිළිබඳව ඔහු තුළ පහල වූයේ ලැජ්ජාවකි. තනතුරු නම්බුනාමයන් උපාධි නැත්තේ වුවද - ධර්මය අවබෝධ කරගත්, අනෙකකු හට ධර්මය අවබෝධ කරදීමේ හැකියාව ඇති බුද්ධ පුත්‍රයන් වහන්සේලා අද දවසේ වුවද වැඩ වෙසෙන බව පසක් කරගත් ගුණදාස, නායක හාමුදුරුවන්ගේ දෙපා මුල පසඟ පිහිටුවමින් වැඳ වැටුණේය.

අප අසරණ වෙලා නැහැ හාමුදුරුවනේ !

# 38

# මම කවරෙක්ද?

මම මගේ ශක්ති ප්‍රමාණයෙන් බොහෝ අය හට උපකාර කොට ඇත්තෙමි. එවන් උපකාර ලැබූ ඇතැමෙකු මා හමුවී කෘතවේදී බව පළ කොට ඇත. මා දෙවියෙකැ'යි කියා ඇත.

එසේ පැවසූ ඇතැමුන් වෙනත් කටයුතුවලටද මා වෙත පැමිණ ඇත. දෙවන වරට පැමිණි කටයුත්ත ඉටුකර දීමට මා හට හැකියාවක් නොමැති වූ කළ මම එය ඉටුකරදී නොමැති අතර ඒවා ඉටුකිරීම අනර්ථකාරීවන බව මා හට හැඟුණ අවස්ථාව ලදී. මම ඉන් බැහැරවී ඇත්තෙමි.

එවන් කටයුතු ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් මා වෙත පැමිණි එහෙත් ඔවුන්ගේ අපේක්ෂාවන් මගෙන් ඉටු නොවුන කල මා වෙතින් බැහැර ගොස් ඉතාමත් පහත් තත්ත්වයේ පුද්ගලයෙකු වශයෙන් මා පිළිබඳව අභිසෂිත විවේචනයක් කර ඇත.

මා දෙවියෙක්වැනියැ'යි කී තැනැත්තාම විසින් මා

අශික්ෂිතයෙකැ'යි හඳුන්වා දී තිබීම හාස්‍යයකි. චරිත සහතික දෙකම දී ඇත්තේ එකම තැනැත්තෙකි.

මේ අනුව මා තුළ ගැටළුවක් පැන නැඟී ඇත්තේය. සැබැවින්ම මා කවරෙක්ද?

සැබැවින්ම මම කවරෙක්දැ'යි තේරුම් ගැනිමට මා හට සිදුවී ඇත. මම කවරෙක්ද?... දෙවියෙක් ද?... නිකමෙක් ද?...

මා දෙවියෙකු ලෙස හැඳින්වූයේ ඔහුගේ අපේක්ෂාවන් මවිසින් ඉටුකරනු ලැබූ බැවිනි. මා නිකමෙකු ලෙස හඳුන්වා ඇත්තේ ඔහුගේ අපේක්ෂාවන් මවිසින් ඉටුකර නොදුන් නිසා විය හැකිය. මේ දෙකම සිදුකරනු ලැබූයේ වචනය උපයෝගි කරගෙනය.

මට සිහිවනුයේ... පොදු යහපත උදෙසා මම කළ කැපවීමය. මම නිරන්තරයෙන්ම පරිත්‍යාගශීලියෙකු වූයෙමි. අන් අයගේ අභිවෘද්ධිය උදෙසා කැපවී ක්‍රියා කිරීම මගේ පරම යුතුකම ලෙසින් මම සැළකුවෙමි. එම උදාර පරමාර්ථයන් යටතේ මගෙන් සිදුවූ සමාජ මෙහෙවර අපමණය.

එහෙත් බොහෝවිට ඒවා පිළිබඳව විවේචනයන් ඇති විය. ඇතැමුන් අගය කළෝය. ඇතැමුන් විසින් නිර්දය අයුරින් විවේචනය කළෝය.

මා තුල පැවති අවංක චේතනාවන් කවරේදැයි මම දැන සිටියෙමි. මා තුළ පැවති අවංක චේතනාවන් පිළිබඳව නිසි අවබෝධයන් අන් අය තුළ නොමැති විය. මා පිළිබඳව ඔවුන් විසින් නිවැරදි අවබෝධයක් ලබා නොමැති බව සිතා ඇතැම් විට මම පසුතැවිලි වූයෙමි... ඒ එදාය.

අද වනවිට මා කවරෙක්දැ'යි... මම අවබෝධ කොටගෙන ඇත්තෙමි. එම හඳුනා ගැනීම අවබෝධ කර ගැනීම උදෙසා දිඟු කලක් මවිසින් ගතකොට තිබුණි..... එවන් වූ දිඟු කලකට පසුව හෝ මට .... මා හඳුනාගන්නට හැකිවීම පිළිබඳ මම සතුටු වෙමි.

හොඳම දෙය, අන් අය විසින් මා කවරෙක්දැ'යි හඳුනා ගැනීම නොව, මා කවරෙක්දැ'යි... මවිසින්ම හඳුනා ගැනීම බව අද මම දනිමි.

තමන් හට තමන්ව හඳුනා ගැනීමට නොහැකිව මංමුලාවූ ජනසමූහයකින් යුතු වූ ලෝකයක ජීවත් වන්නවුන් හට... අන් අයෙකු පිළිබඳව තේරුම් ගැනීමට ඇත්තේ කවර නම් වූ ආකාරයක හැකියාවක්දැ'යි ..... සිතිය යුතු නොවෙයි. එය නිශ්චල ක්‍රියාවක් බව දැන් මට පැහැදිළිය.

මම කවරෙක්දැ'යි මම දනිමි.... අන් අය තුලත් ඔවුන්ම ජීවත් වනු ඇත. ඔවුන් තුළ මට ජීවත් වීමට හැකියාවක් නැතිවාක් මෙන්ම... මා තුල ජීවත්වීමට ඔවුනටද හැකියාවක් නොමැති බව නම් ඇත්තකි.

මා තුළ ඔවුන් ජීවත් කරවීමට, මා තුල තිබුනාවූ මිථ්‍යාවෙන් මම මිදුනෙමි. එම මිථ්‍යාවෙන් මා මිඳුන දිනයේදීම, ඔවුන් තුල ජීවත් වීමට මා තුල පැවති ඕනෑ කම ද දුරු විය.

මම මට රිසි පරිදි ජීවත්වන්නෙමි. ඔවුන්ද, ඔවුන රිසි අයුරින් ජීවත්වනු ඇත. මම කිසිවෙකුගේ ජීවිත වලට බලපෑම් ඇති නොකරන්නෙමි. ඒවායින් මා බැහැරවී ඇත. මෙවන් පරිසරයක් යටතේ වුවද, අදටත් ඇතැමුන්, මා කෙරෙහි

ඔවුනගේ බලපෑම් ඇතිකරනු ලබන අවස්ථාවන් නැතිවා නොවේ. එහෙත්... මම ඒවායින් කලබලයට පත් නොවන්නේ.... ඔවුන් එසේ හැසිරෙනු ලැබෙනුයේ, ඔවුන්ගේ නොදැනුවත්කම නිසා බව මට පසක් වී ඇති බැවිනි.

සෑම අයෙකුහටම තමනට ආවේනික වූ අපමණ සිතිවිලි ඇත්තේ ය. එබැවින් කවරෙකු හෝ තමන්ගේ සිතිවිලි වලින් අන් අයගේ සිතිවිලි අවනත කරවා ගැනීමට වෙරදැරීම නොකළ යුත්තේ ය.

මට පැහැදිලිවන දෙයක් තිබේ. තනතුරු... තාන්න මාන්න... නම්බුනාම... ගරුත්වයන්.....නිගරුකිරීම්... වැනි දේ අන් අයගේ ඕනෑ එපාකම් අනුව, ආරෝපනය කරනු ලබන... නාමික සංඥාවන් මිස... සැබෑ තත්ත්වයන් නොවන බව නම් අමුතුවෙන් කිවයුතු නොවෙයි.

සැබැවින්ම... කිසිවෙකුත් නොවන මම... අන් අය විසින් සිදුකරනු ලබන වාචික සංඥාවන්ගේ හුවා දැක්වීම් අනුව හඳුනා ගැනීමට ලක්වන්නාවූද, විශ්ව ක්‍රියාවලිය තුල ඇතිවන්නාවූ හේතුඵල ධර්මතාවයන් හා වෙළෙමින් එහි පහසින් මතුවන මතකයන් ජාලයක් පමණි.

## 39

## මම ?

ලෝකය යනු මම නොවේ
මම ය යනු ලෝකයත් නොවේ
ළදරු මම තුරුණු වූයෙමි
තුරුණු මම වියපත් වූයෙමි
මා වෙනස් වී ඇත
 මා මිය යන්නේ නම්,
මැරුණු කය දිරාපත් වන්නේ නම්
එය එසේ වන විටදි
"මම" ය යනු මම නොවේ
හුදෙක් සම්මුතිය පමණි එය.

# 40

## ප්‍රසිද්ධිය හා අනතුර

මම තනිව සිටියෙමි. මා හුදකලාව සිටියදී කිසිවෙක් මා පිළිබඳව දැන සිටියේ නැත. මට සතුරන් සිටියේ ද නැත. අනතුරු තිබුණේද නැත.

අහඹුවෙන් එක්තරා අයෙකුගේ දුකට පිහිට වීමට මාහට සිදුවිය. ඔහු පත්වී සිටි දුක්ඛිත තත්ත්වයෙන් මුදවා ගැනිම පිණිස මම හැකි අයුරින් ඔහුට උපකාර කළෙමි. - ඔහු පත්වී සිටි දුක්ඛිත තත්ත්වයෙන් අත් මිදුන පසුව, ඔහු විසින් ඔහුගේ කෘතඥතාවය මා වෙත පිරිනමනු ලැබිය. මා පිළිබඳව ඔහු අන් අය සමඟ ද කථා කරන්නට ඇත.

කල් යත් යත්ම බොහෝ දෙනෙකු, ඔවුනගේ අවැසි තාවයන් ඉටුකර ගැනිමට පිළිසරණ පතමින් මා වෙත පැමිණියෝ ය. මම ද හැකි අයුරින් ඔවුන් හැම දෙනහටම උපකාරී වූයෙමි.

අතීතයේදී මෙන් නොව, පසු කලෙකදී බොහෝ දෙනෙකු

විසින් මා හඳුනා කියා ගත්හ. උපකාර ලබා ගත්හ. ඔවුහුද, මා හට ඔවුන්ගේ කෘතවේදී භාවයන් පළ කළෝය. මා පිළිබඳව ගුණ කථනයෙහි යෙදුණෝය. ඉන් සිදුවූයේ ප්‍රසිද්ධිය මා කරා ළඟා වීමය. මම නොදැනුවත්වම ප්‍රසිද්ධ අයෙකු බවට පත්වීමි.

එහෙත් ප්‍රසිද්ධිය පිළිබඳව සතුට මා තුළ වැඩි කලක් නොපැවතුණි. මා හට ඊර්ෂ්‍යා කරන්න වුන් ද මා වටා ඇති විය. සතුරන් හා සතුරුකම් කරන්නවුන් ද බිහිවිය. එකිනෙක පරයමින් විවිධාකාරයේ අභියෝගයන් මතු විය. මේ හැම දෙයක්ම කුරිරු අයුරින් මා පීඩාවට පත් කළේය. ප්‍රසිද්ධිය සමඟ මා හට අත් විඳින්නට සිදුවී ඇති තත්ත්වයන් පිළිබඳව දිගින් දිගටම සිතන්නට මා හට සිදුවිය.

මා හුදකලාව සිටි අවදියෙහි, මා සතුව පැවති සන්සුන් බවද, මා හට අහිමිවිය. හැම දෙයම අභියෝගාත්මක වී ඇත.

මා අභියෝගයන් සමඟ ගැටෙන විට, මගෙන් උපකාර ලත් අය ගෙන් කිසිවෙකු හෝ මගේ පිහිටට නොවීම මට පුදුමයක් විය. කිසියම් ආකාරයක අනියත බවක් මට දැනිණ.

හැම දෙයකින්ම මිදී බැහැර වීමට මා තුල සිත් පහළ විය. එක්තරා දිනෙක මා හැඳ සිටි ඇඳුමෙන්ම පමණක් යුතුව රහසින්ම මා සිටි තැනින් බැහැර වූයෙමි. මා දන්නා හඳුනන සමාජය වෙතින් ඈතින් ඈතට ගියෙමි. මේ වන විටත් මා නොදැනුවත්වම, බොහෝ දුරක් පැමිණ ඇත. අද මා අවට දැකිය හැක්කේ මහ වනය හා එහි ඇති ස්වභාවික පරිසරය පමණි. එහි මා හැරුණු කොට, අන් මිනිස් පුළුටක්

හෝ දැක ගන්නටද නැත. යළිත් මම හුදකළාවී ඇත්තෙමි. අද මා වටා ප්‍රසිද්ධිය නැත.

ප්‍රසිද්ධිය සමඟ පැමිණි අභියෝග - ඊර්ෂ්‍යාකරුවන් හෝ මරණ තර්ජන නැත.

මම සතුටින් සිටිමි. බොහෝ සතුටින් සිටිමි. නිරාමිස ප්‍රීතිය නිරන්තරයෙන්ම මා තුළ තිබේ. හුදකළාව විසින් යළිත් මා සුවපත් කර ඇත.

දැන් මා තුල ඇත්තේ මගේ සිතුවිල්ල සැබෑකර ගැනිමේ ඕනෑකම පමණි.

ඒ සඳහා අවැසි සිහිය හා විරිය මා තුළ පවතින බවද මම දනිමි.

මම - මගේ විමුක්තිය උදෙසා කරණු ලබන උත්සාහය - ආත්මාර්ථකාමී ක්‍රියාවක් ලෙස, කිසිවෙකු විසින් දැකිය හැකිය. එහෙත් එය වනාහි තවත් එක් පෘතග්ජන පුද්ගලයෙකුගේ නිශ්චල සිතුවිල්ලක් පමණක් ම වනු ඇත.

# 41

## බලාපොරොත්තුවක් කළ හරිය

හේ සතුටින් සිටියේ ය.

දිනක් ඔහු තුළ බලාපොරොත්තුවක් ඇති විය. ඒ ක්ෂණයකින් ඔහු තුල එතෙක් පැවති සතුට අතුරුදහන් විය.

ඔහු තුළ ඇති වූ බලාපොරොත්තුව තුලින් සතුට ලැබීමට හේ වෙහෙසෙන්නට විය. එසේ වූයේ සතුට ලැබිය හැක්කේ බලාපොරොත්තුව සඵල වීමෙන් යැයි යන මිථ්‍යාව ඔහුව වැළඳගත් බැවිනි.

දිගු කලක සිට බලාපොරොත්තුව තුලින් සතුට ලැබීමට ඔහු දැරණ ලද උත්සාහයන් අපමණය. ඉන් ලබන ලද පීඩාවන් ද අසීමිතය. එහෙත් බලාපොරොත්තුව හඹායන ඔහුට ඒ වගක් නොදැනෙයි, නොපෙනෙයි.

දිනක් ඔහු විඳින දුක, දුටු ප්‍රාඥයෙක් ඔහු වෙත පැමිණ.... මෙසේ කීහ.

දරුවා! ඔබ ඔය දරමින් සිටින බලාපොරොත්තුව අත හැර ඉන් බැහැර වන්න. එවිට ඔබ තුළ පෙර පැවති සතුට යළි ඔබ වෙත ළඟාවෙනු ඇත....

මොන පිස්සු කථාවක්ද ඒක, බලාපොරොත්තුවක් නැතිව සතුට ලැබිය හැකි ද?... විකාර කථා.... යි කියමින් හේ තවදුරටත් බලාපොරොත්තු පසු පසින් හඹා යන්නට විය.

මොහොතකින් ඔහු ප්‍රාඥයේ දෘෂ්ඩි මානයෙන් බැහැර වී තිබුණි.

බලාපොරොත්තුවක තරම

කවදා නම් ඔහු සත්‍යය දකින්නද?....

එය දුටු දිනෙක යළි හේ සුවපත් වෙනු ඇත.

# 42

## සතුට සෙවිය යුතු ද?

සතුට සෙවිය යුතු දෙයක් නොවේ. එය නිරන්තරයෙන්ම පවතින්නකි. එම සතුටට හානි සිදුවන්නේ - බලාපොරොත්තුව හා නැගෙන ඕනෑකම නිසාය. බලාපොරොත්තුව හෝ ඕනෑකම ඇති වූ විට සිතෙහි පවතින නිසල ගතියට හානි සිදුවෙයි. එවිට දැනෙනුයේ දුකකි. වේදනාවකි.

එසේ ඇතිවන්නා වූ දුක හෝ වේදනාව දුරු කර ගැනීමේ අභිලාෂයෙන් විවිධ උපක්‍රමයන් පරිහරණය කිරීමට පටන් ගන්නා සත්ත්වයා - තමන් අභිමුවෙහි පවතින අරමුණු ඉලක්ක කරගනිමින් විඳින අපමණ දුක් සම්භාරයක් අවබෝධ කර නොගෙන අරමුණට කේන්ද්‍රගතවූ ලක්‍ෂය දෙස බලමින් ඉන් ජය ලැබීමට වෙර දරයි. අප්‍රමාණ වූ දුක් හැඟුම් පොදියක් මධ්‍යයෙන් එයට මූලික වූ නිමිත්තෙන් මඳකට හෝ බැහැර වූ විට ඇති වන තත්ත්වය හමුවෙහිද විඳිමින් සිටි දුකින් නිදහසක් ලැබුණ බවක් සිතා, සිත සනසා ගනී.

සැබැවින්ම එහි සිදුවූයේ අමුතු සතුටක් ඇති වූවා

නොව, තමා විසින්ම ඇති කර ගත් තෘෂ්ණා චේතනාවන් ගෙන් පීඩාවට පත්වීමත්, එවන් චේතනාවන් ගෙන් මිදෙන අවස්ථාවලදී, පෙර සිටි තත්ත්වයටම යළි පත්වීමෙන් පමණි.

එබැවින්, කෙළෙස්, තෘෂ්ණා, අරමුණු කරගන්නා තැනැත්තෝ දුකට පත්වෙයි. දුක් විඳියි.

කෙළෙස් තෘෂ්ණාවන් ගෙන් බැහැර වෙන තැනැත්තෝ දුකට පත් නොවී සිටින්නේ වෙයි. සතුට සොයන්නට යෑම ම, දුකට මුල වෙයි. එබැවින් සතුට සෙවිය යුත්තක් නොවෙයි. එය නිරන්තරයෙන්ම පවතින්නකි. එය හඳුනා ගෙන විඳිය යුත්තේය. එසේ නොවුන කල සතුට නැති කර ගනුයේ ද තමා විසින්ම බව දත යුත්තේ ය.

සත්ත්වයා පුරුදුව ඇත්තේ තමා වෙත පවතින දෙය වටහා ගෙන එහි ස්වභාවය අවබෝධකර ගැනීමට නොව, තමන් වෙත නෙමැති දෙය සොයා යෑමටය.

නිදසුනක් වශයෙන් දැඩි සීතල පවතින මොහොතක් ගනිමු. එවිට ඇත්තේ සීතල ගතියකි. එය නිරන්තරයෙන්ම පවතින්නක් නොවෙයි. එම සීතල ඇතිවූයේ රාත්‍රියෙහි දී නම්, හිරු උදා වෙනු සමගම එම සීතල දුරුදු වී යනු ඇත. එය ස්වභාවය යි. සත්ත්වයා එය නොසිතයි. සීතල ඇති වූ මොහොතේ සිටම, එය දුරු කර ගැනීමට උණුසුම සොයන්නට වෙහෙසෙයි. එම මොහොතෙහි සීතලය යනු දුකකි. සොයා ගත් උණුසුම සතුටකි. මෙසේ උණුසුම සොයා ගිය සත්ත්වයා දිවා කාලයෙහිදී ඇති වන උණුසුමින්ද පීඩාවට පත් වෙයි. ඉන් කලබලයට පත් වෙයි. ඉන් කලබලයට පත් වන හෙතෙම - රාත්‍රියෙහිදී ප්‍රතික්ෂේප කල "සීතල" සොයමින් වෙහෙසෙන්නට පටන් ගනී.

කුසගිනි ඇතිවූ විට එම පීඩාවෙන් මිදෙන්නට ආහාර ගැනීම ස්වභාවයකි. කුස ගිනි නිවීමට අයෙකු මෙසේ වෙහෙසෙද්දී තවත් අයෙකු කුස ගිනි ඇති නොවීම ආබාධයක් සේ සළකා වෛද්‍ය උපදෙස් ගනිති. ඖෂධ වර්ග භාවිතා කරති.

තත්ත්වාවබෝධයෙන් තොරවූ සත්ත්වයා තුල පවතින මෝහය විසින් ඇති කරනු ලබන දුක් කන්දරාව තුළට වී තව තවත් දුක් විඳිමින් සිටිනුයේ කර්මය නිසාමද?

නැතහොත් අනවබෝධය නිසා ද?

තත්ත්වාවබෝධය ඇත්තා තුල - නිරන්තරයෙන්ම සුව පවතී.

# 43

## අරමුණාම - "දුක" විය

විශ්වය තුළ එකම මොහොතකදී සිදුවනුයේ එකම ක්‍රියාවක් පමණක් නොවෙයි. ඒවා අනන්තය, අප්‍රමාණය. මා හට ගෝචර වන්නේ ඒවා අතුරෙන් එකක් පමණි. මා හට පීඩා කරනුයේ, ම විසින් ලබා ගත් - සොයා ගත් - දැක හඳුනා ගත් උපායා ගත් එම නිමිත්ත හෙවත් අරමුණායි.

මා අල්ලා ගත් නිමිත්ත නොවන්නට මට එවන් පීඩාවක් නොවනු ඇත.

එසේනම් දුකට හේතුවන අරමුණුවල එල්බ නොගෙන සිටීමට මා ක්‍රියාත්මක නොවන්නේ ඇයි?

තවදුරටත් දුකට හේතුවන අරමුණුවල එල්බ ගනිමින් මතු බලාපොරොත්තු මතට වී මා දුක් විඳිය යුතුද?....

# 44

# අඳුර හා ආලෝකය

අවිද්‍යාව අඳුරකි. අවිද්‍යාව නමැති අඳුර නැතිකරලීමට නම් විද්‍යාව නමැති ආලෝකය පහළ විය යුතුය. අබුද්ධෝත්පාද කාලයකදී එවැනි ආලෝකයක් ඇතිවිය නොහැකිය. එහෙයින් එවිට දැඩිව පවතිනු ඇත්තේ අවිද්‍යාවේ ඝන අඳුරය.

බුද්ධොත්පාද කාලයකදී විද්‍යාවේ ආලෝකය උදාවී තිබෙන බැවින්, අඳුරෙන් මිඳී, එම ආලෝකයෙන් ප්‍රයෝජනය ලැබිය යුතුය. එසේ නොවන්නෙහි නම් ඒ වනාහි එවැන්නන්ගේ අහේතුවමය.

ඇස් ඇත්තාහට ආලෝකය දැකිය හැකිය. ඇස් නොමැත්තා හට ආලෝකයෙහි හෝ අඳුරෙහි කිසිදු වෙනසක් නැත්තේය. ඔහුට ඇත්තේ අඳුරම පමණී. ඇස් ඇත්තා හට වුවද, ආලෝකය ඇති විටකදී පවා, සෙවනකට වී ඇස්පියා ගත් විට ශේෂ වන්නේ අඳුර පමණී. ආලෝකය ඇති තැනක දී වුවද ඇස් ඇත්තා තම දෙනෙත් පියාගන්නේ වුවද, මුළු මනින්ම අඳුර නොව එක්තරා ප්‍රමාණයේ ආලෝකයක සේයාවක්

හෝ දක්නේය. එහෙත් තම අභිමතය පරිදි අඳුරු ස්ථානයකට වැද, දෙනෙත් පියාගත් විට දැකිය හැකි ශේෂ ආලෝක ඡේයාව හෝ නොපෙනෙන්නේ ය. ස්වභාවය එයයි.

බුද්ධෝත්පාද කාලයකදී පිවත් වන අප හට, අවිද්‍යාවෙන් මිදී - විද්‍යාව පහල කර ගැනිම පිණිස දහම් ආලෝකය ලැබී තිබියදී, ඉන් නිසි එල නොගෙන, කාම තණ්හා - භව තණ්හා - විභව තණ්හා වැඩි දියුණු කර ගනිමින් අවිද්‍යාවෙහි ගැලීම - ආලෝකය තිබියදී - ඇස් පියා ගෙන අඳුරට පත්වීම වැනි අමනෝඥ ක්‍රියාවකි.

ආලෝකය ඇති විටදී කළ යුතු දෙය නොකර, අඳුරෙහි ගැලෙන්නා මෝඩයෙකි. අඳුරෙහි හෝ ආලෝකයෙහි ගැලීම ඒ ඒ පුද්ගලයා විසින් තම තම නැණ පමණින් ම තෝරාගත යුත්තකි.

අකුසලයෙන් හරිත පුද්ගලයා හට සත්‍ය නොපෙනෙන්නේ ඔහු අවිද්‍යා අඳුරෙහි ගැලී සිටින බැවිනි. ආර්‍ය සත්‍ය වන වෙනස් වීමේ ධර්මතාවය, අනිත්‍ය - දුක්ඛ - අනාත්ම, භාවයන් ඔහුට පෙනෙනුයේ, නිත්‍ය - සුඛ - ආත්ම වශයෙනි. ඔහුට හැඟෙන දැනෙන ආකාරයන් අනුව - විඳීම: අයිතිය - වැනි හැඟීම් ඇතිකර ගනිමින්, කිසිදාක සත්‍ය ලෙසින් සිදුකළ නොහැකි, අයිතියක්, උරුමයක් ඇතිකර ගැනීමේ නිරර්ථක ක්‍රියාවලියක නිරත වෙමින් සසර ගමන දිගුකර ගනී.

කිසිදාක ස්ථිරව නොපවතින, නිරන්තරයෙන්ම වෙනස්වන, ලෝක ස්වභාවය - අනිත්‍ය බව - දුක්ඛ බව - අනාත්ම බව තේරුම් නොගැනීමෙන් පත්වන්නේ දුකටමය.

බුද්ධෝත්පාද කාලය පමණක්ම නොව, බුදුන් ධරමාන කාලයෙහිදී ද, බුදුන් වහන්සේගේ ධර්මය ඇසීමට පිං නැත්තෝ, උන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මයට සවන් දුන්නෝ නොවේ.

එසේ ධර්ම ශ්‍රවණය කළේ වුවද, මඟඵල ලැබුණේ ඒ සඳහා පිං ඇත්තන්ට පමණක් විය. ඒ සඳහා පාරමිතා හෙවත් පෙර පුහුණුව ලැබූ ඇත්තන්ට පමණකි.

බුදුන් වහන්සේගේ ඇසුරෙහි සිටියේ වුවද කිසිදු මඟඵලක් නොලත් අය පිළිබඳව - කොපමණවත් නිදර්ශණ බෞද්ධ සාහිත්‍යයෙහි දැක ගන්නට ඇත. ඒ ඔවුනට පෙර පිරූ පුහුණුව හෙවත් පාරමිතාවන් නොමැති වූ බැවිනි.

එසේම තථාගතයන් වහන්සේ අළුයම් කාලයෙහිදී, මහා කාරුණා සමාපත්තියට සමවැද එම දා උන්වහන්සේ ගෙන් පිහිට ලැබියහැක්කේ කවරෙකු හටදැ'යි දිවැසින් දැක වදාරා - එවන් ඇත්තෙකු වී නම් - එහි වැඩම කර, එම තැනැත්තා හට සසර දුකින් මිදීමට උපකාර කළ ආකාරයද බෞද්ධ සාහිත්‍ය තුලින් දැක ගන්නට හැකිය.

මේ හැම දෙයකින්ම පැවසුයේ කුමක්ද?

සංසාර දුක්ඛය නම් වූ ඝන අඳුරින් මිදීම සඳහා පිහිට විය හැකි විද්‍යාවේ ආලෝකය පහල කරමින් - මහා පහන් වැටක් සේ - අහසෙහි සිටින සූයෙෂීකු සේ තථාගත සම්මා සම්බුදු රදුන් සිටියදී වුවද, පෙර පුරුද්ද (පිරූ පෙරුම් දම්) නොමැතියන් හට අවිද්‍යා අන්ධකාරයෙන් මිදී - සංසාර ගමන දුරුකර ගැනීමට හැකියාවක් නොමැති වූ බවක් නොවේද?

තුම්හේහි කිච්චං - ආතප්පං
අක්ඛාතාරො - තථාගතා
පටිපන්නා - පමොක්ඛන්ති
ඣායිනො මාර බන්ධනා

යනුවෙන් බුදුන් වහන්සේගේ දේශනාව වී ඇත්තේ ඒ නිසාම විය හැකිය.

බුදුන් වහන්සේ විසින් මඟ කියා දෙනු ඇත. ඔබ, ඔබ විසින්ම ඒ මඟෙහි ගමන් කළ යුතුය. අප්‍රමාදව ඒ මඟට පිළිපන්නා වූ තැනැත්තා - මරයාගේ බන්ධනයෙන් මිදෙන්නාහු ය. යනු පෙර සඳහන් ගාථාවේ අර්ථයයි.

සදහම් රැස් ආලෝක ධාරාවන් අද දවසේ ද, අපමණවත් තිබියදී, තණ්හාවෙහි ගැටෙමින්, අවිද්‍යා අන්ධකාරයෙහි තව දුරටත් අප ගැලී සිටිය යුතුද?

මා සිතන්නේ නැත... යි කියා ය. බුදු දහමෙහි ආලෝකයෙන් ... අනිත්‍ය ... දුක්ඛ... අනාත්ම ස්වභාවයන් දැකිය හැකිය. කාම තණ්හා.. භව තණ්හා... විභව තණ්හා ඇතිවන අයුරු දැකිය හැකිය. ඒවා දුරු කිරීමට ක්‍රියාකළ හැකිය. ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කළ හැකිය. ඒ ඔස්සේ සසර දුකින් මිදී සදාකාලික සුවයට පත්විය හැකිය.

දෙනෙත් නැත්තා හට කිසිදාක ආලෝකය දැකිය නොහැකිය. ඇතැම් විට එවැනි අයෙකු හට අලෝකය දැකීමේ අවස්ථාවක් උදා වුවහොත්, ඔවුනට එයින් වඩාත් පුළුල් ප්‍රයෝජනයක් ලබන්නට හැකිය.

තත්ත්වය එසේ තිබියදී - දෙනෙත් ඇති, ආලෝකය

දැකිය හැකි ඇත්තන්ද, ආලෝකයෙහි ප්‍රයෝජනය නොගෙන අවිද්‍යාවෙහි ගැලෙමින් දෙනෙත් පියා ගන්නේ නම්, ඒ වනාහි ඔවුන්ගේම "පව" මිස අන් කවරක්ද?

අද දවසේ, අපට බහුලව දක්නට ඇත්තේ ද ආලෝකය මාධ්‍යයේ සිටියදී පවා, දෙනෙත් පියාගෙන අඳුරෙහි සිටින්නන් ය.



## 45

# හිතවත් - අහිතවත්

කෙනෙකු තුළ පහළ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔහු හෝ ඇය විසින් සියළු වෙර වීරිය යොදනු ඇත. තම අරමුණ ඉටු වෙනු දැකීම පිණිස කවර වුව නොපනත් කමක් සිදු කරන්නට හේ පසුබට නොවන්නේය.

තම අරමුණට අනුකූලතාවයක් දක්වන්නාවූ සියළු දෙන ඔහුගේ හෝ ඇයගේ හිතවතුන් ය.

එම අරමුනට ප්‍රතිවිරුද්ධ අදහස් දක්වන්නා වූ හෝ විරුද්ධ වන්නා වූ සියළු දෙනම ඔහුගේ හෝ ඇයගේ සතුරෙකු ලෙස සැළකීම ද සිදුවෙයි.

අයෙකුගේ අභිමතය හමුවෙහි ද හිතවත් කම්, අහිතවත් කම් මෙවන් අයුරින් සැකසෙනු දැකිය හැකිය.

# 46

## සම්මුතිය හා රංගනය

මම නමින් අශෝක වෙමි. එය මා බිළිඳු අවස්ථාවෙහිදී මගේ මව් පියන් විසින් මා හට තබන ලද "නමයි" අද වන විට මම වැඩිහිටියෙකු වී සේවයෙන්ද විශ්‍රාමිකය. එහෙත් නමින් තවමත් මම අශෝක වෙමි. කාලය ගෙවී ගොස් ඇත. කය වෙනස් වී ඇත. මා හට ලැබුන සම්මුති නම පමණක් තවමත් එසේම පවතින්නේ වෙයි.

කවුරුන් හෝ වේවා අශෝක යැයි අමතනු ඇසුණ විට මගේ ප්‍රතිචාරය දක්වා ඇත්තෙමි. අද ද ප්‍රතිචාර දක්වන්නෙමි.

මගේ දරුවන් "තාත්තා" යැයි අමතන විට මම දරුවන් ඉදිරියේදී තාත්තා ලෙසින් ප්‍රතිචාර දක්වන්නට ක්‍රියා කරන බව මට දැන් පැහැදිළිය. එතැන අශෝක නැත. ඇමතුම තාත්තාය. දරුවන්ගේ එම ඇමතුමට අනුව මම තාත්තාගේ භූමිකාවට ප්‍රවේශ වී ඇත. එවිට එතැන ඇත්තේ තාත්තා ලෙසින් සිදු කරන රංගනයයි.

මගේ බිරිඳ ඉදිරියේදී - මම සැමියා වෙමි. මා ඉදිරිපිටදී ඇය මගේ බිරිඳය. මගේ දෙමව්පියන් වැඩිහිටියන් ඉදිරියේදී මම ඔවුන්ගේ දරුවා වෙමි. මිතුරන් ඉදිරියේ මිතුරාය. සතුරන් ඉදිරියේ සතුරාය. - අයෙකුගේ අභිමතයට අනුකූලව කටයුතු කරන මා ඔහු ඉදිරියේ හොඳ මිනිසෙක්ය. ඔහුගේම අභිමතයට අනනුකූලව කටයුතු කරන විට ඔහු ඉදිරියේ දී මා නරක මිනිසෙකි. රියැදුරු අසුනෙහි වාඩි වූ විට මා රියදුරාය. ගුරුවරුන් ඉදිරියේ දී සිසුවාය. සිසුන් ඉදිරියේදී ගුරුවරයා ය - දානය දෙන විට දායකයා ය. ඉල්ලා සිටින විට යාචකයා ය. - මත්පැන් බිගත් කල, බේබද්දාය - ශීල සමාදන් වූ කළ උපාසකයා ය.

මෙකී නොකී අනන්ත අප්‍රමාණ සම්මුති ඇමතුම් ඉදිරියේ එවන් ඇමතුම් හා නාමයන් හමුවේද, ඒවාට අනුව ක්‍රියාත්මක වන ස්වභාවයක් මිස මා තුළ අන් කිසිවක් නොමැති බවක් මට වැටහෙයි.

අන් අයගේ ඇමතුම් අනුව රඟපෑමේ නිරතවන මා සැබැවින්ම කවරෙක්ද?

සම්මුතියක් පමණක්ම නොවේද? මෙපමණ කලක් මා සිදුකොට ඇත්තේ කුමක්ද?...

අන් අයගේ ඇමතුම් අනුව රඟපෑමක යෙදීමක් පමණක්ම නොවේද? .... ඒවා එසේ නොවන්නේ යැයි කියන්නේ නම් සැබැවින්ම "මම" යනු කවරෙක්ද?

මෙම පැනයට ඔබ විසින් දෙනු ලබන පිළිතුර කුමක් වුවද, එය පිළිගැනීමේ සූදානමක් මා තුළ නැත. ඒ [illegible]නිසාද,

යත්, ඔබ පිළිබඳව ඔබ ම නොදන්නා බැවින්, මා පිළිබඳව නිවැරදි පිළිතුරු ලබාදීමේ හැකියාවක් ඔබ සතුව නොමැති බව මා දන්නා බැවිනි.

මා තුලින් මම, කවරෙක්දැයි මම දැක්කෙමි. - දැනුදු දකින්නෙමි. හෙටක් උදා වුවහොත් අද දවසේ ශේෂ වී ඇති දැක්ම එතැනදී ද දැකිය හැකිවනු ඇත.

එහෙත් ඒ දවස තුළ දී කවුරුන්ගේ හෝ ඕනෑ කම මත බිහිවන රංගන ශිල්පියාව නම් දැකිය හැකි නොවන්නේය.

# 47

# වචනය හා අරුත

භාෂිතය සඳහා උපකාර කරගන්නා දේවලට වචන යැයි කියති.

වචනය පිළිබඳව යථාවබෝධය නොමැතිකම හේතුවෙන්, නිවැරදි අයුරින් සංඥාව නිරූපණය වන ආකාරයෙන් ඒවා පාවිච්චි නොකිරීම නිසා, විවිධාකාරයේ විනාශකාරී තත්ත්වයන් උද්ගතවූ අවස්ථාවන්ද අනන්තය.

වචනය නම් වූ ශබ්දය ඔස්සේ ලැබෙනුයේ සංඥාවකි. හෙවත් සංස්කාරයකි. වචනය කිසිදා දැකිය නොහැකිය. එය ග්‍රහණය වනුයේ ශ්‍රවණය කිරීම නම් වූ ක්‍රියාවලිය අනුවය. ශ්‍රවණය කිරීමේ හැකියාව නැත්තේ නම්, කවර ආකාරයක වචන කියැවුණේ වුවද එතැන දී සිදුවන ප්‍රතික්‍රියාවක් නොවන්නේය. වචනය යනු සංඥාවක් බැව් මින් පෙරදීද සඳහන් කළෙමි. වචනය හඳුනාගන්නා ලබනුයේ විඥාණය හෙවත් මතකය විසිනි. වත්මන් භාවිතය අනුව නම් සිත විසිනි. වචනය හඳුනාගනු ලබන්නේ විඥාණය හෙවත් මතකය

විසින් යැයි කීමේදී කුකුසක් ඇතිවිය හැකිය. එහෙත් එසේ විය යුතු නොවෙයි. යම් මොහොතකදී ඇසෙන වචනය හා එහි ගැබ්වූ අරුත පිළිබඳව පූර්ව දැනුමක් අවබෝධයක් අපට නොතිබුණේ නම් ... එය තවත් ශබ්ද ජාලයක් මිස අරුතක් දැනිය හැකි නොවන්නේය. ඇසුණු හඬ හා එහි සංඥාව පිළිබඳව පූර්වයෙන් ලබා ඇති අවබෝධය - දැනුම හෙවත් මතකය විසින් හඳුනාගෙන ඉදිරිපත්වීම හේතුවෙන් වචනයේ අරුත තේරුම් ගන්නා සේ සැලකීමට අප පුරුදු වී ඇත.

යම් අයෙකු කිසියම් භාෂාවක් හදාරන්නේ යැයි කියැවෙන ක්‍රියාවලි මේ සඳහා ඇති හොඳම නිදසුනකි. එකී භාෂාව ඉගෙන ගත් තැනැත්තා හට කිසිවෙකු විසින් එම භාෂාවෙන් දෙනු ලබන සංඥාව ඔහුගේ විඥානය හෙවත් මතකය විසින් හඳුනා ගෙන ඒ අනුව ප්‍රතික්‍රියා දක්වන්නේය. තමන් නොදන්නා භාෂාවකින් කිසිවෙකු විසින් බැන වැදුනේද?.... බැනුම් ඇසීමට ලක්වන්නා ගෙන් ප්‍රතික්‍රියාවක් නොලැබෙන්නේ එබැවිනි.

එක් භාෂාවකදී යහපත් වචනයක් වන සංඥාව - අන් භාෂාවකදී අයහපත් ලෙස දැනෙන කිසිවක් සංඥාකරනු විය හැකිය. මේ තත්ත්වයන් උදාවනුයේ ඒ ඒ භාවිතයන් හා සංඥාවන් පරිහරණය කරන්නවුන්ගේ සම්මුතීන් අනුවය. ඇතැම් අවස්ථා වලදී වචන වල උච්චාරණයන් අනුවද - ඒවායින් දැන වෙන සංඥාවන්ගේ විවිධත්වයක් ඇති වන බවක් ද දැකිය හැකිය. කෙසේ වුවද, විඥාණය හෙවත් මතකය විසින් ග්‍රහණය කරගනු ලැබ, ඉන් නිකුත්වන සංඥාවකට අනුව සිදුවන ප්‍රතික්‍රියාවන් මිස, වචන නම් වූ අරුත් හඟවන පදය කිසිදු අරුතක් නොමැති මිථ්‍යාවකි.

එවන් හර සුං තත්ත්වයක් යටතේ විවිධ වචනවලට අර්ථයන් ඇති සේ ගනිමින්, මුළාවෙහි වැටී, ඒවායේ ගැලී දුක් විඳීම හෝ කෝප හරිතවීම කොතරම් ප්‍රඥාවන්තදැයි සිතා බැලීම නොවටින්නේ ද නොවේ.

අපි නිදසුනක් වශයෙන් "නානවා" නම් වූ වචනය ගෙන බලමු. එම වචනය ඇසුන ක්ෂණයකින්ම විඥානය හෙවත් මනකය විසින් හඳුනා ගෙන සිත තුළ මැවෙන රූපය එකකි. එහෙත් "නානවා" කියා වචනය නිර්වචනය කිරීම එතරම් පහසුනොවේ.


"නානවා" - යනුවෙන් ලැබෙන සංඥාව - ක්‍රියාවන් ගණනාවකගේ එකතුවක්, සංස්කරණය වීමෙන් නිමැවුන එක් සංඥාවක් පමණකි. "නානවා" වචනය අනුව එය දැකීමට හෝ ක්‍රියාත්මක වීමට -ජලය තිබිය යුතුය. නෑමට අදාල අයෙකු සිටිය යුතුය. ඔහුට නෑමේ සිත පහල වී තිබිය යුතුය. ඒ සිතට අනුව අත පරිහරණය කරමින් කිසිවක් අල්ලාගත යුතුය. එය පිහිට කර ගනිමින් වතුර ගෙන හිස මතට හෙළිය යුතුය. දිස්වෙන මෙවන් කරුණු හැරුණුවිට - ස්නායු නහර ඇට සන්ධි, සම් මස් මාංශ පේශින්ගේ ආදී තවත් බොහොමයකගේ ක්‍රියාවලින් රාශියක් නානවා නම් වූ ක්‍රියාවට එක්විය යුත්තේය.

එහෙත් "නානවා" යැයි වචනය ඇසෙන විට - එම සංඥාවට අනුව සිත තුල තමන් පෙර පුරුදු පුහුණු කර ඇති ආකාරයෙන් රූපයක් දිස්වන්නේය. මෙය නෑමට පමණක් නොව සෑම සියළු දෙය කෙරෙහිම පවත්නේ එසේමය.

වචනය යනු මිනිසා විසින්, මිනිසාගේ අවශ්‍යයතාවයන්

අනුව අර්ථ ගන්වන්නට පරිහරණය කරන්නට හුරු පුරුදු කරගෙන ඇති නිත්‍යාර්ථයක් නොමැති එහෙත් විවිධාකාර ප්‍රතික්‍රියාවන් උද්ගත කරවිය හැකි ශක්තියකි. මෙවන් වචන හමුවෙහි මිනිසුන් නිරන්තරයෙන්ම පත්වන්නේ මුළාවටය.

වචනය යනු නාම ධර්මයක් පමණි. එයින් ඇතිවන්නා වූ සිත තුලින් දිස්වන රූප පරම්පරාවක් මගින් එම ධර්මයන් අර්ථ ගන්වනු ලබන්නේය. ඉන් බැහැර කිසිවක් එතැන නැත්තේය.



# 48

## බුද්ධිය හා ප්‍රඥාව

වත්මන් ලෝකයෙහි බුද්ධිමතුන් බොහෝ සිටිති. ඔවුහු විවිධ විෂයයන් පිළිබඳව අපරිමිත දැනුමින් පරිපූර්ණව සිටිති. ඔවුහු බුද්ධිමතුන් වශයෙන් සමාජ සම්මානයනට ද පාත්‍ර වී සිටින්නාහ.

ඇතැමුන් සතුව ඔවුන්ගේම පුස්තකාලයක් ඇත. ලෝකයෙහි දුර්ලභ පත පොත ද ඒවායෙහි තැන්පත් කර තිබෙනු දැකිය හැකිය.

ඔවුහු භෞතික සම්පත් සොයමින් නිරන්තරයෙන්ම වෙහෙසෙන්නාහු, අධ්‍යාත්මික වශයෙන් ලැබ දියුණුවෙන හීනය. එහෙයින් නිරන්තරයෙන් ම ඔවුන් අනන්ත වූ අපේක්ෂාවන් කර ගසා ගෙන අවිවේකීව යන්ත්‍රානුසාරීව ජීවිත ගත කරන්නෝ ය.

තම තමන් ලැබූ දැන උගත්කම් ලොවට ප්‍රදර්ශනය කිරීම පිණිස, ලැබූ සහතික පත්, සම්මානයන් හුවා දක්වමින්,

ඒවා පිළිබඳව මහත් වූ අභිමානයෙන් යුතුව කථා කරති. සතුටු බවක් පෙන්වති. එහෙත් භෞතිකව ලැබූ සම්පත් බොහොමයක් ඇති ඔවුන් තුල සැනසුම ඇති බවක් නම් නොපෙනෙයි.

ඔවුහු බුද්ධිය ඇතත් ප්‍රඥාව නොමැති කම නිසාවෙන් අසහනකාරී ජීවිත ගත කරති. බුද්ධිය පත පොත හා ගුරුන් ඇසුරින් ලැබිය හැක්කේ වුවද ප්‍රඥාව එසේ ලැබිය නොහැකිය. එය නිරන්තරයෙන්ම පුරුදු පුහුනු කරන ලදුව ඇතිවන්නාවූ අධ්‍යාත්මික ශක්තියකි. ප්‍රඥාව ඇත්තා හට, භෞතික සැප සම්පතින් ඔබ්බට වූ සත්‍ය ජීවන දර්ශනය දැකිය හැකිය. ඒ අනුව දිවි මඟ සකසා ගෙන සැනසිය හැකිය. ඔවුන් තුල සැනසීම තිබේ.

බුද්ධිය සමගම ප්‍රඥාවද දියුණු කරන්න වුන් වත්මන් සමාජයෙහි ද නැත්තේ නොවේ. සැබැවින්ම ඔවුන් වාසනා වන්තයින් ය.

වත්මන් සමාජීය ක්‍රියාකාරකම් දකින මට මෙසේ සිතෙයි

දුටුව සිත - විඳපු සිත - ඒ සැනින් නිම වෙලා
මතක යන් ශේෂ වී - භව ගමන දිගු වෙලා
සසර ගති නොම හැඳින - තණ්හාව පොඳි බැඳන්
බුද්ධිමත් විලසකින් - දුක් විඳිති මෝඩයන්

# 49

## ඊයේ අද සහ හෙට

අද දවස මා වෙත එළැඹ ඇත. ඊයේ දවස ගෙවී ගොසිනි. අද දවසෙහි මා තුළ ශේෂව ඇත්තේ, ඊයේ දවස පිළිබඳව මතකයන් පමණි. ඊයේ දවස තුලදී ද. අනන්ත අප්‍රමාණ සිදුවීම් ජාලයක් සිදුවන්නට ඇත. ඒවායින්ද මා තුළ මතකයෙහි ශේෂව ඇත්තේ, හොඳයැ'යි සිතුන දේය, විඳිය යුතුයැයි සිතුන දේය, බැහැර කළ යුතු යැ'යි සිතුන දේ ය.

ආශ්වාදය ලැබිය යුතු යැයි හැඟුණ කාම තණ්හාවය, පවත්වා ගත යුතුයැයි හැඟුණ - හෙටද පවතියැ'යි හැඟුණ හෙට දවසේ ද පවත්වාගත යුතු ලෙසින් හැඟුන, අනාගතයේදී ද පවති යැයි හැඟුණ භව තණ්හාවය.

නොරිස්සුම් දෙන, ද්වේශය මුසු වූ අත්හල යුතුය - ඉවත්විය යුතුය හෙට දවසේ නොවිය යුතුය. අනාගතයෙහිදී නොවන්නේ යැයි හැඟුණ විභව තණ්හාවය.

ඊයේ දවසින් ශේෂ කර ගත් බලාපොරොත්තු, අපේක්ෂාවන් ගෙන්, උදාවූ අද දවස පිරී ඇත. අද දවස තුළ මවිසින් පරිහරණය කරන්නට සූදානම් වනුයේ, ඊයේ දවසින් ශේෂ වූ හෝ ඇති කර ගත් අපේක්ෂාවනට අනුරූප වූ ක්‍රියාවලියක් ය.

අද දවස උදාවත්ම, ඊයේ දවස නිමා විය. ඊයේ දවසින් ශේෂ කරගත්, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා අද දවසට ද ඉදිරිපත් වී ඇත. ඊයේ දවස ගෙවී ගිය නමුදු "තණ්හා" වෙහි අංගයන් අද දවස තුළද වැඩෙමින් තිබෙනු දැකිය හැකි විය.

ඊයේ දවස කෙසේ පැමිණයේ දැයි මම නොදනිමි. කොහේ සිට පැමිණියේදැ'යි මම නොදනිමි. ඊයේ දවස පවත්වාගත නොහැකිවූ බව පමණක් මම අද දන්නෙමි. එය නැතිවී ගොස් ඇති බව දන්නෙමි. එය කොහේ ගියාදැයි මම නොදන්නෙමි. එ දවස යළි ලබා ගත නොහැකි බව ද මම දන්නෙමි.

ඊයේ දවස තුලදී, නොදන්නා කම නිසා මම වරද සහගත ලෙස හැසිරී ඇත්තෙමි. මූළාවට පත්වී ඇත්තෙමි.

නොපවතින දේවලට වටිනාකමක් දිය නොහැකිය. ඒ බැව් නොතේරුම් කම නිසා - නොපවතිනා දෙයට වටිනාකම් දී ඇත්තෙමි. නොදන්නා කම නිසාම නොපවතින දේ - පවතින සත්‍ය දේවල් හැටියට ගනිමින්, ඒවායෙහි බැඳෙමින්, කාම, භව, විභව තණ්හාවන් හි ගැලී සිට ඇත්තෙමි.

ඊයේ දවස අනිත්‍ය විය. එය තුල දී තණ්හාව ඇතිකර

ගැනීම හේතුවෙන් අද දවසට දුක ශේෂ විය. ඒ දවස පිළිබඳ යළි යළිත් සිතමින් පසුවීමද නිෂ්ඵලය.

ඇතිවූ රූපයක් ද නැත. නැතිවූ දෙයක් ද නැත. ශේෂය වී ඇත්තේ මතකය පමණකි.

ඇති වූයේත් නොවන - ඇති නොවූයේත් නොවන මායාකාරී වූ මතක ජාලයක් තුළ වෙළෙමින් - නොපවතින්නාවූ දේ - පවතින්නාවූ දේ ලෙසින් අරමුණු ගැනීම හෝ පවත්වා ගැනීමට වෙර දැරීම තුලින්, අද දවසෙහිදී බැහැර වූයෙහි නම්, මා තුළ ශේෂ වීමට හැකි වනුයේ කුමක්ද? හෙට දවසක් සඳහා අපේක්ෂාවක් ශේෂ නොවන කළ පවතිනුයේ කුමක්ද?... එසේ කළහැකිද,'යි අයෙකු විමසිය හැකිය. කළ හැකිය, කළ යුතුය. එසේ නොකරන්නෙහි නම්, තව දුරටත් මිරිඟුවක් පසුපස හඹා යමින් මං මුළාවෙහිම ගැලී සිටිය යුතුය.

හෙට දවස මට කිසිදාක දැක ගත නොහැකිය. ඒ මක් නිසාද යත් හෙට දවස මට හමුවන විට එය "අද" දවස බවට පත්වී ඇති බැවිනි. එදිනට වුවද, තවත් අපමණවත් හෙට දවස් පිළිබඳව සංඥාවන් පහළ විය හැකිය. ඒ කවර හෙටක් වුවද - හමු වූ අවස්ථාවෙහිදී අප හට හඳුන්වන්නට සිදුවනුයේ අද දවස ලෙසින් ය.

එළැඹ ඇති අද දවස ම විසින් නිවැරදිව දැකිය යුතුව ඇත. නිවැරදිව පරිහරණය කළ යුතුව ඇත. එවිට නිරතුරුවම මා හට සතුටින් සිටිය හැකිවනු ඇත.

හෙට දවස උදාවනුයේ අද දවසෙහි ශේෂයක්ද සමගිනි. අද දවසෙහි මම නිවැරදිව ක්‍රියා කළ බැවින් ද - හෙට

දවස උදාවන විට මා හට ශේෂව පවතිනුයේ - අද දවසෙහි නිවැරදි ව සිදු කළ ක්‍රියාවන්ගේ ශේෂය බැවින් ද, හෙට දවස උදාවන විට, එය මට පීඩාකාරී එකක් නොවනු ඇත. එබැවින් උදාවී ඇති අද දවස නිවැරදිව පරිහරණය කිරීම අතිශයින්ම ඵලදායක වනු නොඅනුමානය.



# 50

## නිමිත්ත - විඥාණය හා සිහිය

විඥාණය නම් වූ මතකයේ දිය කඳ මත බැහැරින් වැටෙන නිමිති හෙවත් අරමුණු නම් වූ දිය බිඳු හේතුවෙන් සසල වන විඥාණ දිය කඳ මතකය නම් වූ රැලි නංවන්නේය. ඒ අනුව දිය මත ඇති වන කැළඹීමේ තරම දිස්වන්නේ ය.

කැළඹීම සිදු නොවන්නට නම් ජලය නොතිබිය යුතුය. නැතහොත් අරමුණු නම් වූ ජල බිඳු එහි පතිත නොවිය යුතුය. ජලය ඇතොත් කවර මොහොතකදී හෝ කැළඹීම ඇති විය හැකිය. ජල බිඳු පතිත වන්නේ නම්, ජලය එක් රැස්වීම නතර කළ හැක්කේ ද නොවන්නේය. මෙම ක්‍රියාවලියන් පවතින තාක් ජලය එක් රැස්වීම හා කැළඹීමද පවතින්නේම ය.

පවතින ජල ප්‍රමාණය හා වැටෙන අරමුණු නම් වූ ජල බිඳු අනුව කැළඹීමේ ස්වභාවයද නිරතුරුවම වෙනස් වන්නේය. එසේ කැළඹුන ජලය යලි තැන්පත් වීමට ඉඩ හැරීම මිස, සිදුවී ඇති කැළඹීම නතර කරන්නට අන් මඟක් නැත.

කැළඹුන ජලය තැන්පත් කිරීමට දරණ බාහිර උත්සාහයෙන් සිදු වනුයේ එය තව තවත් කැළඹීමට පත්වීම පමණි.

මෙම විඥාණමය තත්ත්වය සංස්කාර වශයෙන්ද හඳුන්වනු ලැබෙයි.

විඥාණය නම් වූ ජලාශය ඇතිවූයේ නිමිති (අරමුණු) නම් වූ දියබිඳු එක්වීමෙනි. කැළැඹීමට හේතු පහල වූයේ ජලය ඒකරාශි ගත වීමෙනි. කැළඹීම නැති කිරීමට නම් ජලය හිස් කළ යුතුය. එයද එක්වරම සිදුකර ගැනීමට නොහැක්කෙහි නම් කළ යුත්තේ තව දුරටත් නිමිති (අරමුණු) නම් වූ ජලබිඳු, විඥාණය නම් වූ ජලකඳට වැටීම, සිහිය නම් වූ ආවරණය යොදාගෙන වළකාලීමය.

එසේ බිඳුවෙන් බිඳුව වැටීම වැලකෙන විට ඒකරාශි වීම වලකින්නේය. එලෙසින්ම ඒකරාශි වී තිබූ ජලකඳ ක්‍රමයෙන් ක්‍ෂය වීමට වන්නේය. ජලය ක්‍ෂය වත්ම, කැළඹිලි ස්වභාවයද හීන වන්නේය. විඥාණය නම් වූ මතක ජලකඳ හීනවත්ම - මතකයන් නම් වූ, ජල තරංගයන් නැඟීමද හීන වන්නේ ය.

"සිහිය" නම් වූ ආවරණයේ ශක්තිය අනුව ම නිමිති (අරමුණු) නම් වූ දියබිඳු වැටීම හා විඥාණය නම් වූ ජලාශයේ පැවැත්මේ කාලය තීරණය වනු ඇත.

බුදුන් වහන්සේ විසින් දේශණාකොට ඇති පරිදි -

අනු පුබ්බේන මේධාවී - ථොක ථොක ඛණෙ ඛණෙ

කම්මාරෝ රාජ තසෙසව - නාධමේ මල මත්තිනො.

ටිකින් ටික - ක්‍රම ක්‍රමයෙන් - එය ක්‍රියාවට නැංවිය යුත්තේය. එවිට එහි ප්‍රතිඵලය උදාවනු ඇත්තේ ය. ක්‍රියාවට එළැඹීමෙන් මිස ප්‍රාර්ථනා වෙන්ම පමණක් කිසිදා මෙහි ප්‍රතිඵලය අත්දැකිය නොහැක්කේ ය.



# 51

# නිමිත්ත, සිත සහ මතකය

නිමිත්ත ඇතිවූ ක්ෂණයකින් සිත පහළ වෙයි. එහි කිසිදු හැඩතලයක් නොමැතිව එය නැතිව යන නමුදු, ක්ෂණයකින් එහි නාභිගත වන මතකය (විඥාණය) විසින්, තමන් විසින් පෙර ලැබූ දැනුමට සාපේක්ෂිත අයුරින් අරමුණට අදාල සිතුවිලි දාමයක් පවත්වා ගෙන යන්නට ක්‍රියාත්මක වෙයි. අප විසින් සිත යැයි දකිනු ලබනුයේ මෙම ක්‍රියාවලියයි. මොහොතක් මොහොතක් පාසා, අරමුණු ගනිමින් ඇතිවන සිත් නැතිවී ගියද, විඥාණ ගත හෙවත් පූර්ව දැනීම් - අත්දැකීම් නම් මතකය විසින් සිතිවිලි වශයෙන් එම නිමිත්තට අදාල තත්ත්වයන් යලි යලිත් ඉදිරියට පවත්වාගෙන යනු ලබත්.

මෙසේ පහළ වන සිතිවිලි හෙවත් සිත්වල නිශ්චිත හැඩතල නැත. ඒ ඒ අවස්ථාවනට අනුව ඇතිවන හැඩතල කිසිදු නිශ්චිත භාවයකින් තොරව පවතින්නට හෝ නැතිවන්නට හැකිය.

සිතිවිලි අතර ගොනුවන පුද්ගලයා, නිරන්තරයෙන්ම තමාට වාසිදායක ලෙස පෙනෙන, හැඟෙන සිතිවිලිවල ගැලෙමින් ඒවායින් ආශ්වාදයක් ලබයි. ඒවා අතර ගැටුම්කාරී සිතිවිලද ඇති නොවන්නේ නොවෙයි.

නිශ්චිත හැඩතලය කින් තොරව ඇතිවන සිතිවිලි වල නිමාව, තම ආශ්වාදය නමැති ආලෝකය හමුවෙහිදී දීප්තිමත්ව පවත්වා ගන්නට වෙර දරණු ලබන්නේ වුවද, කිසි කලෙක එය, - එවන් අයුරකින් පවත්වා ගන්නට හැකි නොවන්නේ - නැවතත් අනපේක්ෂිතව පහළ වන්නාවූ වෙනත් සිතිවිලි දහරාවකට මැදිවී එහි ආශ්වාදය සොයන්නට පුද්ගලයා පෙළැඹෙන බැවිනි.

සිත විවිධාකාරය, විචිත්‍රය, විමසිලිමත්ය, කුතුහලයෙන් අනූනය. එබැවින් නිරන්තරයෙන් ම නොනවතින සෙවීමේ ක්‍රියාවලියක පවතින්නෙකි. මෙය වනාහි සිත නොව වර්තමානයේ දී නිමිත්ත වශයෙන් පහලවන්නා වූ සිත් - ආක්‍රමණය කරමින් පැන නගින්නා වූ අතිත මතකයන් බව නම් සැබැවකි.

# 52

## අරමුණු - සිත - සහ ජලය

මහා සාගරයෙහි ජලය තිබෙයි. ඒ වනාහි සුළු ප්‍රමාණයකින් නොව අති විශාල ප්‍රමාණයෙනි. එහි පර තෙරක් දැකිය නොහැකිය. එහි පවතින අප්‍රමාණ ජලකඳ මෙන් එහි ඇති බිහිසුණු බවද ගුප්ත බවද විශාලය. විටෙක තැන්පත් ගතියක් දක්වන සාගරය, තවත් විටෙක දරුණු රළපහරින් යුතුව බිය ජනක තත්ත්වයක් උදාකරනු ලබයි. කෙසේ වුවද සාගරයෙහි නිරන්තරයෙන්ම ඇත්තේ කැළඹිලි ස්වභාවයකි.

වැවෙහි ඇත්තේ ද ජලයයි. එහෙත් සාගරයෙහි තරම්, අනන්තවූ ජල ප්‍රමාණයක් එහි නැත. වැවෙහි ඉමක්, සීමාවක් ද දැකිය හැකිය. සාගරයෙහි පවතින ප්‍රචණ්ඩ බව හෝ එවන් කැළඹිලිකාර බවක් වැවෙහි නැත. එහි පවතිනුයේ සාගරයට වඩා අතිශයින්ම අඩු කැළඹිලි තත්ත්වයක් පමණි.

පොකුණක ද ඇත්තේ ජලයයි. එහි ජලය සාගරයෙහි තරම් නැත. - වැවෙහි තරම් ද නැත. සාගරයෙහි ඇති කැළඹිලි ස්වභාවය හෝ වැවෙහි දී දැකගත හැකි කැළඹිලි

ස්වභාවය පොකුණෙහි නැත. ඒ වනාහි එහි පවතින සීමිත ජල ප්‍රමාණය හේතුකොට ගෙනය.

බේසමක හෝ කෝප්පයක ජලය තිබිය හැක. එහි ඇත්තේද - සාගරය - වැව - පොකුණ තුල තිබුණාක් වැනි ජලයයි. මේවායේ කැළඹිලි ස්වභාවයන් එකිනෙකට වෙනස්ය. හේතුව ජල පරිමාණයේ අඩු වැඩි ස්වභාවයයි.

කවරෙකුගේ හෝ සිතට අසීමිත අයුරින් අරමුණු ඒකරාශි වන්නේ නම්, එතැන ඇත්තේ ව්‍යාකූල හෝ කැළඹීමට පත් වූ චිත්ත ස්වභාවයකි. නිරන්තරයෙන්ම, එකිනෙකා පරයමින් පැන නගින විවිධ අරමුණු හේතුවෙන් සිතෙහි තැන්පත් බව නැත්තටම නැති වී යන්නෙහි ය.

කැළඹිලි ස්වභාවය පීඩා ජනකය. තැන්පත් බව සුවදායකය. සතුටක් සුවයක් විඳීමට නම් ඇතිකර ගත යුත්තේ තැන්පත් බවක් ය. සිතෙහි තැන්පත් බවක් ඇතිකර ගන්නට නම් පළමුවෙන් ම කළ යුත්තේ, අනේකා කාරවූ අරමුණු වලින් බැහැර වී සිත නිදහස් කර ගැනීමය. එය කරගත හැකිවන්නෙහි නම් සැනසීම නිරන්තරයෙන් එම සිතෙහි පවත්වාගත හැකිවනු ඇත.

අද දවසේ සමාජ ගත පුද්ගලයින් ගේ සිත් කළබලකාරීය. සරළ පැවතුම් ඔවුන් කෙරෙන් දුරුවී ඇත. නිරන්තරයෙන්ම ලෝක ගම්මාන සංකල්පයන් හමුවෙහි, අනේකා කාර අරමුණුවලින් ගැවසීගත්, වත්මන් මිනිසුන්ගේ සිත් සංකීර්ණ වී ඇත. - ඔවුහු ඇතින් - ඈතින් - පෙනෙන භෞතික සම්පත් නම් වූ මිරිඟුව කෙරෙහි විශ්වාසයෙන් යුතුව හඹා යමින් සිටිති. එකිනෙකා පරයා තම අරමුණු ජය ගැනීම

උදෙසා සටන් වැද සිටිති. - වෛරය වපුරවති. - ලේ හලති, වංචා දූෂණ සිදු කරයි. අගතිගාමී වෙති. සත්‍යාවබෝධ කිරීමේ හැකියාව තිබියදී - එය පසෙක ලා - මිථ්‍යාව පසුපසම හඹා යති. මිථ්‍යාවම සත්‍ය ලෙසින් දකිති. ඒ පිළිබඳව උදම් අනති. තමන් දුවමින් සිටින්නේ දුකින් - දුකට බව ඔවුහු නොදකිති.

අහෝ! කාම - භව - විභව තණ්හාවන්ගේ තරම....

# 53

## සිත හා සමාධිය

කෙලෙස් මලයෙන් පිරුණ - සංඛාර ගලනවා
සමවතට සමවැදුන - 'සතිය' එය දකිනවා
සතුට සොම්නස පිරී - මතුපිටින් දකින මුත්
අනියතයි - බියකරුයි - සෝ තැවුල් ගෙනෙනවා

මිඳියා යුතුව ඇත - කෙලෙසකින් හෝ සැණින
වැදගන්න ඉඩ නොදී - සංඛාර දුක් ගොන්න
මහදොරින් ඇතුළු වන - සුළඟ ඇත ගෙය තුළම
දොර කවුළු විවර විට - සුළඟ ඉන් බැහැර වේ.

ලැබුණි නිවැරදි දැකුම - 'සතිය' ගති පිහිටුවා
හැර දැම්මි සිත තුලින් - තණ්හාවෙ දොරකවුළු
එන සියළු සංඛාර - රැඳී ගත නොහැකි වී
බැහැරවී යන විටදී - සිත සමාධිය තුලය

## 54

# ජීවිතය

ජීවිතය යනු ප්‍රශ්ණ ජාලයකි. ජීවත්වීම යනු එවන් ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීමට වෙර දැරීමකි.

මෙහිදී බලාපොරොත්තුව නම් වූ වරපට මගින් අපව ප්‍රශ්ණ සමග තදින් බැඳ තබයි.

'බලාපොරොත්තුව' නම් වූ වරපටින් මිදී යා හැකිනම් - ප්‍රශ්ණවලින් ප්‍රශ්ණයක් ඇති විය හැකිද?